වැවිලි කර්මාන්ත ඇමති සහ දාණ්ඩුක්‍රම ව්‍යවස්ථා කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) (i) දූරණියගල, යටිවල, බී. ඇම්. පොඩිමහත්මයා මහතා විසින් 1959 ජූලි මස 10 වැනි දින මාගල, යටිවල ගමේ පිහිටා ඇති තැන්නපිටි යෝන නැමැති අක්කර 5 ක ඉඩමක් නැවත රබර් වගා කිරීම සඳහා ඉල්ලුම් කළ බවත්; (ii) මොහුට මෙකී අවසරය ලබා දී ඇත්තේ ආර්. ඇම්. මොහොට්ටි අප්පුහාමි මහතාගේ නියෝජිතයෙකු වශයෙන් පෙනී සිටීම නිසා බවත්; (iii) එහෙත් මොහු විසින් අවසර ලබා ගත් ඉඩමෙහි රබර් වගා නොකොට වෙනත් අයෙක් ඉඩමක රබර් වවා දෙපාර්තමේන්තුවත් නිලධාරීනුත් නොමග යවා නෙවරක්ම මුදල් ලබා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

ගත් බව හෙලිවී ඇති බවත් එතුමා දන්නවාද? (ආ) පරීක්ෂණයේදී බී. ඇම්. පොඩි මහත්මයා මහතා වංචාවක් කර ඇති බව හෙලිවී ඇති හෙයින් එකී මුදල් ආපසු ලබා ගැනීමට හෝ ඔහුට විරුද්ධව නීත්‍යානුකූල කටයුතු කිරීමට හෝ එතුමා ඉක්මනින් ක්‍රියා කරනවාද? (ඉ) එසේ නම්, කවදාද?

*தோட்டத் தொழில், அரசியலமைப்பு அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா: (அ) (i) தெரணியகலையற்றிவலை திரு. பீ. எம். பொடிமஹாத்மயா 1957 ஆம் வருடம் யூலை மாதம் 10 ஆம் தேதி மாகலையற்றிவல கிராமத்தில் உள்ள தென்னபிற்றஹேன என்ற 5 ஏக்கர் காணியில் இரப்பர் புனர்நடுகை செய்ய விண்ணப்பித்துள்ளார் என்பதையும்; (ii) திரு. ஆர். எம். மொஹொட்டி அப்புஹாமியின் பிரதிநிதியாக இருந்ததன் காரணமாக அன்னாருக்கு அனுமதி வழங்கப்பட்டது என்பதையும்; (iii) எனினும் அன்னார் அனுமதி பெற்ற காணியில் இரப்பர் நடாமல் வேறொரு புதிய காணியில் இரப்பரை நட்டு திணைக்களத்தையும் உத்தியோகத்தர்களையும் ஏமாற்றி மூம்முறை பணம் பெற்றுள்ள விடயம் வெளியாகியுள்ளது என்பதையும் அவர் அறிவாரா? (ஆ) விசாரணையின் போது திரு. பீ. எம். பொடிமஹாத்மயா மோசடி செய்துள்ளார் என்று வெளியாகியுள்ளதால் அப்பணத்தை மீண்டும் பெறவோ அல்லது ஒழுங்கு நடவடிக்கை எடுக்கவோ அவர் விரைவில் நடவடிக்கை எடுப்பாரா? (இ) ஆம் எனில் எப்பொழுது?*

asked the Minister of Plantation Industry and Minister of Constitutional Affairs : (*a*) Is he aware that—(i) Mr. B. M. Podimahatmaya of Yatiwala, Deraniyagala, applied on 10th July 1959 to replant in rubber a five-acre extent of land called Tennepitahena, in Yatiwala, Magala; (ii) he was granted permission as he stood as an agent of Mr. R. M. Mohottiappuhamy ; (iii) not having replanted the land in respect of which permission had been obtained he had newly planted another block of land in rubber and had obtained money on three occasions by misleading the department and the officials ? (*b*) Will he take immediate steps either to recover this sum of money or to take legal action against Mr. B. M. Podimahatmaya, as the inquiry has revealed that he has committed a fraud ? (*c*) If so, when ?

**එච්. ජී. ඒ. කාරියවසම් මයා. (වැවිලි කර්මාන්ත ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**

*(திரு. எச். ஜீ. ஏ. காரியவசம்—தோட்டத் தொழில் அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)*

(Mr. H. G. A. Kariyawasam—Parliamentary Secretary to the Minister of Plantation Industry)

(අ) (i) ඔව්. (ii) ඔව්. (iii) ඔව්. (ආ) දෙපාර්තමේන්තුව මගින් පවත්වන ලද පරීක්ෂණවලදී එය වංචාවක් බව හෙළි වූයෙන් නීතිපතිගේ උපදෙස් ලබා ගන්නා ලදී. 1966.5.29 දින මෙම කරුණ අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව වෙත පවරන ලදී. අපරාධ පරීක්ෂණ දෙපාර්තමේන්තුව විසින් මෙම කරුණ අවිස්සාවේල්ල පොලිස් ස්ථානාධිපති වෙත පවරන ලදුව එය සම්බන්ධව ඉල්ලා ඇති ලියකියවිලි ද දෙපාර්තමේන්තුව විසින් සපයන ලදී. මේ සම්බන්ධව සිහිපත් කරන ලද මුත් පරීක්ෂණයේ ප්‍රතිඵලවල වාර්තා මේතාක් ලැබී නැත. දෙපාර්තමේන්තුව විසින් පොලිසිය හා සමග නැවත වරක් මේ සම්බන්ධව සාකච්ඡා පවත්වා ගෙන යනු ලැබේ. ඔවුන්ගේ වාර්තාවක් මත සුදුසු පියවරගනු ලැබේ. (ඉ) කරුණා කර 'ආ' බලන්න.

## රජයේ මුදල් තත්ත්වය

*அரசாங்க நிதி நிலைமை*

GOVERNMENT'S FINANCIAL POSITION

10. **එස්. බී. හේරත් මයා.** (හිරියාල) (එන්. ඩෙන්සිල් ප්‍රනාන්දු මයා.—මීගමුව—වෙනුවට)

*(திரு. எஸ். பி. ஹேரத்—ஹிரியால—திரு. என். டென்சில் பர்ணாந்து—நீர்கொழும்பு—சார்பாக)*

(Mr. S. B. Herat—Hiriyala—on behalf of Mr. N. Denzil Fernando—Negombo)

මුදල් ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1956 මාර්තු 30, 1960 ජූලි 30, 1965 මාර්තු 30 සහ 1970 මැයි 30 යන දිනයන්හි පැවති මුදල් තත්ත්වය සම්බන්ධයෙන්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පහත දැක්වෙන තොරතුරු එතුමා සපයන්නේද— (i) බැංකුවල තැන්පත් මුදල් වශයෙන් ඇති රජයේ මුදල්; (ii) රාජ්‍ය නියෝජිතයින් වෙත ඇති මුදල්; (iii) මහජන චීන සමූහාණ්ඩුවෙන් ලැබිය යුතු මුදල්; (iv) බුරුමයෙන් ලැබිය යුතු මුදල්; (v) වෙනත් රටවලින් ලැබිය යුතු මුදල්; (vi) රබර් කොමසාරිස් වෙත ඇති මුදල්; (vii) වෙනත් මාර්ගවලින් ලැබිය යුතු මුදල්; (viii) විදේශ වත්කම්; (ix) විදේශ ණය; (x) දේශීය ණය? (ආ) මෙම දිනයන්ට අදාළ සංඛ්‍යා විස්තර ලබා ගත නොහැකි නම්, ඊට ඉතා ආසන්න දිනයන්ට අදාළ සංඛ්‍යා විස්තර එතුමා සපයන්නේද?

*நிதி அமைச்சரைக் கேட்ட வினா: (அ) 1956 ஆம் ஆண்டு மார்ச் மாதம் 30 ஆந் தேதி, 1960 ஆம் ஆண்டு யூலை மாதம் 30 ஆந் தேதி, 1965 ஆம் ஆண்டு மார்ச் மாதம் 30 ஆம் தேதி, 1970 ஆம் ஆண்டு மே மாதம் 30 ஆந் தேதி ஆகிய தேதிகளிலிருந்த நிதி நிலைமை சம்பந்தமான பின்வரும் தகவல்களைத் தருவாரா? (i) வங்கிகளில் பணமாக இருந்த அரசாங்க நிதிகள்; (ii) முடிக்குரிய முகவர்களிடமிருந்த நிதிகள்; (iii) சீன மக்கள் குடியரசிடமிருந்து கிடைக்க வேண்டிய பணம்; (iv) பர்மாவிலிருந்து கிடைக்க வேண்டிய பணம்; (v) வேறு நாடுகளிலிருந்து கிடைக்கவேண்டிய பணம்; (vi) இறப்பர் ஆணையாளரிடமிருந்த நிதிகள்; (vii) வேறு இடங்களிலிருந்து கிடைக்க வேண்டிய பணங்கள்; (viii) வெளியிருப்புச் சொத்து; (ix) வெளிக்கடன்; (x) உள்ளூர்க்கடன்; (ஆ) மேற்கூறிய தேதிகளுக்கான விபரங்கள் இல்லையெனில், அவற்றிற்கு நெருங்கியுள்ள தேதிகளுக்கான விபரங்களைத் தருவாரா?*

asked the Minister of Finance: (*a*) Will he give the following information in regard to the state of finances on 30th March 1956, 30th July 1960, 30th March 1965 and 30th May 1970: (i) Government funds as cash in banks; (ii) funds with the Crown Agents; (iii) monies due from the People's Republic of China; (iv) monies due from Burma; (v) monies due from other countries; (vi) funds with the Rubber Commissioner; (vii) monies due from other sources; (viii) external assets; (ix) foreign debt; (x) domestic debt? (*b*) If the figures as at these dates are not available, will he furnish the figures available as close as possible to the dates given above?

**ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා**
*(கௌரவ கலாநிதி என். எம். பெரேரா)*
(The Hon. Dr. N. M. Perera)

මේ ප්‍රශ්නයට ලෙහෙසියෙන් පිළිතුරක් සපයන්නට පුළුවන්කමක් නැහැ, කරුණු දෙකක් නිසා. එකක් මේ ප්‍රශ්නය පැහැදිලි නැහැ.

"Will he give the following information as to the state of finances—External Assets ?"

What do you mean by the "state of finances" of the "external assets"?

මේ පොත අරගෙන බැලුවොත් ඕනෑ තරම් තිබෙනවා කියන්නට.

The Monthly Report of the Central Bank will give the facts.

මෙහි තිබෙන යම් යම් දේවල් ගැන පරීක්ෂා කරන්නට සෑහෙන කාලයක් ඕනෑ කරනවා.

"Funds with the Rubber Commissioner; Monies due from other countries; Monies due from other sources;"

මොනවාද මේ "other sources" කියන්නේ? මේ කියන සෑම දෙයක්ම සොයා ගන්නට සෑහෙන කාලයක් ඕනෑ. අඩු වශයෙන් මාසයක්වත් කල් ඕනෑ.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)

පුළුවන් තරමකින් පිළිතුරු දෙන්න.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)

කරනවා නම් හරියට කරන්න ඕනෙනේ?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වාචික පිළිතුරු

ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා
(கௌரவ கலாநிதி என். எம். பெரேரா)
(The Hon. Dr. N. M. Perera)

සම්පූර්ණයෙන් පිළිතුරු දෙන්නට උත්සාහ කරන්නම්. හැබැයි මාසයක් පමණ කල් ඕනෑ කරනවා.

ප්‍රශ්නය මතු දිනකදී ඉදිරිපත් කිරීමට නියෝග කරන ලදී.

வினவை மற்றொரு தினத்தில் சமர்ப்பிக்கக் கட்டளையிடப்பட்டது.

*Question ordered to stand down.*

## ආහාර හා රෙදිපිළි තොගවල වටිනාකම
### இருப்பிலிருந்த உணவு, உடையின் பெறுமதி
### VALUE OF FOOD AND CLOTHING IN STOCK

11. ආචාර්ය ඩබ්ලිව්. දහනායක (කේ. ඩබ්ලිව්. දේවනායගම් මයා.—කල්කුඩා—වෙනුවට)

(கலாநிதி டபிள்யு. தஹநாயக்க—திரு. கே. டபிள்யு. தேவநாயகம்—கல்குடா—சார்பாக)

(Dr. W. Dahanayake—on behalf of Mr. K. W. Devanayagam—Kalkudah)

විදේශීය හා දේශීය වෙළඳ ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1956 මාර්තු 30 දිනට, 1960 ජූලි 30 දිනට, 1965 මාර්තු 30 දිනට සහ 1970 මැයි 30 දිනට, ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුවේ, සමූපකාර තොග වෙළඳ සංස්ථාවේ හා සළු සලේ තිබුණු ආහාර හා රෙදිපිළි තොගවල වටිනාකම් එතුමා සඳහන් කරනවාද? (ආ) මෙසේ ඉල්ලුම් කෙරෙන සංඛ්‍යා විස්තර ඒ ඒ දිනවලට අදාලව නොතිබේ නම්, ඉහත සඳහන් දිනවලට කිට්ටුම දිනයන්ට අදාල වන සංඛ්‍යා විස්තර එතුමා සඳහන් කරනවාද?

வெளிநாட்டு, உள்நாட்டு வர்த்தக அமைச்சரைக் கேட்ட வினா: (அ) உணவு ஆணையாளர் திணைக்களம், கூ. மொ. வி. நிலையம், சலுசல ஆகியவற்றில் 1956 ஆம் ஆண்டு மார்ச் மாதம் 30 ஆந் தேதி, 1960 ஆம் ஆண்டு ஜுலை மாதம் 30 ஆந் தேதி, 1965 ஆம் ஆண்டு மார்ச் மாதம் 30 ஆந் தேதி, 1970 ஆம் ஆண்டு மே மாதம் 30 ஆந் தேதி ஆகிய தேதிகளில் இருப்பிலிருந்த உணவு, உடை ஆகியவற்றின் பெறுமதி என்ன? (ஆ) மேற்கூறிய தேதிகளுக்கான விபரங்கள் இல்லையெனில், அவற்றிற்கு நெருங்கியுள்ள தேதிகளுக்கான விபரங்களைத் தருவாரா?

asked the Minister of Foreign and Internal Trade: (*a*) Will he state the value of food and clothing in stock as at 30th March 1965, 30th July 1960, 30th March 1965 and 30th May 1970, in the Food Commissioner's Department, the C. W. E. and Salu Sala? (*b*) If the figures asked for are not available for the dates given above, will he give the figures for the dates nearest to the dates given above?

ගරු කේ. බී. රත්නායක (පාර්ලිමේන්තු කටයුතු හා ක්‍රීඩා ඇමති—විදේශීය හා දේශීය වෙළඳ ඇමති වෙනුවට)

(கௌரவ கே. பி. ரத்நாயக்க—பாராளுமன்ற அலுவல்கள், விளையாட்டுக்கள் அமைச்சர்—வெளிநாட்டு, உள்நாட்டு வர்த்தக அமைச்சர் சார்பாக)

(The Hon. K. B. Ratnayake—Minister of Parliamentary Affairs and Sports—on behalf of Minister of Foreign and Internal Trade)

පිළිතුරු දීර්ඝ නිසා මා එය සභාගත කරනවා.

සභාගත කරන ලද පිළිතුර මෙසේයි:

சபாபீடத்தில் வைக்கப்பட்ட விடை வருமாறு:

*The answer tabled is as follows:*

(අ) සඳහන් කර ඇති දිනයන්ට අදාල සංඛ්‍යා විස්තර ලබා ගැනීමට හැකියාවක් නැත. (ආ) සංඛ්‍යා විස්තර ලබාගත හැකි ඉතාම කිට්ටු දිනයන්හි දී තිබුණු තොගවල වටිනාකම් මෙසේයි:—

ආහාර කොමසාරිස් දෙපාර්තමේන්තුව

| දිනය | ආහාර ද්‍රව්‍ය වල වටිනාකම |
|---|---|
| | රු. |
| 1956.9.30 | 13,02,44,192 |
| 1960.9.30 | 10,08,49,632 |
| 1965.9.30 | 13,42,21,093 |
| 1969.9.30 | 18,23,62,898 |

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

### සමුපකාර තොග වෙළඳ සංස්ථාව

| දිනය | ආහාර ද්‍රව්‍ය වල වටිනාකම | රෙදිපිළිවල වටිනාකම |
|---|---|---|
| | රු. | රු. |
| 1960.12.31 | 57,24,968 | 1,27,11,162 |
| 1964.12.31 | 1,39,91,437 | 3,63,20,612 |
| 1970. 1. 1 | 2,49,66,600 | 1,18,26,100 |
| 1970. 6.30 | 2,04,37,400 | 1,37,40,900 |

### සීමාසහිත ලංකා සළුසල

| දිනය | ආනයනික රෙදිපිළි වල වටිනාකම | මෙරට නිෂ්පාදිත රෙදිපිළිවල වටිනාකම |
|---|---|---|
| | රු. | රු. |
| 1970.6.30 | 2,47,56,629 | 1,91,70,928 |

සීමා සහිත ලංකා සළු සලේ ව්‍යාපාරික කටයුතු ආරම්භ කරන ලද්දේ 1967 වර්ෂයේ අග භාගයේදීය.

(அ) குறிப்பிடப்பட்டுள்ள திகதிகளின் பிரகாரம் எண்களை உறுதிப்படுத்த இயலாது. (ஆ) கொடுக்கப்பட்ட திகதிகளுக்குக் கிட்டிய திகதிகளின் போது கையிருப்பிலிருந்த பொருட்களின் பெறுமதி தொடர்பாகக் கிடைக்கப்பெற்ற புள்ளிகள் பின்வருமாறு :

### உணவு ஆணையாளர் திணைக்களம்

| திகதி | உணவுப்பொருட்களின் பெறுமதி |
|---|---|
| | ரூபா |
| 30.9.1956 | 13,02,44,192 |
| 30.9.1960 | 10,08,49,632 |
| 30.9.1965 | 13,42,21,093 |
| 30.9.1969 | 18,23,62,998 |

### கூட்டுறவு மொத்தவிற்பனை ஸ்தாபனம்

| திகதி | உணவுப்பொருட்களின் பெறுமதி | துணிவகைகளின் பெறுமதி |
|---|---|---|
| | ரூபா | ரூபா |
| 31.12.1960 | 57,24,968 | 1,27,11,162 |
| 31.12.1964 | 1,39,91,437 | 3,63,20,612 |
| 31. 1.1970 | 2,49,66,600 | 1,18,26,100 |
| 30. 6.1970 | 2,04,37,400 | 1,37,40,900 |

### லங்கா சலு சல லிமிடெட்

| திகதி | இறக்குமதி செய்யப்பட்ட துணிவகைகளின் பெறுமதி | உள்நாட்டுத் துணிவகைகளின் பெறுமதி |
|---|---|---|
| | ரூபா | ரூபா |
| 30.6.1970 | 2,47,56,629 | 1,91,70,928 |

1967 ஆம் ஆண்டின் கடைசிப் பகுதியின்போது லங்கா சலு சல லிமிட்டெட் தனது வியாபாரத் தொழிற்பாடுகளை ஆரம்பித்தது.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

(*a*) It is not possible to ascertain the figures in respect of the dates mentioned. (*b*) The available figures relating to the value of stocks as at dates nearest to the dates given are as follows:-

**Food Commissioner's Department**

| *Date* | | *Value of Foodstuffs* |
|---|---|---|
| | | *Rs.* |
| 30.9.1956 | .. | .. 130,244,192 |
| 30.9.1960 | .. | .. 100,849,632 |
| 30.9.1965 | .. | .. 134,221,093 |
| 30.9.1969 | .. | .. 182,362,998 |

**Co-operative Wholesale Establishment**

| *Date* | | *Value of Foodstuffs* | *Value of Textiles* |
|---|---|---|---|
| 31.12.1960 | .. | .. 5,724,968 | .. 12,711,162 |
| 31.12.1964 | .. | .. 13,991,437 | .. 36,320,612 |
| 1. 1.1970 | .. | .. 24,966,600 | .. 11,826,100 |
| 30. 6.1970 | .. | .. 20,437,400 | .. 13,740,900 |

**Lanka Salu Sala Limited**

| *Date* | | *Value of Imported Textiles* | *Value of Local Textiles* |
|---|---|---|---|
| | | *Rs.* | *Rs.* |
| 30.6.1970 | .. | .. 24,756,629 | .. 19,170,928 |

Lanka Salu Sala Limited commenced its business activities in the latter part of 1967.

# පණත් කෙටුම්පත් පිළිගැන්වීම

சமர்ப்பிக்கப்பட்ட மசோதாக்கள்

# BILLS PRESENTED

## ලංකා (ආණ්ඩු ක්‍රම) (සංශෝධන) පනත් කෙටුම්පත

இலங்கை (அரசியலமைப்பு) (திருத்தம்) மசோதா

CEYLON (CONSTITUTION) (AMENDMENT) BILL

"to amend the Ceylon (Constitution) Order in Council, 1946."

පිළිගන්වන ලද්දේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති වෙනුවට ගරු කේ. බී. රත්නායක විසිනි. 1970 ඔක්තෝබර් 11 වන ඉරිදා දෙවන වර කියවිය යුතුයයිද, එම මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදි.

பொது நிர்வாகம், உள்ளூராட்சி, உள்நாட்டு அலுவல்கள் அமைச்சர் சார்பாக கௌரவ கே. பி. இரத்நாயக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1970 ஒக்ரோபர் 11, ஞாயிற்றுக்கிழமை இரண்டாம் முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்படவேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

*Presented by the Hon. K. B. Ratnayake, on behalf of the Minister of Public Administration, Local Government and Home Affairs, to be read a Second time upon Sunday, 11th October 1970, and to be printed.*

## ප්‍රාදේශීය බල මණ්ඩල ඡන්ද විමසීම් (සංශෝධන) පනත් කෙටුම්පත

உள்ளூரதிகார சபைகள் தேர்தல்கள் (திருத்தம்) மசோதா

LOCAL AUTHORITIES ELECTIONS (AMENDMENT) BILL

"to amend the Local Authorities Elections Ordinance."

පිළිගන්වන ලද්දේ රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති වෙනුවට ගරු කේ. බී. රත්නායක විසිනි. 1970 ඔක්තෝබර් 11 ඉරිදා දෙවන වර කියවිය යුතුයයිද, එය මුද්‍රණය කළ යුතුයයිද නියෝග කරන ලදි.

பொது நிர்வாகம், உள்ளூராட்சி, உள்நாட்டு அலுவல்கள் அமைச்சர் சார்பாக கௌரவ கே. பி. இரத்நாயக்க அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1970, ஒக்ரோபர் 11, ஞாயிற்றுக்கிழமை இரண்டாம்முறையாக மதிப்பிடப்பட வேண்டுமெனவும் அச்சிடப்பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.

*Presented by the Hon. K. B. Ratnayake, on behalf of the Minister of Public Administration, Local Government and Home Affairs, to be read a Second time upon Sunday, 11th October 1970, and to be printed.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

## බැංකු හර බදු පනත් කෙටුම්පත

වங்கிப் பற்றுக்கள் வரி மசோதா

**BANK DEBITS TAX BILL**

"to impose a tax on debits made against current accounts in commercial banks and to provide for matters connected therewith or incidental thereto".

**පිළිගන්වන ලද්දේ මුදල් ඇමති ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා විසිනි. 1970 ඔක්තෝබර් 11 වන ඉරිදා දෙවන වර කියවිය යුතු යයිද, එය මුද්‍රණය කළ යුතු යයිද නියෝග කරන ලදී.**

*நிதி அமைச்சர் கௌரவ கலாநிதி என். எம். பெரேரா அவர்களால் சமர்ப்பிக்கப்பட்டது. 1970, ஒக்ரோபர் 11, ஞாயிற்றுக்கிழமை இரண்டாம் முறையாக மதிப்பிட வேண்டுமெனவும் அச்சிடப் பட வேண்டுமெனவும் கட்டளையிடப்பட்டது.*

*Presented by the Hon. Dr. N. M. Perera, Minister of Finance; to be read a Second time upon Sunday, 11th October 1970, and to be printed.*

## පෝය නිවාඩු ක්‍රමය

*போய விடுமுறைத் திட்டம்*

POYA HOLIDAY SCHEME

අ. භා. 2.15

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)

මම ඉදිරිපත් කරන යෝජනාව මෙයයි:

"පෝය නිවාඩු ක්‍රමය සංශෝධනය කිරීම අවශ්‍ය යයි අත්දැකීම් අනුව මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරන අතර, පහත දැක්වෙන නව ක්‍රමය යෝජනා කරයි:—සියලුම සේවකයන්ට දින පහේ සතියක් ලබා දෙමින්, පෝය දින සහ ඉරු දින ප්‍රසිද්ධ නිවාඩු දිනයන් කළ යුතු අතර වැඩ කරන සියලුම දිනයන්හි වැඩ පෙරවරු 8 ට අරම්භ කර, දිවා භෝජනය සඳහා පැයක විවේකයක් ඇතිව, පස්වරු 5 ට අවසන් විය යුතුය."

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මෙම යෝජනාව කියවන්නත් පෙර ගරු මුදල් ඇමතිතුමා යම් වචනයක් කී බවක් මට පෙනුනා. මා මේ ගැන පසුගිය ඉතිහාසය මතක් කරයිදෝ සිතා විය හැකියි එසේ කිව්වෙ. මුදල් ඇමතිතුමා විසින්ම කරන ලද කථාවකින් කොටසක් මා එතුමාට මතක් කර දෙන්න කැමතියි. එතුමා එම කථාව කළේ 1964 දීයි. සමහර විට දැන් ඒවා මතක නැතිව ඇති. එතුමා එදා මා දැන් ඉදිරිපත් කරන මෙම යෝජනාවට එකඟ වුණා. එසේ එකඟ වී එවැනි ක්‍රමයක් ඇති කරනවාය කියා පොරොන්දු වුණා. වෘත්තීය සමිති කැඳවා එතුමා එසේ පොරොන්දු වුණා. ගරු ඇමතිතුමා එක් වරටම ඒ කාරණාව ගැන මතක් කළ නිසා එතුමා 1964 දී අයවැය විවාදයේදී කරන ලද වැදගත් කථාවෙන් කොටසක් මා කියවන්න අදහස් කරනවා. මා අවුරුදු 20 ගණනක් මේ පාර්ලිමේන්තුවේ සිටියා. ඒ මුළු කාලයටම මා විසින් ඇහුම්කන් දුන් ඉතාමත්ම වැදගත් කථාව නම් එතුමා විසින් 1964 ජූලි මස 30 වෙනි දින පවත්වන ලද අයවැය කථාවයි. ගරු ආචාර්ය එන්. එම්. පෙරේරා මහතා 1964 දී මුදල් ඇමති වශයෙන් කට යුතු කරද්දී පවත්වන ලද එම කථාවේ අන්තිම කොටසේ මා විසින් කර තිබෙන මෙම යෝජනාව ගැන සඳහන් වෙනවා. 1964 ජූලි මස 30 වෙනි දින හැන්සාඩ් වාර්තාවේ 1684 වන තීරුවේ එය සඳහන් වෙනවා.

"11. *A Five-day Week for Government Servants:*

In many countries of the world, particularly in the countries of the West, some sectors of the economy work a five-day week. It is sometimes argued that a five day week is intrinsically wrong in an under-developed economy where the emphasis has naturally to be on more work and still more work. However, as a practical proposition we all know that the amount of work that an office employee can put in on a Saturday is necessarily limited not merely because of the general distractions of a social and domestic nature which pertain to a Saturday, but also because it is fundamentally difficult to fit in an adequate programme of work for a half-day when the general principle is to work a full day. Apart from these qualifications, it would also be possible to work the same hours during a five-day week as would be done in a five and a half day week, if the daily hours are made a little longer. Thus, instead of working from 9 a.m. to 4 30 p.m., perhaps if we could start at 8.45 a.m. and go on till 5 p.m. or so, we could quite well catch up on the four hours lost by not working on a Saturday. Working a five-day week instead of as at present five and a half days has also certain other distinctive advantages both from the point of view of the employees as well as the economy at large. From the point of view of the employee a whole Saturday off would not only be less expensive in travelling to office and back but would also provide more scope for relaxation or attending to the domestic chores such as marketing and shopping. Two full days off at the end of a week would certainly be better for

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය ඩබ්ලිව්. දහනායක]

the health of employees and would mean more time to be spent with the family. By improving the morale of the worker an increase in his efficiency could be achieved by this means.

From the national point of view, a whole Saturday off would be less foreign exchange spent on the operation of bus and train services and less wear and tear on the transport system in general. These are real advantages from an economic point of view. A two-day week-end would also make it easier to organize voluntary labour camps which could help both the office worker as an individual as well as society in general."—

මුදල් ඇමති ආචාර්ය එන්. එම්. පෙරේරා ඇමතිතුමාගේ කථාවේ මෙන්න මේ කොටසේයි, මගේ යෝජනාව අඩංගු වී තිබෙන්නෙ :

—"There is one other advantage with regard to the five-day week. For some time now Government has been considering the feasibility of making all Poya days holidays."—

ඒ වකවානුවේ සියලුම පෝය දින නිවාඩු දින කිරීම ගැන සාකච්ඡා කරගෙන යන බවයි පැහැදිලි කර තිබෙන්නෙ.

—"The adoption of a five-day week can, without much inconvenience to the organization of the administration and to commerce, be adopted to accommodate all Full Moon days. In any week in which such a Poya day falls, the corresponding Saturday could be treated as a working day unless, of course, the Poya day happens to be on a Saturday or a Sunday in which case no further adjustment is required."—

හැම සතියේම පෝය දින නිවාඩු දින වූ විට සෙනසුරාදා නිවාඩු නොකර එම පෝය දිනය සහ ඉරිදා දිනය යන දෙකම අර ගන්නය කියන එකයි මුදල් ඇමතිතුමාගේ යෝජනාවෙන් කියන්නෙ.

ගරු මුදල් ඇමතිතුමා මෙහි සිටියා නම් හොඳයි. ගරු උප ඇමතිතුමා මුදල් ඇමතිතුමාව කැඳවනවා නම් මා ඉතාමත් කැමතියි.

"I am sure that such a measure would be deeply appreciated by the people of this country at large, particularly by the peasant who has traditionally looked upon the Poya day as a non-working day. However, the Government does not wish to make a unilateral decision on this matter of a five-day week. I would welcome the comments of trade unions and other sectors of the community so that a decision which is acceptable to all can be implemented."—[OFFICIAL REPORT, 30th July 1964; Vol. 56, cc. 1863-5.]

මා කියෙවූ ඒ කථාවෙන් පෙන්වා දී තිබෙනවා, දින පහේ සතියක තිබෙන වැදගත්කම. එවකට සිටි මුදල් ඇමතිතුමා තර්කානුකූලව පෙන්වා දී තිබෙනවා, දින පහේ සතියක් කොපමණ වටිනා දෙයක්ද කියා. මෙය මගේ අලුත් කර්තයක් හැටියට මම ඉදිරිපත් කරන්නෙ නැහැ. සෙනසුරාදා නොහොත් අප විසින් හඳුන්වනු ලැබූ වරුව දිනය වැඩ දිනයක් වශයෙන් තිබීමෙන් වැඩි ප්‍රයෝජනයක් ලබෙන්නෙ නැත, වරුව දිනයේදී වැඩි වැඩක් කෙරෙන්නෙ නැත කියා පැහැදිලි කර දී තිබෙනවා. එතුමා කියනවා, දවස් පහකුත් වරුවක් වැඩ කිරීමේ වර්තමාන ක්‍රමය වෙනස් කර ඒ වෙනුවට දිනකට වැඩ කිරීමේ කාලය දික් කොට දින පහක් පමණක් වැඩ කිරීමේ ක්‍රමයක් සකස් කිරීම සුදුසුය කියා. එසේ දින පහේ වැඩ කරන සතියක් ඇති කිරීමෙන්, තමන්ගේ පෞද්ගලික කටයුතු සඳහා අනික් දින 2 යොදා ගන්නට පුළුවන්. ඒ වාගේම වැඩි කාලයක් විවේක ගැනීමට අවකාශ සැලසෙන නිසා, එමෙන්ම විනෝද ක්‍රීඩා වැනි දෙයට වැඩි කාලයක් ගත කිරීමට අවකාශ සැලසෙන නිසා, සේවකයන් සතුටට පත් වන්නට පුළුවන් බවක් එතුමා සඳහන් කර තිබෙනවා. මෙබඳු හේතූන් නිසා සේවකයන්ගේ සෞඛ්‍ය තත්ත්වය දියුණු වන්නට පුළුවන් බවද එතුමා තව දුරටත් ප්‍රකාශ කරනවා. එපමණක් නොවෙයි, සති අන්තයේදී දින දෙකක විවේකයක් ලැබුනොත් සේවකයන්ගේ සුභ සිද්ධිය පිණිස "ලේබර් කෑම්ප්" වැනි විනෝදස්ථාන ඇති කර ගන්නට පුළුවන් වෙනවාය කියාත් එතුමා කියනවා. ඒ වාගේම පෝය නිවාඩුව සහ ඉරිදා නිවාඩුව දෙකම එකට ගත්තාම මේ ක්‍රමය හොඳින් සපල කර ගන්නට පුළුවන් වන බව කියනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පෝය නිවාඩුව දුන්නාම ජනතාව බොහොම සතුටට පත් වුණා. සාමාන්‍යයෙන් ගම්බද ප්‍රදේශවල උදවියට පෝය දිනය වැඩ කරන දිනයක් නොවෙයි. කෙසේ වෙතත් මුදල් ඇමතිතුමා එදා දින පහේ වැඩ කරන සතිය ඇති කිරීම පිළිබඳව අදහස ඉදිරිපත් කර වෘත්තීය සමිතිවලට ඒ සම්බන්ධයෙන් කරුණු දක්වන්නටයයි කීවා. මා දන්නා හැටියට, වෘත්තීය සමිති රාශියක්ම එවකට සිටි මුදල් ඇමතිතුමාට දැනුම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දුන්නා, ඒ අදහසට සම්පූර්ණයෙන්ම එකඟ වෙනවාය කියා. දැන් මා ඉදිරිපත් කරන්නට යන යෝජනාවත් මුදල් ඇමතිතුමා එදා ඉදිරිපත් කළ අදහස ගැබ්වූ යෝජනාවක් බව කියන්නට කැමතියි. අද මා ඉදිරිපත් කරන යෝජනාවේත් එතුමා අදහස් කළ කාරණාත් අතර කිසිම වෙනසක් නැහැ. වෙනසකට තිබෙන්නේ මෙන්න මෙපමණයි: මා කියනවා, වැඩ පටන් ගැන්මේ වේලාව අටයි හතලිස් පහ වෙනුවට පෙරවරු අට කරන්නටය කියා. ඒ විධියට නියමයක් කළාම දැනට වඩා ඉක්මනින් නැතිනම් වේලාසනින් වැඩ පටන් ගන්නට පුළුවන් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මෙම යෝජනාව ඉදිරිපත් කරන්නෙ, අවුරුදු හතරක පමණ කාලයක අත්හදා බැලීම් වලින් පසුවයි. 1964 දී අප රටේ බෞද්ධයන්ගේ විශාල උද්ඝෝෂණයක් තිබුණා, හතර පෝය නිවාඩු දින කරන්නටය කියා. එම ඉල්ලීමට ශ්‍රී ලංකා නිදහස් පක්ෂය මෙන්ම එක්සත් ජාතික පක්ෂයද එකඟ වුණා. 1965 දී ජයග්‍රහණය කළ එක්සත් ජාතික පක්ෂය හතර පෝය නිවාඩු දින කිරීමේ පනතක් 1965 දී ඉදිරිපත් කළා. ඒ අනුව 1966 ජනවාරි 1 වනදා සිට හතර පෝය නිවාඩු දීමේ ක්‍රමය ආරම්භ කළා. එම යෝජනාව ඉදිරිපත් කරන්නට තිබුණේත් එම ක්‍රමය ක්‍රියාවේ යෙදවීමේ වගකීම භාරවී තිබුණේත් එවකට ස්වදේශ කටයුතු භාර ඇමතිවරයා වශයෙන් මටයි. එම නිසාම මට පුළුවන් වුණා, මේ ක්‍රමයේ ඇති දුර්වලකම් මෙන්ම වැරදි තැන් පිළිබඳව සෑහෙන අවබෝධයක් ලබා ගන්නට. 1967-69 කාලය තුළ ලැබූ අත්දැකීම් අනුව මෙම ක්‍රමයෙහි සංශෝධන ඇති කළ යුතු ආකාරය ගැන සන්දේශයක් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ කාරණා ගැන මා විස්තර කළේ මෙම ආණ්ඩුව පිහිටෙව්වාට පසුව මෙය හදිසියේම ඇති වූ දෙයක් නොවන බව පෙන්වා දෙන්නටයි. මා කලින් සඳහන් කළ ලෙස, පසුගිය ආණ්ඩුවේ ස්වදේශ කටයුතු භාර ඇමතිවරයා වශයෙන් සිටියදී දැන් පවතින ක්‍රමයෙහි සංශෝධනයක් කරන්නට කියා යෝජනාවක් කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළා. ඒ කැබිනට් සන්දේශයෙන් ඉදිරිපත් කළේත් අද මා ඉදිරිපත් කරන යෝජනාවමයි.

ඊළඟට අපි බලමු, දැන් තිබෙන පෝය නිවාඩු ක්‍රමයේ තිබෙන දුර්වලකම්, අඩුපාඩු කම් මොනවාද කියා. එබඳු වැරදි, අඩුපාඩු 6 ක් තිබෙන බව පෙන්වන්නට මට පුළුවනි. දැන් තිබෙන පෝය නිවාඩු ක්‍රමය නිසා සතියේ ඒ ඒ දවස්වල නම් පවා අපට අමතක වී තිබෙන බව, එහි පළමු වැනි අඩුපාඩුව වශයෙන් පෙන්වා දෙන්නට පුළුවනි. අද සඳුදාද, අඟහරුවාදාද, සිකුරාදාද කියා මා නම් දන්නේ නැහැ. මා නම් දවස මොකක්දැයි සොයා ගන්නේ ලිතක්, දින දර්ශනයක් බැලීමෙනුයි. මෙසේ ඒ ඒ දවස් මොනවාදැයි මතක තබා ගන්නට තිබෙන අපහසුව නිසා සාමාන්‍ය මහජනතාව පවා ඉතාමත් දුෂ්කරතාවලට මුහුණ පාන බව අප දන්නවා. අඟහරුවාදා හා සිකුරාදා දින වල සාමාන්‍යයෙන් මෘත දේහ පිළිබඳ අවසාන කෘත්‍යය කරන්නේ නැහැ. එහෙත් මේ පෝය නිවාඩු ක්‍රමය හේතුකොටගෙන එදා දවස මොකක්දැයි මතක තබා ගන්නට ඉතාමත් අපහසු නිසා අවමංගල කටයුතු කිරීම සඳහා පවා ලිත්, දින දර්ශන බලන්නට සිදු වෙනවා. මෙසේ දවස කවදාදැයි අමතක වීමෙන් අඟහරුවාදා හෝ සිකුරාදා දවසක මෘත දේහයක් පිළිබඳ අවසාන කෘත්‍යය කෙරී තිබුණොත් එය දැන ගත් වහාම ඔවුන් තුළ ලොකු කණගාටුවක් ඇති වෙනවා.

**බී. වයි. තුඩාවේ මයා.**
*(திரு. பி. வை. துடாவ)*
(Mr. B. Y. Tudawe)
එය මිථ්‍යා දෘෂ්ටියක්.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
(Dr. W. Dhanayake)
මා පෙන්වා දුන්නේ සාමාන්‍යයෙන් මිනිසුන් අවමංගල කටයුතුවලදී ක්‍රියා කරන පිළිවෙළ හා වර්තමාන පෝය නිවාඩු ක්‍රමය නිසා ඇති වන අපහසුකම් පමණයි. එසේ ක්‍රියා කිරීම හරි හෝ වැරදි බව පෙන්වන්නට මා උත්සාහ කරන්නේ නැහැ. ඒ කෙසේ හෝ වේවා සතියේ දවස මොකක්දැයි මතක තබා ගන්නට ඇති අපහසුව නිසා නොයෙකුත් අවුල් වියවුල් ඇති වන බව නම් නොබියව කියන්නට පුළුවනි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය ඩබ්ලිව්. දහනායක]

ඊළඟට, වර්තමාන පෝය නිවාඩු ක්‍රමය නිසා සතියේ මුල් දවස මොකක්ද, අග දවස මොකක්ද කියා දැන ගන්නට අමාරු වී තිබෙනවා. ඉස්ලාම් රටවල් සතියේ මුල් දවස හැටියට ගණන් ගන්නේ සිකුරාදා යි. ඒ කෙසේ වෙතත් මුස්ලිම් භක්තියන්ට සිකුරාදා ඉතා වැදගත් දිනයක්. එසේම යුදෙව් රටවල්—ඊශ්‍රායලය—සතියේ මුල් දවස හැටියට ගණන් ගන්නේ සෙනසුරාදායි. අනෙක් සියලුම රටවල් පාහේ සතියේ මුල් දවස හැටියට ගණන් ගන්නේ සඳුදා යි.

**ඊලියන් එම්. නානායක්කාර මයා.** (කඹුරුපිටිය)
*(திரு. ஏலியன் எம். நாணயக்கார—கம்புறுப்பிட்டிய)*
**(Mr. Aelian M. Nanayakkara—Kamburupitiya)**

නැහැ, ඉරිදා.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
**(Dr. W. Dhanayake)**

හෙ දයි, ඉරිදාය කියමු. එහෙත් වර්තමාන පෝය නිවාඩු ක්‍රමය නිසා ලංකාවේ සතියේ මුල් දවස දන්නේත් නැහැ; අග දවස දන්නේත් නැහැ.

**දි. මු. ජයරත්න මයා.** (ගම්පොල)
*(திரு. தி. மு. ஜயரத்ன—கம்பளை)*
**(Mr. D. M. Jayaratne—Gampola)**

සමහරුන්ට අග මුල මතක නැහැ.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
**(Dr. W. Dhanayake)**

තුන් වැනි කාරණය, දැන් ලංකාවේ සමහර සතිවලට දවස් හතකුත්, තවත් සමහර සතිවලට දවස් අටකුත් තිබෙනවා. එසේ සතියේ දවස් ගණන හතද නැත්නම් අටද කියා තීරණය වන්නේ පෝය යෙදෙන හැටියටයි. එසේ සමහර සතිවලට දවස් 8 ක් වැටීම නිසා, පෙරට වඩා වැඩි දවස් ගණනක් සමහර සතිවල වැඩ කරන්නට රජයේ සේවකයන්ට සිදු වන නිසා එමඟින් ඔවුන්ට අහිමි වන නිවාඩු ගණන් බලා ඒ වෙනුවෙන් අතිරේක නිවාඩු දවස් ලබා දීම භාණ්ඩාගාරයට පවරා තිබෙන්නේත්, වර්තමාන පෝය නිවාඩු ක්‍රමයේ අවුල් තත්ත්වය නිසායි.

හතර වැනි කාරණය මෙයයි: පෝය නිවාඩුව ලබා දුන්නේ බෞද්ධයන් පෙරට වඩා හොඳින් එදින බෞද්ධ චාරිත්‍රවල යෙදේය යන විශ්වාසය ඇතිවයි. ඒ විශ්වාසය, බලාපොරොත්තුව, ප්‍රාර්ථනය එසේ ඉටු වේය යි අපත් සිතුවා. මා මේ කාරණය කියන්නේ මගේ අත්දැකීම් පමණක් නොව ලංකාවේ ප්‍රවෘත්ති පත්‍රවල පළ වූ, සංඝයා වහන්සේලාගේ ලිපිවලින් දැක්වුණු කරුණුත් උඩයි. දැන් පෝය දිනවල ආගමික කටයුතුවලට වඩා පිටස්තර කටයුතු—සමහර විට පෝය දිනයේ පරිශුද්ධත්වයට පටහැනි කටයුතු—බෞද්ධයන් අතින් සිදු වන බව උන්වහන්සේලාගේ ඒ ලිපිවලින්ම පැහැදිලි වෙනවා. ඒ නිසා සමහර සංඝයා වහන්සේලා කියනවා, කලින් මෙන් දැන් පෝය නිවාඩුවෙන් බෞද්ධ කටයුතුවලට උපකාරයක් වන්නේ නැහැ කියා. දැන් තිබෙන නිවාඩු ක්‍රමය අනුව පෝය දිනවල බෞද්ධ චාරිත්‍ර විරෝධී වැඩ කටයුතු කෙරෙනවා. ඒ 4 වෙනි වැරැද්දයි.

5 වෙනි වැරැද්ද: පෙර පෝය දිනවල ආණ්ඩුවේ කිසිම කන්තෝරුවක හරියාකාර කිසි වැඩක් කෙරෙන්නෙ නැහැ. මම මේ කියන්නෙ අත්දැකීමෙනුයි. බොහොම දෙනෙකු හැකිතරම් දුරට තමන්ට අසිනි නිවාඩු වලින් පෙර පෝ දින නිවාඩු ලබා ගෙන දින දෙකක්ම ගෙදර නවතිනවා.

6 වෙනි වැරැද්ද: දැන් තිබෙන පෝය නිවාඩු ක්‍රමය නිසා රුපියල් ලක්ෂ ගණනින් අලාභ සිදුවන බව වෙළඳ අංශවලින් අපට දැනුම් දී තිබෙනවා. ඉරිදා දවසේ වැඩ කරන ලෙස රජය නියම කර තිබුණත් ජාත්‍යන්තර වශයෙන් ගනුදෙනු කරන අයට එසේ කිරීම අපහසු බව ඔවුන් කියනවා. ඉරිදා දිනවල රජයේ කාර්යාලවල වැඩ කළත්, වෙළඳ කටයුතුවලදී ඉරිදා වැඩ නොකරන දිනයක්. මෙතැන වැඩ කරන දිනය අතන වැඩ නොකරන දිනයක් වෙනවා. ඒ අනුව වෙළඳ කටයුතුවලදී විශාල පාඩු විඳින්නට සිදු වෙනවා. අත්දැකීමෙන් කියන්නට පුළුවනි, මේ කරුණු 6 පෝය නිවාඩු ක්‍රම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

පෝය නිවාඩු ක්‍රමය

යේ අඩුපාඩු බව. ඒ නිසා මේ රජය විසින් අලුත් නිවාඩු ක්‍රමයක් සකස් කරන්ට ඕනෑ.

ගරු මුදල් ඇමතිතුමා 1964 දී යෝජනා කළ දින 5 සතිය ගැන දැන් මම තමුන්නාන්සේලාට කියන්නම්. පෝය දිනත්, ඉරිදා දිනත් දෙකම නිවාඩු දීමේදී එක කාරණයක් උඩ සේවකයන් විරුද්ධ වන්ට පුළුවනි. නිවාඩු දවස් දෙක අතරක් නොමැතිව එකකට පසු අනික තිබිය යුතු යයි ඔවුන් ඉල්ලනවා. එක නිවාඩුවක් ඉරිදාත්, අනික පෝයදාත් දුන්නාම මේ අතර වැඩ කරන දින වැටෙන නිසා අප ඊට කැමැති නැතැයි සේවකයන් කියනවා. මේ කාරණය හරි ගස්සන්ට ගියොත් පෝය නිවාඩුවත් සමග ඉරිදා නිවාඩුව දෙන්ට බැරි වෙනවා. එහෙත් ඒ ඉල්ලීම කරන සේවකයන්ගේ දැන ගැනීම සඳහා මා මේ කාරණය මතක් කරන්නට කැමතියි. යම්කිසි විධියකින් පෝය දින සහ ඉරිදා දින නිවාඩු ක්‍රමයක් සකස් කර ක්‍රියාත්මක කළා නම් 1969 සහ 1970 අවුරුදුවල ඒ දින දෙක කොයි තරම් දුරට එක ළඟ වැටෙයිද කියා මා ගණන් බැලුවා. එහිදී මට පෙනී ගියා, 1969 වර්ෂයේ සති 23 කදීත්, 1970 වර්ෂයේ සති 22 කදීත් ඉරිදා දින සහ පෝය දිනය එක ළඟම නොකැඩී යෙදී තිබුණු බව. ඒ නිසා සාමාන්‍යයෙන් අපට හිතන්ට පුළුවන්, මේ අලුත් ක්‍රමය ඇති කළොත් සම්පූර්ණයෙන්ම නැති වුණත් අඩු වශයෙන් සති 52 න් සති 22 කදී පමණ එක පිටම නිවාඩු දෙකක් යෙදෙන බව.

ඊළඟට තවත් කාරණයක් කියන්ට කැමතියි. එය අපේ ඇමතිතුමන්ලා දැන් පිළිගෙන තිබෙන දෙයක්. එනම් උදේ 8 ට වැඩ ආරම්භ කිරීමයි. එය හොඳ දෙයක්. මම මේ කියන්නේ අත්දැකීමෙනුයි. මේ රජයේ ඇමතිවරුන් සියලු දෙනාම පාහේ—මා ටෙලිෆෝන් කර බැලූ සියලු දෙනාම—උදේ 8 ට පමණ තමන්ගේ කාර්යාලවල වැඩට පැමිණ සිටිනවා. ඒක බොහොම හොඳයි. ඒ අන්දමට සියලුම සේවකයන් උදේ 8 වන විට කාර්යාලවලට ගෙන්වා ගන්නට පුළුවන් නම් වඩා හොඳින් වැඩ කරනවාට කිසිම අනුමානයක් නැහැ. කාර්යාල පටන් ගන්නා වේලාව ඒ විධියට වෙනස් කරනවා නම් බස් සහ දුම්රිය කාල සටහන්ද ඊට ගැළපෙන අන්දමට වෙනස් කර ගන්නට ඕනෑ.

නැවතත් ඉරිදා නිවාඩු දෙන්නැයි මා ඉල්ලන්නේ මන්දැයි ඊළඟට මා විස්තර කරන්නට කැමතියි. 1966 ජනවාරි මාසයේදී එවකට පැවති රජය පෝය දින රජයේ නිවාඩු දින බවට පත් කරන අවස්ථාවේදී මේ රටේ කතෝලික සහ ක්‍රිස්තියානි පූජක පක්ෂය ඊට සහාය දුන්නා. ඉරිදා නිවාඩුව නැති කර ඒ වෙනුවට පෝය දින නිවාඩු දීම සම්බන්ධයෙන් ඒ රජයට සහාය දීම ගැන අප එදා ඒ කතෝලික සහ ක්‍රිස්තියානි පූජක පක්ෂයට අපේ ප්‍රසාදයත් ස්තුතියත් පිරිනැමුවා. කෙසේ වෙතත් ඉරිදා නිවාඩුව අවලංගු කිරීම සම්බන්ධයෙන් කතෝලික සහ ක්‍රිස්තියානි බැතිමතුන් තුළ ලොකු වේදනාවක් තිබුණු බව බුද්ධිමත් අය හොඳින් දන්නවා. ඒ කතෝලික හා ක්‍රිස්තියානි බැතිමතුන්ගේ අදහස් දැනගත් ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ කථිකයන් මීගමු ප්‍රදේශයේදී ප්‍රකාශ කෙළේ "අප තමුන්නාන්සේලාට ඉරිදා නිවාඩුව නැවතත් දෙනවා" කියලයි. මේ ප්‍රකාශයන් පිළිබඳ වාර්තා පත්‍රවල ලොකු අකුරින් පළ වුණා.

**ටී. බී. හේරත් මයා.** (හොරොව්පොතාන)
*(திரு. ரீ. பி. ஹேரத்—ஹொரவபொத்தானை)*
(Mr. T. B. Herath—Horowupatana)

ලේක්හවුස් පත්තරවලද?

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)

ඒ වාර්තා වැරදි නම් ඒ බව කියන්න. කෙසේ වුණත් මා මේ කාරණය සඳහන් කෙළේ තර්කයක් හැටියට නොවෙයි. ඉරිදා නිවාඩුව නැති කිරීම ගැන කතෝලික සහ ක්‍රිස්තියානි උදවිය තුළ නොසන්සුන්කමක් ඇති වුණා. පුළුවන් නම් නැවතත් මේ නිවාඩුව ලබා ගන්නට ඒ අය කැමති වුණා. ආගමික කරුණු අනුව පමණක් නොව වෙනත් කරුණු අනුවත් ඉරිදා නිවාඩු දෙන්නට පුළුවන් නම්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය ඩබ්ලිව්. දහනායක]

හොඳයි. ඉරිදා නිවාඩු දුන්නොත් පට ලැවිල්ලක් නැතිව සතියේ ආරම්භය සොයා ගන්නට පුළුවනි. ඉරිදා නිවාඩු දුන්නාට ජාත්‍යන්තර වෙළඳාමට හානියක් සිදු වන්නේ නැහැ. ඒ අතරම ඉරිදා නිවාඩුව දීමෙන් "ඉරිදා නිවාඩුව නැවතත් ආපසු ඕනෑ" යන අදහස පිට සිටින කතෝලික සහ ක්‍රිස්තියානි බැතිමතුන්ගේ ඒ අදහසට ගරු කිරීමක්ද සිදු වෙනවා.

ජේම්ස් එස්. මේතර් දේවගැතිතුමා මේ විධියේ සංදේශයක් මගින් ක්‍රිස්තියානි මතය ප්‍රකාශ කර තිබෙනවා:

"*New Scheme of Weekly Holidays*

The present scheme of weekly holidays is far from satisfactory. The last government introduced it in haste, and without looking at carefully all the sides of the question. I believe that this subject should be reconsidered by the new government from all points of view."

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

When was it published?

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)

This is from the "Daily Mirror" of 16.6.70, 23.6.70 and 24.5.70.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

It must be after the elections, because it makes reference to the present Government.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)

"All the time there is much confusion because the weekly holidays keep on changing every week, almost. Besides, in certain weeks, we get six working days, with the result that an extra holiday had to be declared off and on, to add to the confusion."



Then he goes on to say that what is necessary—his scheme—is that we should have the Sundays and one Poya day in the month as holidays.

මේතර් දේවගැතිතුමා කියන්නේ පූර්ව පසළොස්වක සහ ඉරිදා දිනය නිවාඩු දෙන ලෙසටයි. සතර පෝයම නිවාඩු දීම අවශ්‍ය නැති බව එතුමා කියනවා. සතර පෝය නිවාඩුව තිබෙන්නම ඕනෑ බව මා ස්ථිර වශයෙන්ම කියනවා. එහි අඩු පාඩු කම් තිබේ නම් ඒවා හරිගස්සා ගන්නවා මිස එය වෙනස් කරන්න බැ. ඉරිදා දින යත් නිවාඩු දුන් විට පෝය දවස සම්පූර්ණයෙන්ම බෞද්ධ කටයුතු සඳහා යෙදවීමට බෞද්ධයන්ට පුළුවන් වෙනවා.

සතර පෝය හා පෙර පෝයත් සම්පූර්ණ නිවාඩු දිනයක් කළ යුතුය යන මතයක් තිබෙනවා. ඊට මට දෙන්න තිබෙන උත්තරය නම්, හැම දේම තමන් පමණක් බදු නොගෙන, සතර පෝය නිවාඩු දීම සම්බන්ධයෙන් බෞද්ධයන් ඉතාම ශ්‍රද්ධාවෙන් සතුටු විය යුතු බවයි. සේවකයන් ආදී වෙනත් අය ගැනත් අපි කල්පනා කරන්න ඕනෑ. බෞද්ධ සේවකයන් මෙන්ම ක්‍රිස්තු ලබ්ධික සේවකයන් ගැනත් අපි කල්පනා කරන්න ඕනෑ. සේවකයන් වෙනුවෙන් දින 5 සතියත්, බෞද්ධයන්ට සතර පෝය නිවාඩුවත්, ක්‍රිස්තු ලබ්ධිකයන්ට ඉරිදා නිවාඩුවත් යන මේ තුන් ක්‍රමය මා යෝජනා කරන්නේ ඒ නිසායි.

උදේ 8 ට වැඩ පටන් ගැනීමෙන් මා හිතන හැටියට දැනට වඩා හුඟාක් වැඩ කෙරෙනවා. උදේ 8, 9, 10 පමණ වන තුරු හුඟාක් වැඩ කරන්නට පුළුවන් බව ගරු ඇමතිතුමාත් පිළිගන්නවා ඇති. එම නිසා මේ අලුත් වැඩ පිළිවෙළ ආරම්භ කරන ලෙස මා රජයට මතක් කරනවා. පෝය දින නිවාඩු ක්‍රමය මා කියන පිළිවෙළට සංශෝධනය කිරීමෙන් මේ වැඩ පිළිවෙළ ආරම්භ කරන්නට පුළුවනි. මා ඉදිරිපත් කරන මේ යෝජනාව අලුත් එකක් නොවෙයි. 1964 ජූලි මාසයේදී පළමුවෙන්ම මෙය ඉදිරිපත් කළේ එවකට සිටි ගරු මුදල් ඇමති ආචාර්ය එන්. එම්. පෙරේරා මහතායි. දෙවන වරට එක්සත් ජාතික පක්ෂයේ පාර්ලිමේන්තු කණ්ඩායම විසින් මෙය ඉදිරිපත් කරන්නට යෙදුණා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සතර පෝය නිවාඩුව දුන්නායින් පසු, තුන්වන වරට මේ යෝජනාව ඉදිරිපත් කළේ මායි. අවුරුදු දෙක තුනකට පසු නැවතත් මා දැන් එය ඉදිරිපත් කරනවා.

දැනට මේ නිවාඩු සම්බන්ධයෙන් තිබෙන අවුල් තත්ත්වය නැති කොට සියලු දෙනාගේම සතුටට හේතු වන හැටියට අලුත් නිවාඩු ක්‍රමය සම්මත කරන මෙන් මා රජයෙන් ඉල්ලා සිටිනවා.

අ. භා. 2.45

**ලක්ෂ්මන් ජයකොඩි මයා. (අග්‍රාමාත්‍ය, රාජ්‍යාරක්ෂක හා විදේශ කටයුතු ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
*(திரு. லக்ஷ்மன் ஜயகொடி—பிரதம அமைச்சரும் பாதுகாப்பு, வெளிவிவகார அமைச்சரும் பாராளுமன்றக் காரியதரிசி)*
(Mr. Lakshman Jayakody—Parliamentary Secretary to the Prime Minister and Minister of Defence & External Affairs)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා මෙම යෝජනාව ස්ථිර කරන අතරම මේ සම්බන්ධයෙන් වචනයක් දෙකක් කතා කරන්නත් අදහස් කරනවා. ගාල්ලේ මන්ත්‍රීතුමා කීවාක් මෙන් මෙම යෝජනාවේ පියා හැටියට සැලකිය හැක්කේ, මෙම යෝජනාවේ අත්තිවාරම දැමූ පුද්ගලයා හැටියට සැලකිය හැක්කේ, පසුගිය ආණ්ඩුව නොවන බව අප කවුරුත් දන්නවා. සිරිමාවෝ බණ්ඩාරනායක අග්‍රාමාත්‍යතුමියගේ පළමුවන රජය මේ රටේ පළමුවන වතාවට පෝය දවස, එනම්, පසළොස්වක පෝය දිනය, නිවාඩු දිනයක් බවට පත් කළා. ඊට පසු, කම්කරුවන්ගේ ශුභසිද්ධිය සඳහා දින පහේ සතියක් ඇති කළ යුතුය යන යෝජනාව ඉදිරිපත් කළේ 1964 දී මුදල් ඇමතිව සිටි ආචාර්ය එන්. එම්. පෙරේරා මහතායි.

ඊට පස්සේ මෙය දේශපාලනයට ඇදගත්තා. 1965 දී ඩඩ්ලි සේනානායක අගමැතිතුමාගේ ආණ්ඩුව පිහිටුවන්නට පෙර එක්සත් ජාතික පක්ෂය මෙය ඡන්ද ගුණ්ඩුවක් හැටියට ඉදිරිපත් කළා. ඒ ඡන්ද ගුණ්ඩුවට මා හිතන්නේ ලිතත් ඇතුළත් කර තිබුණා. හතර පෝයම නිවාඩු දිනයන් බවට පත් කරනවායයි එදා කිව්වා. ඒක මා විස්තර කරන්නේ කොළේ වහලා ගහපු ගැහිල්ලක් හැටියටයි. කොයිම අවස්ථාවකදීවත් ඉරිදා නිවාඩුව නැති කරනවායයි කිව්වේ නැහැ.

එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ වූ ආණ්ඩුවක් 1965 දී ඇති වුණා. පෝය දින නිවාඩු කිරීමේ පනතක් ඉදිරිපත් කළා. එය ඉතිහාසගත වන පනතක්. ඒ පනත ගැන කවුරුවත් කථා කෙළේ නැහැ. පනත ඉදිරිපත් කළ ඇමතිවරයා, අපේ ගරු ගාල්ලේ මන්ත්‍රීතුමා, (ආචාර්ය දහනායක) පවා දීර්ඝ කථාවක් කෙළේ නැහැ. පෝයදා නිවාඩු කිරීමේ පනතකැයි කියා එය ඉදිරිපත් කළා. ඒ ගැන දීර්ඝ සාකච්ඡාවක් ඇති වුණේ නැහැ. කිසිම කෙනෙක් එය සාකච්ඡාවට භාජන කෙළේ නැහැ.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)
පැය හතරක පහක සාකච්ඡාවක් ඇති වුණා.

**ලක්ෂ්මන් ජයකොඩි මයා.**
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
(Mr. Lakshman Jayakody)
කමා කරන්න, එතුමාට අමතක වෙලා ඇති. එක් කෙනෙක්වත් කථා කෙළේ නැහැ කියන එකයි මගේ මතකය.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)
හැන්සාඩ් වාර්තා ගෙනැවිත් පෙන්වන්නම්. බර්නාඩ් සොයිසා මන්ත්‍රීතුමාත් පැය භාගයකටත් වඩා කථා කළා.

**ලක්ෂ්මන් ජයකොඩි මයා.**
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
(Mr. Lakshman Jayakody)
ඒ කථා කෙළේ කාරකසභා අවස්ථාවේදී. පනතේ තිබුණු යම් යම් වැරදි පෙන්වා දෙන්නටයි එසේ කෙළේ. ඒ කොයි හැටි වෙතත්, මුල් වරට නැත්නම් දෙවැනි වර කියවීමේ විවාදයේදී කථා කෙළේ නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ටී. බී. හේරත් මයා.**
*(திரு. ரீ. பி. ஹேரத்)*
(Mr. T. B. Herath)
කොළේ වහලා.

**ලක්ෂ්මන් ජයකොඩි මයා.**
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
(Mr. Lakshman Jayakody)
කොළේ වහලා ගැහුවා. මේ යෝජනාවට රසවත් ඉතිහාසයක් තිබෙනවා. මා මේ යෝජනාව ස්ථිර කරන්නේ එක් වැදගත් හේතුවක් උඩයි. මෙය රජයේ විශේෂ සැලකිල්ල යොමු විය යුතු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. ඒ සම්බන්ධයෙන් රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිතුමාගේ ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා පිළිතුරු දෙනවා ඇති.

මේ යෝජනාව වැදගත්ම වෙලා තිබෙන්නේ වෙළඳාම සම්බන්ධයෙනුයි. විදේශීය වෙළඳාම සම්බන්ධයෙන් මෙය ඇත්ත වශයෙන්ම ලොකු ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. අපේ විදේශීය වෙළඳාම මේ තරම් පහත් තත්ත්වයකට වැටී තිබෙන්නේ වෙන කිසිම හේතුවක් නිසා නොව මේ අදූරදර්ශී පියවර නිසයි. පසුගිය රජය ගත් අදූරදර්ශී පියවර නිසා එවැනි තත්ත්වයක් ඇති වූ බව පිළිගත යුතුව තිබෙනවා. ඔය පෝය නිවාඩුවේ තිබෙන පරස්පර විරෝධී තත්ත්වය නිසයි, අපේ විදේශ වෙළඳාම සියේට 35 කින් අඩු වෙලා තිබෙන්නේ. මෙය සෙල්ලමක් නොවෙයි. ලංකාවෙන් කේබල් පණිවුඩයක් පිට රටකට යවන විට සමහර විට එය ඒ රටේ නිවාඩු දිනයක් විය හැකියි. එසේ නැත්නම් පිටරටකින් මේ රටට කේබල් පණිවුඩයක් ලැබෙන විට සමහරවිට ඒ දවස මේ රටේ නිවාඩු දවසක් වෙන්නට පුළුවනි. එවැනි තත්ත්වයක් ඇති වුණාම වෙළඳ ගනුදෙනු ඇති වන්නේ නැහැ. අවසානයේදී වෙළඳ ගනු දෙනුවක් කරන්නට කොයි තරම් බලාපොරොත්තුවක් තිබුණත් අපට එය කරන්නට ලැබෙන්නෙ නැහැ. ඒ නිසා මේ ප්‍රශ්නය ගැන ටිකක් කල්පනා කරන්නට සිද්ධ වෙලා තිබෙනවා. වෙළඳ ගනුදෙනු ප්‍රශ්නය උඩ මෙය වෙනස් කළ යුතුද නැද්ද යන්න ගැනත් කල්පනා කරන්නට ඕනෑ.

එවකට ආහාර හා කෘෂිකර්ම ඇමතිවරයා වශයෙන් සිටි ෆිලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක මැතිතුමා මේ සම්බන්ධයෙන් හොඳ යෝජනාවක් ඉදිරිපත් කළා මට මතකයි. එය ඉතාමත් සාරවත් යෝජනාවක්. එය ක්‍රියාත්මක කරන්නට පුළුවන් වේද බැරිවේද යන්න ප්‍රශ්නයක් වෙලා තිබෙනවා. එහෙත් මා හිතන්නේ එය ඉතාමත් වැදගත් යෝජනාවක් හැටියටයි. එතුමාගේ යෝජනාව ක්‍රියාත්මක කළොත් සතියේ දවස් හතම වැඩ කරන දවස් වෙනවා. එහෙත් ඕනෑම කෙනෙකුට දවස් එකහමාරක් නිවාඩු ගන්නට පුළුවනි. ගාල්ලේ ගරු මන්ත්‍රීතුමාට ඒ යෝජනාව තේරෙනවද දන්නෙ නැහැ. සතියේ දවස් හතම වැඩ කරන දවස් වුණාම ඕනෑම් කෙනෙකුට සතියකට දවස් එක හමාරක් නිවාඩු ගතහැකියි. එතකොට, බෞද්ධයෙකුට පෝයදාත් ඊට පෙරදා වරුවකුත් නිවාඩු ගන්නට පුළුවනි. කතෝලික කෙනෙකුට ඉරිදාත් ඊට පෙරදා වරුවකුත් නිවාඩු ගත හැකියි. මුස්ලිම්වරුන්ට—තමුන්නාන්සේටත් එක්කයි—සිකුරාදාත් ඕනෑ නම් ඊට පෙරදාත් නිවාඩු ගන්නට බැරිකමක් නැහැ. මඟුලක්, ඉලව්වක් තිබෙනවා නම් ඒ ගැන සැලැස්ම හදාගෙන දවස් එකහමාරක නිවාඩුවක් ගත හැකියි. ප්‍රීතිදායක කටයුතුවල යෙදීම සඳහා වුවත් එම නිවාඩුව ලබා ගන්නට පුළුවනි. හැබැයි, උසාවිය පැවැත්විය යුත්තේ කෙසේද, පාඨශාලා පැවැත්විය යුත්තේ කෙසේද යන ප්‍රශ්න මතු වුණා. පාඨශාලා පිළිබඳ ප්‍රශ්නයේදී, ඒ ඒ ආගමික වතාවත්වල යෙදෙන ආකාරය අනුව ගුරු දෙගුරු සමිතිවල තීරණයන්ට එකඟව එම කටයුතු කළ යුතු බවයි දොම්පේ ගරු මන්ත්‍රීතුමා කිව්වේ.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
මන්ත්‍රීවරු ඡන්ද කොට්ඨාශවලට යන්නේ කවදාවද?

**ලක්ෂ්මන් ජයකොඩි මයා.**
*(திரு. லக்ஷ்மன் ஜயக்கொடி)*
(Mr. Lakshman Jayakody)
හැමදාම. ඒක නවත්වන්නට බැහැ. මා නම් කවදාවත් නිවාඩු ගන්නට සිතන්නේ

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැහැ. නිවාඩු ගන්න ජාතියක් නොවෙයි මන්ත්‍රීවරු. අපට නිවාඩු නැහැ. අපි වයින් කරපු පිරිසක්. එක්කෝටි විසි ලක්ෂයක් පමණ ජනගහණයක් සිටින සමාජයක මන්ත්‍රීවරුන් සිටින්නේ 150 ගණනයි. කෙසේ වෙතත් එය එතරම් වැදගත් ප්‍රශ්නයක් හැටියට නොසලකා ඉදිමු.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම නිවාඩු පිළිබඳ ප්‍රශ්නය කල්පනාවට ගත යුතු එකක් බව මා සඳහන් කරන්නට කැමතියි. මෙය ඉතා වැදගත් යෝජනාවක් බවද ප්‍රකාශ කරන්නට මා කැමතියි. ආගමික අතින් මෙන්ම වෙළඳ කටයුතු අතින් ද කම්කරුවන්ගේ පැත්තෙන් ද මේ පිළිබඳව සිතා බැලිය යුතුයි. කවුරු කෙසේ කිව්වත් උෂ්ණ කලාපික රටවල උදවියට සතියකට දවස් පහමාරක් වැඩෙහි යෙදෙන්නට අමාරුයි. දිනකට පැය අටක් වැඩ කිරීමටත් නොහැකියි. එය සෞඛ්‍යයට අහිත කරයි. පැය අටක් වැඩ කරන්නට තරම් මිනිසුන්ට ශක්තියක් ඇත්තේ නැහැ. මෙම සභා ගර්භය වැනි වායු සමීකරණය කළ තැන්වලට ගියාම අපට හොඳට කතා කරන්නට පුළුවනි ; වැඩ කරන්නට පුළුවනි. එයින් පෙනෙනවා, තත්ත්වය කුමක්ද යන්න. එම නිසා ගරු නියෝජ්‍ය කථානායකතුමනි, කුමන අන්දමකට හෝ නිවාඩු පිළිබඳව වෙනසක් ඇති කිරීම ඉතා වැදගත් දෙයක් බව ප්‍රකාශ කළ යුතුව තිබෙනවා. පෝය දවස නැතිනම් ඉරිදා දවස ගැන පමණක් සිතා නිවාඩු පිළිබඳ වෙනසක් කරන්නට වුවමනායයි මා කියන්නේ නැහැ. පොදු නිවාඩු පිළිබඳව පුළුල් විධියට සිතා බලා ක්‍රියා කළ යුතුයි. දැන් අපට නිවාඩු ලැබෙන්නේ අවුරුද්දේ කුමන කාලයේදී ද? අද අපි නිවාඩු සම්බන්ධයෙන් අනුගමනය කරන්නේ එංගලන්තයේ ඉංග්‍රීසි ක්‍රමයයි. පාඨශාලාවලත් ඒ අන්දමටයි. අපේ රටේ පරිසරයට සරිලන අන්දමට අපි තවම අපේ නිවාඩු ක්‍රමය සකස් කර ගෙන නැහැ. එසේ හෙයින් මෙම ප්‍රශ්නය ගැන පුළුල් විධියට කල්පනා කළ යුතුය කියන කාරණය දැන් පැන නැගී තිබෙන නිසායි මෙවැනි යෝජනාවකට මා කැමති වන්නේ. ගරු පාර්ලිමේන්තු ලේකම්තුමා මෙම ප්‍රශ්නය ගැන වැදගත් විධියට අදහස් ඉදිරිපත් කරනවා ඇති. මම ගැන සාධාරණ විධියට කල්පනා කර බලා කටයුතු කරන ලෙස ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය අවසාන කරනවා.

ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*வினா எடுத்தியம்பப் பெற்றது.*

*Question proposed.*

අ. භා. 3.53

**අගුස්තීනු පොන්සේකා මයා.** (වෙන්නප්පුව)

*(திரு. அகுஸ்தீனு பொன்சேகா—வென்னப்புவ)*

(Mr. Augustheenu Fonseka—Wennappuwa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම යෝජනාව පිළිබඳව වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්නට මා බලාපොරොත්තු වෙනවා. අද මේ රටේ නිවාඩු ප්‍රශ්නය අවුලක් බවට පත් වී තිබෙන බව කවුරුත් පිළිගන්නා දෙයක්. අද ඕනෑම කෙනෙකුගෙන් දවසේ නම කුමක්දැයි ඇසුවොත් දින පොත නොබලා කියන්නට පුළුවන් කමක් ඇත්තේ නැහැ. දිනපොත නැතිනම් ලිත නොබලා දවස කියන්නට පුළුවන් කාටදැයි පරීක්ෂණයක් කර බැලුවොත් එම අදහස සනාථ වන අන්දමේ ප්‍රතිඵල බොහෝ සෙයින් අපට දැකගන්නට පුළුවනි. මගේ කල්පනාවේ හැටියට මේ රටේ සිටින කිසිම කෙනෙකුට හරියාකාර දවස කුමක්දැයි කියන්න ට පුළුවන්කමක් නැහැ. ගරු නියෝජ්‍ය කථානායකතුමාත් මෙම සභාවේ සිටින සෑම මන්ත්‍රීවරයෙක් මත් එය එසේම වන බවට සාක්ෂි දරනවා ඇති.

**නියෝජ්‍ය කථානායකතුමා**

*(உப சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy Speaker)

සිකුරාදා කවදාදැයි දන්නෙ නැති නිසා අපට පල්ලි යන්නත් බැරි වන අවස්ථා තිබෙනවා.

**පොන්සේකා මයා.**

*(திரு. பொன்சேகா)*

(Mr. Fonseka)

ඉරිදා දිනවල ආගමික චාරිත්‍ර පැවැත්වීම කතෝලිකයෙකු හැටියට මගේ යුතුකමයි. එහෙත් මට මේ වන විට කීප දිනක්ම එය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පොන්සේකා මයා.]

වැරදී ගොස් තිබෙනවා. ඉරිදා දවස කවදා දැයි නොදන්නාකම නිසා මගේ ආගමික වතාවත්වල යෙදෙන්නට මට නොහැකි වී තිබෙනවා. [බාධා කිරීමක්] මගේ හොඳ නරක පිළිබඳ ප්‍රශ්නය පසුව විමසා ගන්නට පුළුවනි. මගේ බයිබලයේ තිබෙන හැටියට නම් පළමුවැනි ගල ගසන්නට කිවේ පාපයක් නැති කෙනෙකුටයි. අපේ හොරොව්පතානේ ගරු මන්ත්‍රීතුමා (පී. බී. හේරත් මයා.) පළමුවැනි ගල ගසන්නට තරම් නිදහස් වී නොමැතියයි මා සිතනවා.

මේ නිවාඩුව පිළිබඳව මහා අවුලක් ඇති වී තිබෙන බව කවුරුත් පිළිගන්නවා. ඒ අවුල රටට ඇමූ ආණ්ඩුවේ—ස්වදේශ කටයුතු භාර ඇමති වශයෙන් මේ අවුලට රට දැමීමේ වගකීම භාර ගතයුතු—හිටපු ඇමතිතුමාම, ගාල්ලේ ගරු මන්ත්‍රීතුමාම (ආචාර්ය ඩබ්ලිව් දහනායක), මේ යෝජනාව ඉදිරිපත් කිරීම ගැන මා ඉතාම සතුටු වෙනවා.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)

වරදක් තිබෙනවා නම් එය පිළිගන්නට මා සැම වේලේම ලෑස්තියි.

**පොන්සේකා මයා.**
*(திரு. பொன்சேகா)*
(Mr. Fonseka)

බොහොම ස්තුතියි.

අවුරුදු පහක් තිස්සේ මේ රට සෑම පැත්තකින්ම අවුලට පත් කළා වාගේම නිවාඩු ප්‍රශ්නයේදීත් රට අවුලට දමලයි ඒ උදවිය පාලනයෙන් අහකට ගියේ. නිවාඩු ප්‍රශ්නයේ කණගාටුදායක පැත්ත ආගම ඈඳා ගැනීමයි. හොඳට හෝ වේවා, නරකට හෝ වේවා ලෝකයේ රටවල් විශාල ගණනක නිවාඩු දිනය හැටියට ඉරිදා දිනය යොදා ගෙන තිබීමත්, ඒ ඉරිදා දිනය ක්‍රිස්තියානි ලෝකයේ ආගමික දිනය හැටියට යොදා ගෙන තිබීමත් තමයි මේ ප්‍රශ්නය ගැටළුවක් බවට පරිවර්තනය කළේ.

පෝය නිවාඩු ක්‍රමය

මේ ඉරිදා දිනය ආගමික නිවාඩු දිනයක් වීමත්, ලෝක නිවාඩු දිනයක් වීමත්, දීර්ඝ ඉතිහාසයක් ඇති දෙයක්. සමහර විට ඔය නිවාඩුවේ ආරම්භය, අපේ බයිබලය අනුව, ආගමික අභිලාෂයකින් ඇති වූවා වෙන්නට පුළුවනි. නමුත් කාර්මික දියුණුවක් සමගම මේ නිවාඩුවේ පරමාර්ථය වෙනස් වුණා. එය ආගමික පරමාර්ථයක්ම වුණේ නැහැ. වැඩ කරන මනුෂ්‍යයකුට සතියකට දින එක හමාරක හෝ දෙකක විවේකයක් අවශ්‍යය, එය නැතිවම බැරි දෙයක්ය යන අදහස උඩයි, පසුව මේ නිවාඩුව මිනිසුන්ට අයිති වුණේ. යුරෝපයේ නැත්නම් ක්‍රිස්තියානි ලෝකයේ තිබුණු නිවාඩු දවස ඒ අනුව කිසිම අවුලක් නැතිව සාමාන්‍ය වැඩවලිනුත් නිදහස් නිවාඩු දිනයක් හැටියට සලකන්නට මිනිසුන් පුරුදු වුණා. මේ නිවාඩුවේ ආරම්භය—පරිණාමය—එය මිස ක්‍රිස්තියානි ලෝකයේ අවශ්‍යතාවයක් සම්පූර්ණ කිරීමම නොවෙයි.

ක්‍රිස්තියානින්—කතෝලිකයින් — තම නිවාඩු දිනය හැටියට පිළිගෙන තිබුණු ඉරිදා නිවාඩුව පසුගිය රජය විසින් අපට නැති කළත්, බොහෝ දෙනෙකුට—රාජකාරි කටයුතුවල යෙදී සිටින උදවියට පවා—සතියේ දිනයවත් හරියට තෝරා බේරා ගන්නට බැරිව ගියත්, කතෝලික ආගම අදහන සාමාන්‍ය ගම්බද කතෝලික භක්තිකයන් අද—ඉරිදා දිනවලත්—කිසිම අපහසුවක් නැතිව ආගමික වතාවත්වල යෙදෙන බව මා මේ අවස්ථාවේදී අවධාරණයෙන්ම ප්‍රකාශ කරන්නට සතුටුයි. උදේට අපට වැඩට යන්නට පුළුවනි. ඉරිදා දිනවල සවස් භාගයේ අපට දේව මෙහෙයන්වලට සහභාගි විය හැකි වන සේ අපේ සභාවල් සහ ආගමික ආයතන අවශ්‍ය විධියට කටයුතු යොදා තිබෙනවා. කවුරුත් හෝ ඉරිදා නිවාඩුව නැති කළොත් කතෝලිකයන් ආගමෙන් අහකට වෙව්විය කියා හෝ කතෝලික ආගම ඇදහීම අඩු වෙව්විය කියා හෝ බලාපොරොත්තු වුණා නම් ඒක වැරදියි. ඒ බලාපොරොත්තුව නම් ඉෂ්ට වී නැහැ.

කතෝලිකයින් හා ක්‍රිස්තියානි භක්තිකයින් තමන්ගේ ආගමික වතාවත් සඳහා ඉරිදා හැන්දෑ කාලය පාවිච්චි කරනවා. ඇත්ත වශයෙන්ම අද සිදු වී තිබෙන්නේ කුමක්ද? අද මේ පෝය නිවාඩුව සකස් වී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

තිබෙන්නේ කාටවත් තමන්ගේ ආගමික වතාවත් කර ගන්නට නොහැකි වන අන්දමටයි. කතෝලිකයින් වන අපි වැඩට යනවා. බෞද්ධ සහෝදරවරුන්ට පෝය නිවාඩුව ලබා ගෙන පස් පව්වලම යෙදෙන්නට සිදු වී තිබෙනවා. ඒ දවස ආගමික නොව මා කලින් සඳහන් කළ විධියේ වැඩවලින් විවේක ගැනීමේ දිනයක් හැටියට පරිවර්තනය වූ විට එදාට තමයි පස් පව්වල යෙදෙන්නට සිදු වන්නේ. අද මේ රටේ අයට පස් පව් කරන්නට තිබෙන එකම දවස පෝය නිවාඩු දවසයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**

*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*

(An hon. Member)

කවුරුත් එහෙම නැහැ.

**පොන්සේකා මයා.**

*(திரு. பொன்சேகா)*

(Mr. Fonseka)

මා පිළිගන්නවා. බොහොම හොඳ අය සිටිනවා. නිවාඩු දවස්වල පමණක් නොවෙයි අනිකුත් දවස්වලත් පස් පවින් වැළකී සිටින බොහොම හොඳ අය සිටිනවා. ඒ අයට අපි ආචාර කරනවා. මගේ අදහස වරද්දා ගන්න එපා. මම නැවතත් මගේ අදහස පැහැදිලි කරන්නම්.

පෝය නිවාඩුව ආගමික නිවාඩුවක් වශයෙන් සලකන්නේ නැතිව වැඩවලින් නිවාඩු දවස හැටියට සලකන අයට—දවස් 6 ක වැඩවලින් වෙහෙස වී තෙහෙට්ටු වී මහන්සි වී සිටින අයට, නිවාඩු දිනය, කාලා බීලා විනෝද වී සිටින දිනය හැටියට සලකන අයට—අද සිදු වී තිබෙන්නේ කුමක්ද කියා අපි එක එක්කෙනා තම තමන්ගේ හෘදය සාක්ෂියට එකඟව කල්පනා කර බැලුවොත් නියම උත්තරය ලැබෙනවා ඇති. එහෙම නම් ආගමික පැත්තෙන් බලා හෝ පෝය නිවාඩු ක්‍රමයෙන් බලාපොරොත්තු ඇති කර ගත් පරමාර්ථ ඉටු වුණාද නැද්ද කියා අපි ආපසු හැරී බලන එක යුතුකමක්ය කියා මා කල්පනා කරනවා. මේ පෝය නිවාඩුවෙන් බලාපොරොත්තු වූ ප්‍රයෝජනය ලැබුණාද කියා අපි ආපසු හැරී බලන්නට ඕනෑ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අපේ පළාත්වල තවම භාවිත වන්නේ ඉරිදා නිවාඩු ක්‍රමයයි. මගේ ඡන්ද කොට්ඨාශයේ පමණක් නොවෙයි වයඹ පළාතේම වාගේ පෞද්ගලික කර්මාන්ත ශාලාවල—මගේ කොට්ඨාශයේ පෞද්ගලික කර්මාන්ත ශාලා වශයෙන් උළු මෝල් හා කොහු මෝල් රාශියක් තිබෙනවා—තවම නිවාඩුව ඉරිදායි. එයට හේතුව මිනිසුන් ඉරිදාට වැඩට නොයෑමයි. අර පරණ පුරුද්දට ඒ අය ඉරිදාට ගෙවල්වලට වී සිටිනවා. ඒ නිසා ඉරිදා නිවාඩුව දෙන්නට මෝල් හිමියන්ට සිදු වී තිබෙනවා. රටේ කම්කරු නීතිරීති වලට එය කොතරම් දුරට එකඟද කියා මා දන්නේ නැහැ. කම්කරු දෙපාර්තමේන්තුවේ පරීක්ෂකවරුන් ඕවා බලනවාද නැද්ද කියාවත් මා දන්නේ නැහැ. ඔයිටත් වඩා බලන්නට දේවල් අපේ ප්‍රදේශවල තිබෙනවා. අද රැස්වීම අවසානයේදී ඒ පිළිබඳව මේ ගරු සභාවේ අවධානය යොමු කිරීමට මා බලාපොරොත්තුවෙන් සිටිනවා. ඒ කෙසේ වෙතත් මගේ ඡන්ද කොට්ඨාශයේ නම් රජයේ නොවන හැම තැනකම තවම පාවිච්චි වන්නේ ඉරිදා නිවාඩු ක්‍රමයයි. එයින් අපි කිසි අවුලක් ඇති කර ගෙන නැහැ. අපේ කොට්ඨාශවල හැම කෙනෙක්ම බොහොම හොඳට කටයුතු කරනවා. මගේ කොට්ඨාශය සියයට 70ක් පමණම කතෝලික ජනයා වාසය කරන කොට්ඨාශයක්. මා මීට කලිනුත් එය මේ ගරු සභාවේදී කියා තිබෙනවා. සියයට 30ක් පමණ බෞද්ධ සහෝදරවරුන් සිටිනවා. ඒ අය අපටත් අපේ පක්ෂයටත් ඉතාම හිතවත්ව කටයුතු කරනවා. කිසිම ආගමික ගැටළුවක් ප්‍රශ්නයක් අපේ කොට්ඨාශවල නැහැ.

මේ නිවාඩු ප්‍රශ්නය අපි ආගමික පදනමින් ටිකක් අහකට වී කල්පනා කළ යුතු බවට අවශ්‍ය ප්‍රමාණයටත් වඩා සාධක අපේ උප ඇමති දිවුලපිටියේ ගරු මන්ත්‍රීතුමා (ලක්ෂමන් ජයකොඩි මයා.) ඉදිරිපත් කළා. රටේ දවස් පිළිබඳ ප්‍රශ්නය අවුල් වී තිබෙනවා පමණක් නොවෙයි විදේශීය වශයෙන් අපට වෙළඳ ලෝකයේ විශාල පසු බැසීමකට නැත්නම් විශාල අර්බුදයකට මුහුණ දෙන්නටත් සිදු වන තත්ත්වයකට අපි පත් වී සිටිනවා. එයත් මේ අවස්ථාවේදී කල්පනා කර බැලිය යුතු වැදගත් කාරණයක්. අන්න ඒ පිළිවෙළට කල්පනා



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පොන්සේකා මයා.]

කරන්නට ඕනෑ. මේ කර තිබෙන යෝජ්නාව ඉතාම හොඳ ක්‍රමයයයි මා කියනවා නොවෙයි. මොකක් හරි අවුලක් තිබෙන බව කවුරුත් පිළිගන්නවා නම්, මේ දැන් තිබෙන ක්‍රමයෙන් ආර්ථික වශයෙන් රටට හානියක් සිදු වෙන බවත් කවුරුත් පිළිගන්නවා නම්, අපි දැන් කල්පනා කළ යුත්තේ මේ තරම් අවුල් නැති, රටට හානියක් සිදු නොවන, ක්‍රමයක් ඇති කිරීමට නැත්නම් සකස් කිරීමටයි. එවැනි හොඳ ක්‍රමයක් සකස් කර ගන්නට බැරිද කියන කාරණාව ගැනයි අපි කල්පනා කරන්න ඕනෑ. එවැනි ක්‍රමයක් ඇති කිරීම සඳහා මෙම රජයේ අවධානය යොමු කරවීම මෙම සභාවේ යුතුකමක්ය කියා මා කල්පනා කරනවා. ඒ නිසා මේ අවුලෙන් සහ ආර්ථික හානියෙන් රට බේරා ගැනීමේ පරමාර්ථය ඇතිව මේ රටේ සතිපතා නිවාඩු ක්‍රමය වෙනස් කරන්නය, සකස් කරන්නය කියා මා ඉල්ලා සිටිනවා.

ඇත්තවශයෙන්ම මේ පෝය නිවාඩුව සකස් වී තිබෙන්නේ චන්ද්‍රයා අනුවත් නොවන බවයි, අපට පෙනෙන්නෙ. චන්ද්‍රයාත් එහාට මෙහාට කිරීමෙනුයි, පෝය නිවාඩුව යොදා තිබෙන්නෙ. මා හිතන්නේ හිටපු ඇමතිතුමාට වුවමනා විධියට වෙන්න ඇති.

ආචාර්ය ඩබ්ලිව්. දහනායක
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)

ස්වදේශ කටයුතු ඇමතිතුමා විසින් පණ්ඩිතයන් හා සංඝයා වහන්සේලාගෙන් යුක්ත සභාවකට පෝය නිවාඩු දිනයන් නියම කිරීම භාර කර තිබුණා. පෝය නිවාඩු දිනයන් නියම කරන්නේ ඒ අය විසින් මිස ඇමතිතුමා විසින් නොවෙයි. එම සභාවට පංචාංග ලිත ප්‍රසිද්ධ කරන අයත්, සංඝයා වහන්සේලාත්, පණ්ඩිතවරුනුත් අයත් වෙනවා. ඒ අය එකතු වීමෙනුයි, පෝය දින නියම කළේ.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

මා හිතනවා, ගරු මන්ත්‍රීතුමාට පිළිතුරු දීමට අවස්ථාවක් ලැබේවිය කියා.



**පොන්සේකා මයා.**
*(திரு. பொன்சேகா)*
(Mr. Fonseka)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, හිටපු ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා පණ්ඩිතයින්ට වැඩක් භාර දුන්නා. දැන් ඒ පණ්ඩිතයන්ට ඒදණ්ඩේ යන්න බැරුව අතරමං වී සිටිනවා. කොහොම නමුත් චන්ද්‍රයා අනුවවත් පෝය නිවාඩු දිනයන් නියම කර නැති බව කවුරුත් කියනවා. ඒ වගේම අපටත් එය පෙනෙනවා. එහෙම නම් මා හිතන විධියට යම්කිසි දිනයක් නියම කරගෙන මෙන්න මේ දිනය තමයි, පෝය දිනය කියා කියන්න පුළුවනි. නියම විධියට චන්ද්‍රයාගේ ගමන අනුව පෝය නිවාඩු දිනයන් නියම කරන්නේ නැත්නම් ඕනෑම දිනයක් පෝය නිවාඩු දිනයය කියා ගන්න පුළුවනි. එය ඕනෑම දවසක යොදා ගන්න පුළුවනි; සඳුදා, අඟහරුවාදා, බදාදා කියන දිනවලටත් තබා ගන්න පුළුවනි. එයින් එක දිනයකට පණ්ඩිතයෙක් කියනවා නම් පෝය දිනය කියා නිවාඩු දිනය වශයෙන් එය ගන්න පුළුවනි. සති ක්‍රමයටත් එය යොදා ගන්න පුළුවනි. ඒ නිසා මා හිතන අන්දමට මෙය එක් පැත්තකින් බැලුවොත් ශාස්ත්‍රීය නැහැ. බෞද්ධ ආගමික චාරිත්‍ර වාරිත්‍ර වල හැටියට බැලුවත් චාරිත්‍රානුකූල නැහැ. එහෙම නම් මෙහෙම විකාරයක් කරන්නේ මොකටද ?

පසුගිය ආණ්ඩුව විසින් මේ විකාර නිවාඩු ක්‍රමයක් මේ රටට ඉදිරිපත් කළා. පසුගිය මැතිවරණයේදී බලයෙන් පහ වුණු ආණ්ඩුව මේ රටට මහ විශාල හානියක් කළ බව දැන් කවුරුත් පිළිගන්නවා. ඒ නිසා මා ඉල්ලා සිටින්නේ මෙම යෝජනාවෙන් ඉදිරිපත් කර තිබෙන ක්‍රමය හෝ වෙනත් ක්‍රමයක් හෝ ඇති කර මේ ඇති වී තිබෙන අවුල නැති කරන්න කියායි. ලෝකයේ කාටත් පිළිගන්න පුළුවන් විධියේ නිවාඩු ක්‍රමයක් ඇති කරන්න. ලෝකය සමග එකට ගමන් කරන්න පුළුවන් ක්‍රමයක් ගැන අපි කල්පනා කරන්න ඕනෑ. අද ලෝකය බොහොම පුංචි වීගෙන යනවා. එන්න එන්නම ලෝකයේ රට වල් එකට එකතු වෙනවා. වෙන් වන්නේ නැහැ. ඒකාබද්ධ වෙනවා. එහෙම නම් මෙවැනි පොදු ප්‍රශ්න විෂයෙහි—නිවාඩු දිනයන් නියම කිරීම

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

වැනි ප්‍රශ්න විෂයෙහි—ආගමික පරිසර යෙන් තොරව ඊට ඉහළ මට්ටමකට නැග අපි කල්පනා කරන්න ඕනෑ. මෙම නිවාඩු ප්‍රශ්නයේදී මේ සතිපතා දෙන නිවාඩුව ගැන පමණක් නොව මේ රටේ දෙන සෑම නිවාඩු දිනයක් ගැනම අපි කල්පනා කරන්න ඕනෑ. මේ රටේ ග්‍රිෂ්ම නිවාඩුවක් දෙනවා. එය දෙන්නේ ග්‍රිෂ්ම කාලයට නොවෙයි.

**ලක්ෂ්මන් ජයකොඩි මයා.**
(*திரு. லக்ஷ்மன் ஜயக்கொடி*)
(Mr. Lakshman Jayakody)

කොයි කාලයටද දෙන්න ඕනෑ.

**ෆොන්සේකා මයා.**
(*திரு. பொன்சேகா*)
(Mr. Fonseka)

තමුන්නාන්සේලා වැනි අය කොමිටියක් වශයෙන් පත් වී හෝ මේ ප්‍රශ්න ගැන කල්පනා කරන්න ඕනෑ. ග්‍රිෂ්ම නිවාඩුව දිය යුත්තේ කොයි කාලයටද කියා කල්පනා කර බලන්න ඕනෑ. අපේ පාසල් වල කිසිම කල්පනාවක් නැතුව මාස තුන කට සැරයක් නිවාඩු දෙනවා. අවශ්‍යතාවක් නැතුවයි ඒ නිවාඩු සකස් වී තිබෙන්නෙ. සමහර විට එක නිවාඩුවක් සුමාන පහකට දෙන අතර තවත් නිවාඩුවක් සුමාන දෙක කට දෙනවා. විශෙෂයෙන්ම පසු ගිය ආණ්ඩු කාලයේදි ඒ විධියට නිවාඩු දීම් කෙරුණා. ග්‍රිෂ්ම නිවාඩුවය කියා අප්‍රේල් මාසයේ සුමාන දෙකකට සීමා වුණ නිවාඩුවක් දෙනවා. ඒ කාලෙ පාසල්වල ඉගෙන ගන්න උගන්වන්න තියා නිකං ඉන්න වත් පුළුවන්කමක් නැහැ. එම නිසා නියෝජ්‍ය කථානායකතුමනි, අපේ රටේ නිවාඩු ක්‍රමය සකස් විය යුත්තේ රටේ අවශ්‍යතා අනුවයි.

**ටී. බී. එම්. හේරත් මයා. (ප්‍රවාහණ ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
(*திரு. ரீ. பி. எம். ஹேரத்—போக்குவரத்து அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி*)
(Mr. T. B. M. Herath—Parliamentary Secretary to the Minister of Communications)

සංස්කෘතිය අනුවයි.

**ෆොන්සේකා මයා.**
(*திரு. பொன்சேகா*)
(Mr. Fonseka)

බොහොම හොඳයි, සංස්කෘතිය අනුවයි. ඒ වාගේම වර්ෂා කාලය අනුවයි. වැස්ස කාලෙට අපේ දරුවන්ට පාසල්වලට යන්න බැහැ. කුඩවල මිල අනික් බඩුවල වාගේම බොහෝම ඉහළ ගිහින්. ඒ නිසා අපේ රටේ දැනට පවතින මුළු නිවාඩු ක්‍රමයම මීට වඩා හොඳ පිළිවෙළකට සකස් කරන්නට මෙම රජයේ අවධානය යොමු වේවායි කිය මින් මගේ කථාව මින් සමාප්ත කරනවා.

අ. භා. 3.15

**චන්ද්‍ර ගුණසේකර මයා. (කොට්ටාව)**
(*திரு. சந்திர குணசேகர—கொட்டாவ*)
(Mr. Chandra Gunasekera—Kottawa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙම වැදගත් ප්‍රශ්නය ගැන වචන ස්වල්පයක් ප්‍රකාශ කිරීමට මමද බලාපොරොත්තු වෙනවා. ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා විසින් මෙම යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ වැදගත් අදහස් දෙකක් ගැබ් කරලයි. වෙන්නප්පුවේ ගරු මන්ත්‍රීතුමාගේ කථා වත්, මෙම ගරු සභාවේ මතු වුණ ප්‍රශ්නත් දෙස බලන විට මේ සම්බන්ධයෙන් ගත යුතු ඉතාමත් ප්‍රඥාගෝචර පියවර නම් ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාගේ ප්‍රධානත්වයෙන්, පක්ෂ භේදයෙන් තොරව, කුමන ක්‍රියා මාර්ගයක් අනුව මේ නිවාඩු ක්‍රමය සකස් කළ යුතුද කියා කිසියම් පිරිසක් විසින් පරීක්ෂා කර බැලීමයි. යම් අදහස් දෙකක් පමණක් ගැබ් කර ඇති යෝජනාවක් මන්ත්‍රී මණ්ඩල යෙන් සම්මත කර ක්‍රියාවේ යොදවන්නට තීරණය කළොත් ඒ පිළිබඳව තවත් කොතෙකුත් අඩුපාඩු ඇති වන්නට පුළුවන්.

වෙන්නප්පුවේ ගරු මන්ත්‍රීතුමාගේ අදහසට මා ගරු කරනවා. මේ කාලය තුළ රටේ ඇති වුණ තත්ත්වය එක් දෘෂ්ටි කෝණයකින් බලන විට ඇත්ත වශ යෙන ම මෙය විශාල ආන්දෝලනයකට තුඩු දෙන්නක් වූ බව පෙනී යනවා. මට මතකයි, 1964 දී සිරිමාවෝ බණ්ඩාරනායක අගමැතිණියගේ ප්‍රධානත්වයෙන් ඇරඹුණ සභාග රජය සමයේදී මෙම පෝය දින නිවාඩු ප්‍රශ්නය මතු වුණ බව. ඒ අවස්ථා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[චන්ද්‍ර ගුණසේකර මයා.]

වෛද්‍ය ආචාර්ය එන්. එම්. පෙරේරා මුදල් ඇමතිතුමාගේ අය වැය ලේඛන කථාවේ පෝය දින නිවාඩු කිරීම පිළිබඳව කරුණු පැහැදිලි කර තිබෙනවා. ඒ සියලු ප්‍රශ්න සාකච්ඡා කර සොයා බලා වාර්තා කිරීමට කොමිටියක් පත් කරනු ලැබුවා. පුර පසළොස්වක පෝය දිනය නිවාඩු දෙනවාය කියා අය වැය කථාවෙන් ප්‍රකාශ කළාට පසුව තමයි, පුර පසළොස්වක දිනය පළමුවෙන්ම මේ රටේ නිවාඩු දිනයක් හැටියට නියම වුණේ. පෝය දින නිවාඩු දින කිරීම සඳහා පත් කරන ලද කොමිටිය විසින් ඉදිරිපත් කරන ලද වාර්තාව පෝය දින නිවාඩු දීම ගැන සම්පූර්ණ එකඟත්ව යක් ඇතිව ඉදිරිපත් කරන ලද වාර්තා වක්ද නැද්ද කියන්න මා දන්නෙ නැහැ. නමුත් මට මෙහිදී එක කරුණයි කියන්න තිබෙන්නේ. එනම් අද මෙම යෝජනාව ඉදිරිපත් කර තිබෙන්නේ පසු ගිය රජයේ සිටි ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා විසින් බවයි. ඒ ඇමතිතුමාගේ සිත තුළ මහා කුතුහලයක් ඇති වී තිබෙනවා. තමා මේ රටට විශාල අපරාධයක් කළාය කියා. පෝය නිවාඩු පිළිබඳ ප්‍රශ්නය පමණක් නොවෙයි, අනික් නිවාඩු සම්බන්ධවත් තමන්ට කරන්න තිබුණ වැඩ කොටස තමන් කෙළේ නැත කියා එතුමා තුළ විමතියක් ඇති වී තිබෙනවා.

උදේ 8 ට වැඩ පටන්ගන්නය කියා එතුමා ඉදිරිපත් කරන අදහස ඉතාම හොඳ අදහසක්. උදේ 8 ට නොවෙයි, ඇයි උදේ 7 ට වැඩ පටන් ගන්නට බැරි නියා මම අහනවා. උතුරු වියට්නාමය වැනි රටවල, නියෝජ්‍ය කථානායකතුමනි, වැඩ පටන් ගන්නේ උදේ 6.30 ටයි. දවල් 11 ට නිවාඩු දී යළිත් සවස 3 ට පටන් ගන් නවා. ඊට හේතුව මන්දැයි ඇසූ විට ඒ රටේ පාලකයන් කියන්නේ මොකක්ද? "අපි බත් කන මිනිස්සු. බත් කා පැය දෙකක් විතර විවේකය ගත්තේ නැත්නම් අපේ වැඩ කොටස හරියට කරන්නට බැරි වෙනවා. ඒ නිසා උදේ 11 ට නිවාඩු දෙනවා. ගෙවල්වලට ගොස් බත් උයාගෙන කා පිඩක් විවේක අරගෙන තමයි, සවස තුනට නැවත වැඩට එන්නේ. හැබැයි අප වැඩ පටන් ගන්නේ උදේ 6.30 ටයි." යනුවෙන් ඒ අය කියනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**

*(உப சபாநாயகர் அவர்கள்)*

(Mr. Deputy Speaker)

අපේ ඡන්ද කොට්ඨාශවල උදවිය නම් පාන්දර 5 ට අපේ ගෙවල්වලට එනවා.

**චන්ද්‍ර ගුණසේකර මයා.**

*(திரு. சந்திர குணசேகர)*

(Mr. Chandra Gunasekera)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මා පෙන්වා දෙන්නට හදන්නේ මේකයි: මෙවැනි යෝජනාවක් සම්මත කිරීමෙන් අප කරන්නේ මේ සභාවේ තීරණය මේ යයි නැවත වරක් ප්‍රකාශ කිරීම පමණයි. සමහර බෞද්ධ සංගම් සහ සමහර අවංක බෞද්ධයන් ගැන මා දන්නවා. ඒ අය බෞද්ධාගම පිළිබඳ භක්තියෙන් ආගමික කටයුතුවල පමණයි, නිරත වී සිටින්නේ. "පෝය නිවාඩුව අවාසනාවක්" යනුවෙන් ඒ අයම කියනවා මා අසා තිබෙනවා. පෝය දින හතරම එක වාගේ යයි මිනිසුන් හිතනවා. එහෙත් පුර පසළොස්වක් පෝයෙහි විශේෂත්වයක් තිබෙනවා. වෙන්නප්පුවේ ගරු මන්ත්‍රීතුමා කීවාක් මෙන් සමහරුන් සිල් සමාදන් වන්නේ නිවාඩු දිනයෙහි නොව වෙනත් දිනයකයි. කැලැන්ඩරයේ හැටියට නොවෙයි, සමහරුන් සිල් ගන්නේ. කැලැන්ඩරය අනුව පෝය දිනය එකක්. එහෙත් නියම පෝය දිනය වෙන එකක්. ඉතින් මෙවැනි කාරණා සම්බන්ධයෙන් අලුත් පියවරක් ගන්නා අවස්ථාවේදී, ඒ වාගේම අලුත් ව්‍යවස්ථාවක් සම්පාදනය කරනා අවස්ථාවේදී, අප බොහෝ දුරට කල්පනා කර බලා ක්‍රියා කළ යුතුයි.

පෝය නිවාඩුව සම්බන්ධයෙන් මේ රටේ බෞද්ධ සමිති සමාගම් ඇත් කියන දේ පිළිබඳව විමසා බැලීමට ස්වදේශ කටයුතු පිළිබඳ ඇමතිතුමාට පුළුවන්කම තිබෙනවා. අප මේවා ගැන සොයා බලන්නට ඕනෑ. පෝය නිවාඩු පරීයේෂණය සාර්ථක වුණාද නැද්දැයි සොයා බලන්නට ඕනෑ. ඒ අන්දමට කරුණු පරීක්ෂා කර බලා අප නිසි අන්දමට ක්‍රියා කරන්නට ඕනෑ. මේ ප්‍රශ්නයේ නියම තත්ත්වය ගැන කථා කරන්නට බොහෝ දෙනා භය වන්නේ එයින් දේශපාලන වශයෙන් අවාසියක් සිදු වෙතැයි සිතන නිසායි. පටු දේශපාලන වාසියක් ලබා ගැනීම සඳහා නිශ්ශබ්දව

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

සිටීමට වඩා මෙවැනි ප්‍රශ්න ගැන තම තමන්ගේ අවංක අදහස් ප්‍රකාශ කිරීම ජාතියට කරන සේවයක්. ඇත්තෙන්ම සමහර දේශපාලනඥයන් මේ පිළිබඳව යම් යම් මත දැරුවත් ඒවා ප්‍රසිද්ධියේ ප්‍රකාශ කරන්නේ නැහැ. කලින් මෙන් පූර පසළොස්වක දිනය පමණක් නිවාඩු දුන්නොත් ඒ වාගේම ඉරිදා නිවාඩුව ඇති කළොත්, ජාතික වශයෙන සියලුම ආගමික කොටස්වල සහයෝගය ඇතිව පසළොස්වක පෝය දිනය නියම වශයෙන්ම ආගමික දිනයක් හැටියට පවත්වා ගෙනයන්නට පුළුවන් වෙනවා ඇති. තැබෑරුම් වසා, මස් කඩ වසා ඒ පූර පසළොස්වක් දිනය බෞද්ධයන්ගේ ආගමික දිනයක් හැටියට හොඳ ක්‍රියාත්මක තත්ත්වයකින් පවත්වාගෙන යෑම ස්ථිර කර ගන්නට පුළුවන් වෙනවා ඇති. එහෙත් මේ පිළිබඳව බොහෝ දෙනා තම අදහස් ප්‍රකාශ කරන්නට භයයි. පටු දේශපාලන වාසිය ගැන සැලකීම ඊට හේතුවයි. ඒ නිසා අප මේ ප්‍රශ්නය ගැන හොඳින් කල්පනා කර අවංකව ක්‍රියා කළ යුතුයි. ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා විසින් මෙම යෝජනාව ඉදිරිපත් කරනු ලැබීම ගැන එතුමාට ස්තුතිවන්ත වෙනවා. ඉතින් මේ යෝජනාව සම්මත කර ගෙන අයින් වීමෙන් පමණක් වැඩක් සිදු වෙනවාද? ඇයි අපට උදේ 7 ට වැඩට එන්නට බැරි?

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)

තමුන්නාන්සේ අතුරු යෝජනාවක් ඉදිරිපත් කරනවද?

**චන්ද්‍ර ගුණසේකර මයා.**
*(திரு. சந்திர குணசேகரா)*
(Mr. Chandra Gunasekera)

නෑ. අතුරු යෝජනාවක් ඉදිරිපත් කරන්නේ නෑ. මා ඉදිරිපත් කරන්නේ මගේ අදහසයි. අප කා තුළත් මේ සම්බන්ධයෙන් අදහස් තිබෙනවා. ගාල්ලේ මන්ත්‍රීතුමා (ආචාර්ය ඩබ්ලිව්. දහනායක) වාගේම මෙම කාරණය සම්බන්ධයෙන් නොයෙක් නොයෙක් විධියට කල්පනා කරන අය නොයෙකුත් පක්ෂවල ඉන්නවා. එම නිසා මෙය දේශපාලන ප්‍රශ්නයක් බවට පෙරලීමෙන් ඇති වැඩක් නැහැ. සමහරුන් තුළ විශ්වාසයක් තිබෙනවා, ඉරිදා දිනය වෙනුවට පෝය දිනය නිවාඩු දිනයක් කිරීම නිසා ආර්ථික වශයෙන් රටට පාඩුවක් සිදු වුණාය කියා. කෙසේ වෙතත්, පෝය දින නිවාඩුව ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගන්නා නිසා, එයින් ඇති වන ආදීනව ගැන—වාසි හෝ පාඩු ගැන—සොයා බැලීම පිණිස කාරක සභාවක් පත් කර, එහි නිර්දේශයන් අනුව ක්‍රියා කිරීම සුදුසු බවට තර්කයක් එදා යටියන්තොට මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කරනු ලැබුවා. ඇත්ත වශයෙන්ම ප්‍රතිපත්තියක් වශයෙන් පිළිගත් නිසයි එවකට තිබුණු ආණ්ඩුව පූරපසළොස්වක් දිනය නිවාඩු දිනයක් වශයෙන් ප්‍රකාශයට පත් කළේ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසුගිය රජයේ ස්වදේශ කටයුතු භාර ඇමති වරයා වශයෙන් පත්ව සිටි ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා පෝය දින නිවාඩු සම්බන්ධයෙන් සෑහෙන අත්දැකීමක් ලබා ගැනීමට අවකාශ සලසා දුන්නා. හොඳයි, අප අවංකව සොයා බලමු, මොන තත්ත්වයක්ද ඒ සම්බන්ධයෙන් රටේ තිබෙන්නෙ කියා. දේශපාලන වශයෙන් ලැබෙන වාසි හෝ අවාසි ගැන නොතකා, ජාතික වශයෙන් ආර්ථික වශයෙන් අප රටේ දියුණුව සඳහා එය කොතෙක් දුරට බලපා ඇද්දයි අවංකවම සොයා බලමු. ඇත්ත වශයෙන් මෙය නිෂ්පාදන ප්‍රශ්නය හා ආර්ථික ප්‍රශ්නය යන ප්‍රශ්න දෙකම ගැබ්ව ඇති කාරණයක්. අප වැඩ කරන්න ඕනෑ. වැඩ කරන පැය ගණන් ගැන නියමයක් ඇති කරගන්න ඕනෑ. නිවාඩු ලබා ගැනීමට කැමැත්තක් දක්වන්නේ කවර දිනයන් හිදිද කියා සොයා බලන්න ඕනෑ. එම නිසා ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා විසින් ඉදිරිපත් කර ඇති යෝජනාව පිළිගැනීම හෝ ප්‍රතික්ෂේප කිරීම නොවෙයි, මෙහිදී කළ යුතුව තිබෙන්නෙ. කළ යුතුව තිබෙන්නෙ අද තිබෙන තත්ත්වයේ හැටියට, ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාගේ ප්‍රමුඛත්වයෙන්, රටේ විවිධ සංවිධානවලින්, ජනතාවගෙන් කරුණු විමසා බලා, මෙම ප්‍රශ්නය සම්බන්ධයෙන් රටට නිසි මග පෙන්වීමක් කිරීම බව අවසාන වශයෙන් මතක් කරමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.



Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

අ. භා. 3.22

**පී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පෝය නිවාඩුව සම්බන්ධයෙන් ගාල්ලේ මන්ත්‍රීතුමා අලුත් යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා. පසුගිය අවුරුදු පහ තුළ එතුමා අයත්ව සිටි හත් හවුල් ආණ්ඩුව මෙම ගරු සභාව තුළදීත්, රට පුරාත් ප්‍රචාරයක් ගෙන ගියා, පෝය නිවාඩු හතර නිවාඩු දින කළ එකම ආණ්ඩුව ඩඩ්ලි සේනානායක මහතාගේ ආණ්ඩුවය කියා. දවුල් ගැහැව්වා; උත්සව පැවැත්වූවා; පෙරහැර ගියා; කැවුම් කිරිබත් කෑවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

හාමුදුරුවරුත් මැරුවා.

**පී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

අවුරුදු පහකට පස්සෙ, මැතිවරණයෙන් පරාජයට පත් වුනාට පස්සෙ, ගාල්ලේ මන්ත්‍රීතුමා ආපසු හැරී බැලුවා, තමන් කළ වැරදි මොනවාද කියා. ඒ වැරදිවලින් ගැළවෙන්න දරන පළමුවන උත්සාහය වශයෙන් මෙම නගින දෙගින කාලයේදී මෙබඳු යෝජනාවක් ඉදිරිපත් කර තිබෙනවා.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)

මගේ කථාවේදී මා පැහැදිලි කළා, 1968-69 කාලයේදී මෙම අදහස කැබිනට් මණ්ඩලයට ඉදිරිපත් කළ බව. මගේ කථාවට තමුන්නාන්සේ ඇහුම්කන් දුන්නෙ නැහැ.

**පී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

මා කැබිනට් මණ්ඩලයේ සිටියෙ නැහැ නෙ?

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)

සිටපු නැති නිසා තමයි කිව්වෙ.

**පී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

කැබිනට් මණ්ඩලය ප්‍රතික්ෂේප කළාද නැද්ද කියන කාරණය, කැබිනට් මණ්ඩලයෙ සිටියෙ නැති නිසා අපට පිළිගන්න පුළුවන්කමක් නැහැ.

**ගරු ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක (රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති)**
*(கௌரவ பீலிக்ஸ் ஆர். டீ. பண்டாரநாயக்க—பொது நிர்வாகம், உள்ளூராட்சி, உள்நாட்டு அலுவல்கள் அமைச்சர்)*
(The Hon. Felix R. D. Bandaranaike—Minister of Publ c Administration, Local Government and Home Affairs)

ඇයි තමුන්නාන්සෙ ඉල්ලා අස් වුණේ නැත්තෙ?

**පී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

තමුන්නාන්සේට තිබුණා, කැබිනට් මණ්ඩලය එය ප්‍රතික්ෂේප කළා නම් ඉල්ලා අස්වෙන්න. තමුන්නාන්සෙත් අවසාන යුගයෙදි වැනි වැනී තමයි සිටියෙ. තමුන්නාන්සේට තිබුණා, අබේගුණවර්ධන සම්බන්ධයෙන් අවුල් පැන නැඟුණු වේලාවේදී එළියට බහින්නට. තමුන් වෙනත් මාර්ගයකින් ප්‍රශ්න විසඳන නිසා එළියට බැස්සෙ නැහැ. ඇත්ත තත්ත්වය ඒකයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මතක් කළ යුතු ඇත්තක් තිබෙනවා. හුඟක් දෙනකුට තමන් බලයේ සිටියදී තමන් කළ වැරදි ගැන, තමන් ජනතාවට ගැසූ පහරවල් ගැන මතක් වෙන්නෙ බලයෙන් පහ වුණාට පස්සෙයි. ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය ඩබ්ලිව්. දහනායක) තමා දේශපාලනය පටන් ගත් තැන මතක් කර ගන්නවා නම් මීට වඩා වැදගත්

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යෝජනා මේ ගරු සභාවට ඉදිරිපත් කරනවාට කිසිම සැකයක් නැහැ. එතුමා මේ යෝජනාව ගෙනැවිත් තිබෙන්නේ පසුගිය අවුරුදු පහ ගැන පමණක් කල්පනා කර බලායි. ජාතික රජය යනුවෙන් තමන්ම හඳුන්වා ගත් පසුගිය හත් හවුල් රජයේ ස්වදේශ කටයුතු භාර ඇමතිවරයා වශයෙන් පෝය නිවාඩු ක්‍රමය ඉදිරිපත් කරමින් එය තම රජයෙන් කෙරුණු පළමුවැනි වැදගත් වැඩය හැටියට මහ ඉහළින් වර්ණනා කළ ගාල්ලේ ගරු මන්ත්‍රීතුමාම ඒ පෝය නිවාඩු ක්‍රමය ක්‍රියාවේ යෙදෙන හැටි වැරදියයි දැන්—එතුමා අද කළ කථාව අනුව පසුගිය රජය පැවති කාලයේදීම—පිළිගෙන තිබෙනවා. තම පරණ සගයන්ගෙන් අයින් වී අළුත් සගයන් ළං කර ගැනීම සඳහා අළුත් වැඩ පිළිවෙළක් ඉදිරිපත් කිරීමට එතුමා පෙළඹීම ගැන අප පුදුම වන්නේ නැහැ. එතුමා ළඟ හැම දාමත් ඉන්නේ අළුත් උදවියයි. එතුමාගේ මේ යෝජනාව නිසා එතුමාට තවත් අළුත් මිත්‍රයන් ඇති වෙනවා නම් අප කොහෙත්ම ඊට ඊර්ෂ්‍යා කරන්නේ නැහැ.

ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා පසුගිය හත් හවුල් රජයේ ස්වදේශ කටයුතු භාර ඇමතිවරයා වශයෙන් ඉදිරිපත් කොට ක්‍රියාත්මක කළ පෝය නිවාඩු ක්‍රමය ගැනත් යමක් කියන්නට ඕනෑ. එවකට ස්වදේශ කටයුතු භාර ඇමතිවරයාව සිටි වර්තමාන ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා. පෝය නිවාඩුව ක්‍රියාත්මක කිරීම සඳහා උපදෙස් දීමට නායක ස්වාමීන් වහන්සේලාගෙන් සමන්විත පණ්ඩිත සභාවක් පත් කළා. එහෙත් එතුමාට බැරි වුණා, ඇත්ත වශයෙන්ම සිල් පෝයට පෝය නිවාඩුව ලැබෙන විධියට ඒ නිවාඩු ක්‍රමය සකස් කරන්නට. එතුමන්ලා පෝය නිවාඩුව දුන්නේ සිල් පෝයට නොවෙයි.

**කේ. වයි. එම්. විජේරත්න බණ්ඩා මයා.** (සොරනාතොට)
*(திரு. கே. வை. எம். விஜேரத்ன பண்டா—சொர்ணதொட்ட)*
(Mr. K. Y. M. Wijeratne Banda—Soranatota)

පිට්ටාව දන්නේ නැහැ.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

පිට්ටාව කියන්නේ මොකක්දැයි දැනුත් කල්පනා කරනවා වන්න පුළුවනි.

පසුගිය හත් හවුල් රජය අවුරුදු 5ක් තිස්සේ කළ වැරදි වැඩ නිසා රටට ඔවුන්ගේ පෝය නිවාඩුව එපා වුණු බව ඇත්ත. පෝය දවස වැඩියෙන් පව් කරන දවසක් බවට පත් වී ඇතැයි වෙන්නප්පුවේ ගරු මන්ත්‍රීතුමා (අගුස්තීනු පොන්සේකා මයා.) කීවා. ඊටත් වගකියන්නට ඕනෑ, හිටපු ස්වදේශ කටයුතු භාර ඇමතිවරයාමයි. පෝය දවස නිවාඩු දවසක් බවට ප්‍රකාශයට පත් කළාට මදි. එදින ආගමික වතාවත් කෙරෙන විධියේ වැඩ පිළිවෙළකුත් සකස් කරන්නට ඕනෑ. 1960 දී බලයට පත් වුණු අපේ රජය පුර පසළොස්වක දිනය නිවාඩු දිනයක් බවට පත් කළා. එසේම ඒ පෝය දවස්වල බෞද්ධ පාඨශාලා ශිෂ්‍ය ශිෂ්‍යාවන් සිල් ව්‍යාපාරවල යෙදවීමේ වැඩ පිළිවෙළකුත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවෙන් සකස් කෙරුණා. එහෙත් 1965/1970 අතර කාලය තුළදී පෝය දිනවල ළමුන් සිල් ව්‍යාපාරවල යෙදවෙනු වෙනුවට ශ්‍රමදාන වැඩවල හා මැති ඇමතිවරුන් පිළිගැනීමේ වැඩවල යෙදවුණා. එපමණක් නොව පෝය දිනයේ ආගමික ස්වරූපය විනාශ වන දේවල් පවා කරන්නට පසුගිය හත් හවුල් රජය මැළි වුණේ නැහැ. හිටපු ස්වදේශ කටයුතු භාර ඇමතිතුමා එක පැත්තකින් පෝය දිනය රජයේ නිවාඩු දිනයක් බවට පත් කළ අතර අනෙක් පැත්තෙන් මත් පැන් වඩවඩාත් ප්‍රචාරය කිරීමට කළ හැකි හැම දෙයක්ම කළා. වැඩියක් තබා සීඝ්‍රගාමී දුම්රියවල හා ප්‍රධාන දුම්රියපොළවල පවා මත්පැන් විකිණීමට ඉඩකඩ ලැබෙන වැඩ පිළිවෙළක් ඇති කළා. මිනිසුන්ට දුෂ්චරිතයේ යෙදීමට අවශ්‍ය දේවල් එක් අතකින් ලබා දෙමින් අනෙක් අතින් පුහු ඝෝෂාවක් කළා, හතර පෝයම නිවාඩු දිනයන් බවට පත් කළාය කියා.

පෝය දිනය මේ රටේ බහුතර ජනතාවගේ ආගමික දිනයයි. එසේම ඉරිදා දිනය තවත් කොටසකගේ ආගමික දිනයක් වන අතර සිකුරාදා දිනය වෙනත් කොටසකගේ ආගමික දිනයක්. එවැනි ආගමික

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ටී. බී. එම්. හේරත් මයා.]

දිනයක් නිවාඩු දිනයක් කරනවා නම් එදින ආගමික පරිසරයට ගැළපෙන සංස්කෘතික දිනයක් කරන ලෙස සංස්කෘතික ඇමතිතුමාට කියන්නට ඕනෑ. එසේම මෙවැනි ආගමික දින නිවාඩු දින කිරීම සම්බන්ධයෙන් මහජන අදහස් උදහස් ලබා ගැනීමට හැකි වන සේ ඒ වෙනුවෙන් කමිටුවක් පත් කරන ලෙස කොට්ටාවේ ගරු මන්ත්‍රීතුමා (චන්ද්‍ර ගුණසේකර මයා.) කළ යෝජනාවට මාත් එකඟ වෙනවා. එවැනි කොමිටියක් මඟින් ලබා ගන්නා මහජන අදහස් උදහස් අනුව නිවාඩු ක්‍රමයක් සකස් කරනවා නම් එයින් රජයටත්, මහජනතාවටත් ඉමහත් ප්‍රයෝජන සැලසෙනවාට කිසිම සැකක් නැහැ. එසේ නැත්නම් අපි උඩින් කොච්චර නීති පැනෙව්වත් ඒවා යටින් ක්‍රියාත්මක වෙන්නෙ වෙනත් ආකාරයකටයි. ඒවා ක්‍රියාත්මක වෙන්නෙ මේ ගරු සභාව හිතන ආකාරයට නොවෙයි. සමහරවිට උසාවිවල තීන්දු දෙන්නෙ අප හිතන ආකාරයට නොවෙයි. නීති හදන උදවිය හිතන ආකාරයට නොවෙයි; උසාවි තීන්දු දෙන්නෙ උසාවි හිතන ආකාරයටයි; කඩුකාරවරුන් හිතන ආකාරයටයි. ඒවා මහජනයා තේරුම් ගන්නෙ ඔවුන්ට තේරුම් යන ආකාරයටයි. ක්‍රියාවේ යෙදෙන්නේ නිලධාරීන්ට වුවමනා ආකාරයටයි. තත්ත්වය එහෙම නම් මේ වගේ රටට බලපාන වැදගත් නීති හදන අවස්ථාවලදී අප ඒවා ගැන ජනතාවගෙන් විමසන්නට පුරුදු වෙන්ට ඕනෑ. දැන් එහෙම නැහැ. අපි උඩින් ඔක්කොම හරිගස්සාගෙන ගිහින් ජනතාවට බලහත්කාරයෙන් පොවන්නට යනවා "මේක කරන්න" කියා. එහි ප්‍රතිවිපාක වශයෙන් තමයි අද මේ වගේ තත්ත්වයක් ඇති වී තිබෙන්නේ.

සමහරුන් කියනවා, පෝය නිවාඩු ක්‍රමය නිසා ජාත්‍යන්තර කටයුතුවලදී අපට ලොකු පහරක් වැදී තිබෙනවාය, අපට පෝය දින නිවාඩු වුණත්, ලෝකයේ අනික් රටවල නිවාඩු යෙදී තිබෙන්නේ ඉරිදාටය, කියා. ඇත්ත වශයෙන්ම එහෙම වෙන්නට පුළුවන්. සමහරවිට අපේ රටේ කන්තෝරු අමාත්‍යාංශ, ප්‍රධාන කාර්යාල ආදිය වසා තිබෙන නිසා පෝය



දිනවල ආරංචි ලබා ගැනීම ආදියට අමාරුකම් ඇතිවන්නට පුළුවනි. ඒ නිසා සමහර විට පාඩු සිදුවන්ටත් ඉඩ තිබෙනවා.

පෝය නිවාඩු ක්‍රමය ඇති කිරීමෙන් අප බලාපොරොත්තු වූ තරම් සෑහෙන ප්‍රයෝජනයක් ලැබී නැති බවත් ඇත්තයි. එහෙත් දැන් කාටවත් ආපසු ගමන් කරන්න බැහැ. දී තිබෙන නිවාඩුව නැති කරන්න යයි යෝජනා කරන්ට කාටවත් බැහැ. එහෙම කළොත් රටේ ජනතාවගෙන් ලොකු උද්ඝෝෂණයක් එනවා. ඒ නිසා තමයි, ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය දහනායක) එක කකුළක් පෝය නිවාඩුව උඩින් තබාගෙන පෝය දින එක් නිවාඩු දිනයක් විය යුතුයි, ඉරිදා දිනය අනික් නිවාඩු දිනය විය යුතුයි කියා යෝජනා කළේ. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මෙහිදී සැලකිල්ලට ගත යුතු වැදගත් කරුණක් තිබෙනවා. මේ රටේ සිටින ලක්ෂ සංඛ්‍යාත කම්කරු ජනතාවගේ ප්‍රශ්න ගැනත් මේ සමගම අපි කල්පනා කරන්නට ඕනෑ. මේ යෝජනා කරන අන්දමට නිවාඩු දෙන්ට ගියොත් ඒ දින දෙක ලැබෙන්නේ දෙවතාවකටයි. එක ළඟ ලැබෙන්නෙ නැහැ. එක ළඟ දින දෙකක් ලැබෙනවා නම් ඒ අයට වැඩි ප්‍රයෝජනයක් තිබෙනවා.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

සුමාන 23 කදී ඒ දවස් 2 එක ළඟ යෙදෙනවා.

**ටී. බී. එම්. හේරත් මයා.**
*(திரு. ரீ. பி. எம். ஹேரத்)*
(Mr. T. B. M. Herath)

ඉදල හිටල එහෙම වෙයි. තමුන්නාන්සේ ඔය කියන්නේ 1969 අවුරුද්ද ගැන හිතලයි. එහෙත් හැමදාම එහෙම වෙන්නෙ නැහැ. පෝය වෙනස්. ඉරිදා වෙනස්. සමහරවිට ඉරිදා දිනයත් පෝය දිනත් එක දවසෙම යෙදෙනවා. ඉරිදා සතියට දවස් 7යි. ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා ස්වදේශ කටයුතු ඇමති වශයෙන් සිටි කාලයේ සමහර සතිවලට දින 9 කුත්, තවත් සමහර සතිවලට දින 8 කුත් තිබුණා. ඇතැම් අවස්ථාවල කතුරක් අර ගෙන සමහර සතිවල වරුවක් කපන්නටත් එතුමාට සිදු වුණා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ගරු මන්ත්‍රීවරයෙක්**
(கௌரவ அங்கத்தவர் ஒருவர்)
(An hon. Member)
සමහරවිට හැමදාම නත්තලුත් තිබුණා.

**ටී. බී. එම්. හේරත් මයා.**
(திரு. ரீ. பி. எம். ஹேரத்)
(Mr. T. B. M. Herath)
ඔව්. කම්කරු ජනතාවට ඔවුන්ගේ නිවාඩුව එක ළඟ ලබා ගැනීමට පුළුවන් ක්‍රමයක් ඇති කරනවා නම් මීට වඩා ප්‍රයෝජනවත් වෙයි. මේ වගේ හදිසි සාකච්ඡාවකදී මෙන්න මේ ආකාරයට එය සිදු විය යුතු යයි විස්තර කරන්නට මා ලැහැස්ති නැහැ. ඒහෙත් කල්පනා කර බලා ඒ විධියේ ක්‍රමයක් සකස් කරන්ට පුළුවන් කමක් තිබෙනවා නම් වැඩ කරන ජනතාවට ඒක ලොකු වාසියක්.

මේ අවසථාවේදී කම්කරු ඇමතිතුමා විසින් ඉදිරිපත් කර තිබුණු යෝජනාවක් මට මතක් වෙනවා. එය පිළිගෙන තිබෙන වාදැයි මා දන්නෙ නැහැ. මහජනයාට නිවාඩු තිබෙන වෙලාවල කඩ සාප්පු ආදිය විවෘත කර තබන්නට ඕනෑ. ලෝකයේ බොහෝ රටවල එහෙමයි. රාත්‍රි හත-අට වනතුරු කඩයකට, සාප්පුවකට ගිහින් තමන්ට වුවමනා බඩු මුට්ටු ගන්නට සමහර රටවල ජනතාවට අවස්ථාව තිබුණත් අපේ රටේ ඒ විධියේ අවස්ථාවක් නැහැ. අපේ රටේ කාර්යාල වසන වේලාවට සාප්පුත් වහනවා. ඒ නිසා කම්කරු ඇමතිතුමා යෝජනා කර තිබුණා, කාර්ය මණ්ඩල දෙකක් යොදවා කඩ සාප්පු පැය 8ක් නොව 16ක් විවෘත කර තැබිය යුතුයි කියා. එය රැකිරක්ෂා අංශයෙනුත් හොඳ යෝජනාවක්. ඒ වගේම මහජනයාගේ පහසුකම් අතිනුත් හොඳ යෝජනාවක්. ඒ ප්‍රශ්නය වෙනම ප්‍රශ්නයක් හැටියට සලකන්නට බැහැ. මේ වගේ අවස්ථාවක ඒ ප්‍රශ්නයත් සැලකිල්ලට ගත යුතුයි. එවැනි වැදගත් කරුණු රාශියක් ගැබ්වී තිබෙන ප්‍රශ්නයක් මේ.

මේ රටේ කම්කරු සමිති අවුරුදු ගණනාවක් තිස්සේ කරගෙන යන සටනක් තමයි, පැය 40ක වැඩ සතියක් ඇති කරන්න කියන එක. පැය 40 සතියක් ඇති කිරීමේ ඒ යෝජනාවත් මෙහි ගැබ් වී තිබෙනවා. එම නිසා ඒ ප්‍රශ්නයන් විසඳන්නට පුළුවන් මාර්ගයක් වෙනවා මේ යෝජනාව. අප මෙය පිළිගන්න අතර, මුළු රටේම ජනතාවගේ අදහස් ද විමසා කාටත් පිළිගත හැකි පිළිවෙළක් මෙම ගරු සභාවට ඉදිරිපත් කිරීමට පාර්ලිමේන්තු මන්ත්‍රීන්ගෙන් යුක්ත විශෙෂ කාරක සභාවක් පත් කිරීම ගැන ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය ඩබ්ලිව්. දහනායක) කැමති වෙනවා නම් එය රටට වැදගත් ඥනවන්ත සේවයක් ඉටු කිරීමක්. එහෙම නැත්නම්, මේ ප්‍රශ්නයේදී අපෙන් කෙරෙන්නේ හෝද හෝද මඩේ දැමීම පමණයි. එම නිසා මා පහත සඳහන් අතුරු යෝජනාව ඉදිරිපත් කරනවා.

"තවද, මෙම යෝජනාව ගැන පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා මන්ත්‍රී මණ්ඩලයේ විශෙෂ කාරක සභාවක් පත් කළ යුතුය."

**රත්න දේශප්‍රිය සේනානායක මයා. (ක්‍රම සම්පාදන හා රැකිරක්ෂා ඇමතිගේ පාර්ලිමේන්තු ලේකම්)**
(திரு. ரத்ன தேஷபிரிய சேனநாயக்க—திட்டமிடல், வேலைவாய்ப்பு அமைச்சரின் பாராளுமன்றக் காரியதரிசி)
(Mr. Ratna Deshapriya Senanayake—Parliamentary Secretary to the Minister of Planning and Employment)
ඒ අතුරු යෝජනාව මා ස්ථිර කරනවා.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)
මා එය පිළිගන්නවා.

**එම වචන එතැනට එකතු කළ යුතුය, යන ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.**

குறித்த சொற்கள் சேர்க்கப்பட வேண்டுமெனும் வினா விடுக்கப்பட்டு ஏற்றுக் கொள்ளப் பட்டது.

*Question, that those words be there inserted, put, and agreed to.*

**සංශෝධිත යෝජනාව පිළිබඳ ප්‍රශ්නය, එනම්:**

"පෝය නිවාඩු ක්‍රමය ප්‍රතිශෝධනය කිරීම අවශ්‍ය යයි අත්දැකීම් අනුව මෙම මන්ත්‍රී මණ්ඩලය අදහස් කරන අතර, පහත දැක්වෙන නව ක්‍රමය යෝජනා කරයි:—සියලුම සේවකයන්ට දින පහේ සතියක් ලබා දෙමින්, පෝය දින සහ ඉරුදින ප්‍රසිද්ධ නිවාඩු දිනයන් කළ යුතු අතර වැඩ කරන සියලුම දිනයන්හි වැඩ පෙරවරු 8 ට ආරම්භ කර, දිවා භෝජනය සඳහා පැයක විවේකයක් ඇතිව, පස්වරු 5 ට අවසන් විය යුතුය. තවද, මෙම යෝජනාව ගැන පරීක්ෂා කර වාර්තා කිරීම සඳහා මන්ත්‍රී මණ්ඩලයේ විශෙෂ කාරක සභාවක් පත් කළ යුතුය."

**සභාගිමුඛ කරන ලදී.**

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

பின்வரும் திருத்தப்பட்ட பிரேரணை எடுத்தியம்பப்பட்டது :

"கடந்தகால அனுபவத்தைக் கொண்டு போய விடுமுறைத் திட்டம் புனராய்வு செய்யப்பட வேண்டுமெனக் கருதும் அதே வேளையில் பின்வரும் புதிய திட்டத்தை இச்சபை சிபார்சு செய்கிறது : போய தினத்தையும் ஞாயிற்றுக்கிழமையையும் பொது விடுமுறை நாட்களாக்குவதன் மூலம் சகல தொழிலாளர்களுக்கும் வாரத்தில் ஐந்து நாட்களை வேலை நாட்களாக்கி அந்நாட்களில் வேலை காலை 8 மணிக்கு ஆரம்பித்து மத்தியான உணவிற்கு 1 மணித்தியால இடைவேளையுடன் மாலை 5 மணிக்கு முடிவுற வேண்டும். மேலும், இவ்விடயத்தை ஆராய்ந்து அறிக்கை செய்ய சபையின் தெரிகுழு ஒன்று நியமிக்கப்பட வேண்டும்".

*Question, as amended, proposed, namely :*

"That this House is of opinion that the Poya holiday scheme needs revision in the light of experience, and suggests the following new scheme :—The Poya day and Sunday should be public holidays thus giving a five day week to all workers, and work should commence on all working days at 8 a.m. and end at 5 p.m. with an hour's interval for the noon-day meal ; and further, that a Select Committee of the House be appointed to examine and report on this Motion."

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

What is the amendment ?

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)

That it be referred to a Select Committee of the House.

**කේ. ජේයකොඩි මයා. (උඩුප්පිඩ්ඩි)**
*(திரு. கே. ஜெயக்கொடி—உடுப்பிட்டி)*
(Mr. K. Jeyakkody—Uduppiddy)

නැඟී සිටියේ ය.
*எழுந்தார்.*
*rose.*

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

I shall permit the hon. Member for Uduppiddy to speak on the main Motion. We can adopt the amendment proposed by the hon. Parliamentary Secretary to the Minister of Communications ; it has been seconded by the hon. Parliamentary Secretary to the Minister of Planning and Employmet. If the House has no objection we can hear the views of the hon. Member for Uduppiddy on the main Motion.

අ. භා. 3.40

**කේ. ජේයකොඩි මයා.**
*(திரு. கே. ஜெயக்கொடி)*
(Mr. K. Jeyakkody)

கௌரவ உப சபாநாயகரவர்களே, சாதாரணமாக கௌரவ காலிப் பிரதிநிதி (கலாநிதி டபிள்யு. தகநாயக்க) தெரிவிக்கும் அபிப்பிராயங்களை நாங்கள் ஏற்றுக் கொள்வதில்லை. அவர் எத்தனையோ விஷயங்களில் புரட்சிகரமாகவும் முன்னுக்குப் பின் முரணாகவும் பேசுவது வழக்கம். கடந்த ஐந்து வருட காலத்தில் தாம் செய்து முடிக்கத்தக்க விஷயத்தை அப்பொழுது செய்யாமல் இப்பொழுது முதன் முதலாக ஒரு பிரேரணையாகக் கொண்டுவந்திருக்கிறார். இருப்பினும், பிரேரணையை யார் கொண்டு வந்திருக்கிறார் என்பதல்ல முக்கியம். அது என்ன என்பது தான் முக்கியமானது. அதனால் கௌரவ காலிப் பிரதிநிதி கொண்டு வந்துள்ள இந்தப் பிரேரணையை நாங்கள் ஆதரிக்கிறோம்.

எனக்கு முன் பேசிய கௌரவ அங்கத்தவர்கள் பலர் குறிப்பிட்டது போல, இன்று என்ன நாள் என்று திடமாகச் சொல்ல முடியாமலிருக்கிறது. நான் ஒரு இந்து. வெள்ளிக்கிழமைகளிலும், ஞாயிற்றுக்கிழமைகளிலும், பூரணை தினங்களிலும், அமாவாசையிலும் நான் விரதம் பிடிப்பது வழக்கம். நான் ஊரில் இருக்கும் காலங்களில் எனது மனைவி அந்த நாட்களை எனக்கு ஞாபகமூட்டுவார். கொழும்புக்கு வந்து விட்டால், என்ன நாள் என்று தெரியாமல் விரதம் பிடிக்காமல் பாவத்தைச் செய்து விடுகிறேன். நான் ஒரு இந்து என்ற முறையிலே நோன்மதி தினங்களை, விசேடமாக பூரணை, அமாவாசை நாட்களை விடுமுறையாக விடுவதை மிகவும் மகிழ்ச்சியுடன் வரவேற்கிறேன். அதே நேரத்திலே, உலகத்துடன் தொடர்புள்ள நாம், ஞாயிற்றுக்கிழமையை வேலைநாளாக வைத்திருப்பது மிகவும் கஷ்டம் என்பதையும் எடுத்துக் கூற விரும்புகிறேன்.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ஒரு முறை நான் இந்தியா சென்றிருந்த பொழுது அங்கு விடுமுறை நாள் எது வென்று தெரியாமல் மிகவும் கஷ்டப்பட்டேன். ஞாயிற்றுக்கிழமையில் அங்கு கடைகள் எல்லாம் திறந்திருக்கும் என நினைத்தேன். அங்கு சென்ற பின்தான் அங்கெல்லாம் ஞாயிற்றுக்கிழமைகளில் கடைகள் திறக்கப்படுவதில்லை என்பது தெரியவந்தது. எங்களுக்கும் வெளி உலகத்துக்கும் தொடர்பு இருப்பதனால், ஞாயிற்றுக்கிழமை விடுமுறை நாளாக இருப்பது வரவேற்கத்தக்கது. அதே நேரத்தில் இந்துக்களுக்கும் பௌத்தர்களுக்கும் நோன்மதி நாள் விடுமுறையாக இருக்கும்பொழுது கிறிஸ்தவர்கள் ஞாயிற்றுக்கிழமையை விடுமுறை தினமாகக் கேட்பதற்கு எந்த விதமான ஆட்சேபனையும் தெரிவிக்க முடியாது.

கடந்த ஐந்து ஆண்டு காலத்திலும், இப்பொழுது இந்த அரசாங்கம் பதவிக்கு வந்த பின்னரும், அரசாங்க சேவையிலுள்ள இந்து ஊழியர்கள் ஆலய வழிபாட்டுக்குச் செல்வதற்கு வாரத்தில் ஒன்று, இரண்டு மணி நேர அனுமதி பெற எத்தனையோ விதத்தில் முயற்சி செய்து வந்திருக்கிறார்கள். அரசாங்கம் அவர்களது வேண்டுகோளுக்குச் செவி சாய்க்கவில்லை. இந்து ஊழியர்கள், வெள்ளிக் கிழமைகளில் ஆலயம் செல்வதற்காக ஒன்று, இரண்டு மணி நேர லீவு தரும்படி கேட்டிருக்கிறார்கள். அதனை கௌரவ உள்நாட்டு அலுவல்கள் அமைச்சர் அவர்கள் கவனிக்க வேண்டுமென இவ்விடயத்தை அவரது கவனத்துக்குக் கொண்டுவருகிறேன். இதை விட, தொழிலாளர்கள் வாரத்தில் ஏழு நாட்கள்—

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)

Wherever that request has been made it has been allowed. That is what I know.

**කේ. ජේයකොඩි මයා.**
(திரு. கே. ஜெயக்கொடி)
(Mr. K. Jeyakkody)

Under which Government was it allowed?

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)

Under the previous Government and probably under this Government also.

**කේ. ජේයකොඩි මයා.**
(திரு. கே. ஜெயக்கொடி)
(Mr. K. Jeyakkody)

So far as I am aware, there has not been a general rule to that effect. I understand that if any particular officer wanted special permission he was granted permission. That is not enough. That rule must apply to everybody. Everybody must be given permission irrespective of the individual asking for it.

கௌரவ உப சபாநாயகரவர்களே, ஒரு வாரத்தில் ஐந்து நாட்கள் வேலை செய்ய வேண்டும் என்ற கருத்தையும் நாங்கள் வரவேற்கிறோம். ஆனால், கௌரவ காலிப் பிரதிநிதி அவர்கள் சொன்னது போல, ஒரு நாளில் எட்டு மணித்தியாலங்கள் வேலை செய்ய முடியுமா என்பதைச் சிறிது சிந்தித்துப் பார்க்கத்தான் வேண்டும். இது சம்பந்தமாக அரசாங்கக் கட்சியைச் சேர்ந்த பிரதிநிதிகள் சிலர் வரவேற்கத்தக்க ஒரு விஷயத்தைச் சொன்னார்கள். கட்சிப் பற்றற்ற முறையிலே இப்படியான பொது விஷயங்களை பொதுமக்களுடைய அபிப்பிராயத்தைக் கேட்டுச் செய்வது நல்லது என்று சொன்னார்கள். அது ஒரு வரவேற்கத்தக்க விடயமாகும்.

அரசாங்கம், இப்பொழுது பல பிரச்சினைகளையும், தங்களுக்கு தற்பொழுதிருக்கின்ற கட்சியின் பலத்தைச் சிறிதேனும் கருதாமல், பொது மக்களின் நலனை மாத்திரமே கருத்திற் கொண்டு, பொது மக்களின் அபிப்பிராயங்களைப் பல விடயங்களிலும் அவதானித்து அவர்கள் செயலாற்றுகின்றபடியால், எதிர்க் கட்சியிலேயிருக்கின்ற நாம் அதை மிகவும் வரவேற்கின்றோம். இந்த நாட்டிலே பல இனத்தவர்கள், பல மதத்தைச் சேர்ந்தவர்கள் வதிகின்றார்கள். அவ்விதம் பல மதத்தினர் இருக்கின்ற இந்நாட்டில் ஞாயிற்றுக் கிழமையும் போயாதினமும் விடுமுறையாக இருப்பதை நாங்கள் ஆதரிக்கின்றோம்.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ප. භා. 3.45

**එම්. එම්. මුස්තාෆා මයා. (නින්තවූර්)**
*(ஜனாப் எம். எம். முஸ்தபா—நிந்தவூர்)*
(Mr. M. M. Mustapha—Nintavur)

I myself would like to offer a few comments on this Motion which is I think a rather important one. In this country of ours there are various religious groups living, but during the long and uninterrupted colonial regime we had got used to Sunday being a holiday. We had got used to it for such a long time that it is difficult to think of any other day being a holiday.

We have a glorious tradition in this country that one religious group respects the religious susceptibilities of the other. After Ceylon achieved independence, when our national customs, our national dress, our national way of living, are all coming into their own, one cannot resist demands for Poya holidays, national dress and national language. We cannot resist these, but I have a feeling that because we were used to a Saturday-Sunday week-end, we now find various excuses to enjoy once again the Saturday-Sunday week-end.

But it was stated just now by the hon. Parliamentary Secretary to the Minister of Defence and External Affairs that our trade relationships sometimes suffer. It is not true to say that Sunday is a holiday throughout the world. Friday is a holiday in many Muslim countries, particularly in the Middle East. Ceylon has trade relationships not only with the Western Christian countries but also with other countries—for instance, Muslim countries in the Middle East——

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

What the hon. Member said was that a certain percentage of the trade suffers as a consequence of Sunday being a holiday.

**මුස්තාෆා මයා.**
*(ஜனாப் முஸ்தபா)*
(Mr. Mustapha)

That is true. For instance, we will have certain disadvantages in trade relations by having some other day also as a holiday.

All I am trying to say is that I am not at all opposed to Sunday being made a holiday in addition to Poya day. After all, the Motion of the hon. Member for Galle (Dr. W. Dahanayake) is that every Poya day should continue to be a holiday and in addition that Sunday should also be a holiday. In view of the fact that Friday is a day of religious significance not only to the Muslims of this country who number about eight lakhs but also to the Hindus of this country who, I believe, number over eight lakhs or almost a million, I would suggest that Poya day and alternate Fridays and Sundays be made holidays. In other words in a month there will be holidays on the four Poya days, two Fridays and two Sundays. I say this because, after all, we are trying to please various sections of the people and the one and only way you can please the Muslims of this country—incidentally, Sir, you and I know that today is Friday and unless——

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Yesterday was Friday!

**මුස්තාෆා මයා.**
*(ஜனாப் முஸ்தபா)*
(Mr. Mustapha)

That is so: I am sorry. The point I was trying to make is that if Friday is made a holiday, and today happens to be a Friday, I will realize early in the morning that today is declared a holiday for the benefit of the Muslims and it is so declared because the Government has recognized the fact that every Muslim has to go for his Jumma prayers on Fridays.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

Therefore, in all earnestness and seriousness, I would suggest that this Motion be referred to a Committee of this House so that this question may be fully discussed. After all, nobody is opposed. The Buddhists of this country comprise 80 per cent of the population, and therefore It is reasonable, it is nothing but proper, that every Poya day should continue to be a non-working day. Nobody will suggest now that it should not be so. Every Poya day should continue to be a holiday, and in addition two Fridays and two Sundays in a month should also be non-working days so that the Christians, Muslims and Hindus would be able to perform their religious duties.

අ. භා. 3.50

**කේ. වයි. එම්. විජේරත්න බණ්ඩා මයා.**
*(திரு. கே. வை. எம். விஜேரத்ன பண்டா)*
(Mr. K. Y. M. Wijeratne Banda)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ යෝජනාව දෙස බලන විට මට පැරණි ගම් බද කථාවක් මතක් වෙනවා. "වෙච්ච මෝඩකම් දෙන්නට සරියේ—තවත් මෝඩ කම් නොකරන් මරියේ" යන්නයි ඒ ගැමි කතාව. ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය ඩබ්ලිව් දහනායක) ස්වදේශ කටයුතු භාර ඇමතිවරයා වශයෙන් සිටි කාලයේ හතර පෝය නිවාඩු දින කෙළේ බෙර ගහලා, හේවිසිත් ගහලා. ඒ දවස්වලම මේ ගැන පාර්ලිමේන්තුවේදී මා කිව්වා එවකට තිබුණු ආණ්ඩුව අවුරුද්දකට තිබෙන පෝය දවස් ගණනවත් නොබලා පෝය දින නිවාඩු දින යන් කළ බව. බෞද්ධයෙකු හැටියට මම පෝය දවස් ගැන දන්නවා. පෝය ගණන් ගන්නේ පෑලවිය, දියවක, තියවක, ජල වක, විසේනිය, සැටවක, සතවක සහ අට වක යන ක්‍රමයටයි. එසේ තිබියදී, බෞද්ධ ඉතිහාසයවත්, බෞද්ධ සංස්කෘතිය සහ සභ්‍යත්වයවත් නො දැ නයි එදා සතර පෝය නිවාඩු කෙළේ. මේ රටේ බහුතර ජනතාව වන බෞද්ධයන් රවටන්නටත්, බෞද්ධයන්ගේ ඡන්ද ලබා ගන්නටත් වුවමනා කළ නිසා එදා සතර පෝය නිවාඩු කළා. ඒ සඳහා ලිතකුත් මුද්‍රණය කළා. ඒ ලිතේ පෝය දවස් නියම කර තිබුණේ ඇත්ත වශයෙන්ම පෝය දින හැටියට ගණන් ගතයුතු දින අනුව නොවෙයි. පෝය තිබුණේ ඊයේ නම්, ඒ ලිතේ හැටියට සිල් සමාදන් විය යුතු වන්නේ අදයි. අපේ ගම් වල සිල් සමාදන් වන අම්මලා සිල් ගන්නට පුරුදු වෙලා තිබුණේ මුල පටන්ම පෝය දිනවල මිස ඔය පෝය ලිතේ සඳහන් වූ දිනවල නොවෙයි. පසුගිය ආණ්ඩුව මෙය අවුල් කර දැම්මා. පඹගාලේ පැට ලෙන තත්ත්වයක් ඇති කළා. ඒ නිසයි මේ සම්බන්ධයෙන් තවත් මෝඩකම් නො කර සුපරීක්ෂකාරී අන්දමින් ක්‍රියා කළ යුතුයයි මා කියන්නේ. ඒ කාරණය කියන්නටයි මා නැඟී සිටියේ.

ප්‍රශ්නයක නියම තත්ත්වය හරියාකාර තේරුම් බේරුම් කරගෙනයි ඊට විසඳුමක් ඇති කර ගත යුතුව තිබෙන්නේ. අපේ බෞද්ධ සංස්කෘතියත්, සභ්‍යත්වයත් කල්පනාවට ගෙන මෙවැනි ප්‍රශ්න විසඳන්නට ඕනෑ. මහජනයා රවටන අන්දමේ යෝජනා ඉදිරිපත් කර, මාත් මෙවැනි යෝජනාවක් ගෙනවා කියමින් තමන්ගේ නම පුවත්පත්වල පළ වනු දැකීමේ අදහස පෙරදැරි කරගෙන මෙවැනි යෝජනා ඉදිරිපත් කිරීම සුදුසු නැහැ. එසේ කිරීමෙන් අවුරුදු දෙදහස් පන්සියයකටත් අධික කාලයක් තිස්සේ පැවතගෙන එන අපේ බෞද්ධ සංස්කෘතිය සහ සභ්‍යත්වයත් විනාශ වෙනවා. ඒ බව මතක් කරන අතරම මේ යෝජනාව ගැන වැඩි දුරටත් සලකා බලනු පිණිස කාරක සභාවක් පත් කරන හැටියට ඉල්ලමින් මගේ වචන සවල්පය අවසන් කරනවා.

අ. භා. 3.54

**ඒ. අසීස් මයා.** (පත් කරන ලද මන්ත්‍රී)
*(ஜனாப் ஏ. அஸீஸ்—நியமன அங்கத்தவர்)*
(Mr. A. Aziz—Appointed Member)

Mr. Deputy-Speaker, the proposal before the House is not as simple as it sounds. There are several practical questions involved in this matter. When one looks at the proposal on the surface one finds that in place of the one and a half

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අසීස් මයා.]

days' holidays two days' holidays are to be given. Good enough. Instead of one and a half days' holidays, the proposal is to give two days as holidays ; and to make up for the extra half day adjustments are to be made in the working hours of the remaining five days of the week.

There is this question that has to be considered. Under the present system there are one and a half days' consecutive holidays. If the proposal is that the pre-Poya day be also made a full holiday and the working hours of the remaining five days be adjusted to make up for the extra half-day holiday, that would be an entirely different proposition from the one that the hon. Member for Galle (Dr. W. Dahanayake) has brought before the House.

There are certain problems of a practical kind which are connected with this matter. The purpose of having the pre-Poya day as a half-holiday and the Poya day as a full holiday was to make it possible for the majority of the people in this country to have full facilities for their religious observances. When there is a half-holiday immediately preceding the full holiday for the week, there are certain advantages and conveniences that are gained. If the pre-Poya day is made a full holiday the ordinary worker will have two consecutive days as holidays.

There are several workers who have their workplaces in Colombo but whose homes are outside, many miles away from Colombo, and they go to their home stations only once a week ; that is, they make use of the pre-Poya day and the Poya day for that purpose. But if, as has been suggested, the two days are split up and the Poya day and Sunday are made two full holidays, it would be difficult for these people, almost impossible for them, to get to their homes and return to their workplaces conveniently: they would have to spend their time travelling. So, if the proposal of the hon. Member for Galle is accepted it woold cause serious difficulties for these workers. There is, therefore, a definite advantage in having two continuous or consecutive holidays.

I for one would be happy if the present one and a half days' holidays are made two days' holidays, but the two days must follow one upon the other, so that the workers could more usefully utilize their holidays.

නියෝජ්‍ය කථානායකතුමා
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

There is an amendment to the Motion, namely, that this matter be referred to a Select Committee of the House, and I think that these matters can be considered by that Committee.

අසීස් මයා.
*(ஜனாப் அஸீஸ்)*
(Mr. Aziz)

I quite appreciate that. I am only pointing out certain practical difficulties that would arise if the proposal as made by the hon. Member for Galle is accepted.

නියෝජ්‍ය කථානායකතුමා
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please ! The Sitting is suspended for half an hour.

*රැස්වීම ඊට අනුකූලව තාවකාලිකව අත්හිටුවනු ලදින් අ. භා. 4.30 ට නැවත පවත්වනු ලදී.*

*அதன்படி அமர்வு இடைநிறுத்தப்பட்டு, மீண்டும் பி. ப. 4.30 மணிக்கு ஆரம்பமாயிற்று.*

*Sitting accordingly suspended till 4.30 P.M. and then resumed.*

අසීස් මයා.
*(ஜனாப் அஸீஸ்)*
(Mr. Aziz)

Mr. Deputy Speaker, in continuation of my brief cbservations on the Motion of the hon. Member for Galle (Dr. W. Dahanayake), I wish to state that I would really like this question to be looked at from the point of view of convenience, practicability, and its use particularly to the common people who would be utilizing these holidays.

There is another point made, to which also I feel some brief reference is necessary. It is a point which has been made for quite a long time by

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

certain people in this House as well as by groups outside, including the press. It is in connection with our trading relations abroad. They have said that our trading relations have suffered as a result of the weekly holiday which is different from the weekly holiday in several countries of the world.

Mr. Deputy Speaker, it is my view that during the last five years since this new system of weekly holidays came into operation in this country, people not only in this country but also in the outside world who have trading relations with us have actually got used to this new system that was introduced five years ago.

I personally do not see any practical or other difficulty in continuing the Poya day and the pre-Poya day as weekly off days. It may be one and a half or it may be two days, but that is a different question.

Almost everywhere in the world, whether our trading relations are with regard to tea, copra, rubber, or any other item, those countries with whom we trade have got accustomed to this new mode, and I do not think business relations with any country has suffered as a result.

නියෝජ්‍ය කථානායකතුමා
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

The hon. Parliamentary Secretary to the Minister of Defence and External Affairs commented that commercial trade had dropped by 35 per cent on account of the change in the weekly off-day. Your position is it is attributable to other reasons.

අසීස් මයා.
(ஜனாப் அஸீஸ்)
(Mr. Aziz)

That is my position. However, I do not wish to get involved in a controversial matter. But I will tell you this: In the year 1966, our foreign exchange earnings suffered to the tune of Rs. 240 million, and the Government, the then Government, tried to avoid accepting the reason and the responsibility for it. But I can tell you, Mr. Deputy Speaker, that the entire loss of Rs. 240 million in the year 1966 was due to the fall in the crop of tea as a result of the massive strike on the question of the payment of Rs. 17.50 which the Democratic Workers Congress had in 1966. It was a 45-day strike in which nearly 250,000 to 300,000 people participated. As a result of that and also due to bad production of tea, there was a fall in the foreign exchange income. —[*Interruption*]. It has nothing to do with the question of holidays. I therefore feel that as far as this question of trade is concerned, it need not necessarily create any apprehension in our minds because, I believe, if any fall in our foreign exchange earnings has taken place, it is entirely due to other reasons. Say, for example, prices have fallen. I hope nobody in this House, much less the hon. Parliamentary Secretary, would maintain that the prices have fallen because we declared poya day a holiday. I cannot see what connexion there is between the two.

If there is any variation or fluctuation in the price of rubber—we hardly produce seven per cent of the world rubber requirements—it is definitely not because we have Poya day as a holiday and because people at the other end are unable to receive their telegrams on a day convenient to them.

There is another aspect of this matter which, I think, cannot be examined by the proposed committee. It is a political aspect. I pointed it out to the hon. Member for Galle in the restaurant and I wish to do it on the Floor of this House. This is a very cleverly worded Motion and has political implications far worse than what many of us here would imagine. I do not know whether the hon. Member for Galle has consciously done it, or whether something in his sub-conscious has prompted him to do it. Knowing him as I do, I must say, in spite of the differences that I have had with him and may be having with

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[අසීස් මයා.]
him now, I have personally watched his political career with some measure of interest, with a deliberate attempt at understanding.

Therefore, Mr. Deputy Speaker, I think it will be useful if the hon. Member for Galle would throw some light on this question when he replies.

This Motion has a double-edged approach. If the Government does not concede to this, it will get into difficulties with the Catholic voters who supported the Government at the last General Election. On the admission of the hon. Member for Galle in the restaurant—Sir, I do not know whether our Standing Orders permit me to refer to conversations in the restaurant; if they do not, I wish to express my apologies to you —a predominant proportion of the Catholic votes came to the United Front. So, this is a very subtle move on his part to tell the Catholics, "Look, I brought this Motion. I told the Government to make Sunday a holiday. It was such an innocent proposal. I did not ask them to take away the Poya holiday. "I merely said, 'Keep the Poya holiday, but also make Sunday a holiday'".

As far as I am concerned—I also belong to a minority group in more senses than one—I am not averse to any consideration of the problems of the minority communities, be it in the political sphere, be it in the religious sphere, be it in the cultural sphere, be it in the social sphere, or any other sphere in which a minority community is involved or the interests of the minority communities are involved. Therefore it is far from my mind that a facility to a minority community should be denied. But, not forgetting the requirements of the minority communities, there are general interests of the country which, to my mind, should receive priority and precedence.

As I said, I would be grateful if the hon. Member for Galle (Dr. W. Dahanayake) would in his reply throw some light on this; if Sunday is not declared a holiday, the Party to which he belonged, or he himself, could tell the voters: Look, there was an innocuous, a harmless, proposal made whereby the requirements of the Buddhists were not going to be disturbed at all; yet, the Government declined to consider making Sunday a holiday. This question cannot be decided by a Sub-Committee or a Parliamentary Committee that may be appointed to go into it. On the other hand, if this demand is conceded, you can see the situation that would arise for the Government; namely, the Buddhists who are, by far, the majority in this country, would say—and, to my mind, could say very rightly—that a facility which was based on their religious susceptibilities and beliefs has been "fiddled with" by the Party that was returned to power by an overwhelming majority of the people of this country.

I see the point that a Parliamentary Sub-Committee may examine the position. But I think that that Committee will have to be extremely careful because it will find itself in a very unenviable position. I, therefore, suggest that this question be examined very carefully,——

**රත්න දේශප්‍රිය සේනානායක මයා.**
*(திரு. ரத்ன தேஷப்பிரிய சேனநாயக்க)*
(Mr. Ratna Deshapriya Senanayake)
By whom?

**අසීස් මයා.**
*(ஜனாப் அஸீஸ்)*
(Mr. Aziz)
—taking into consideration not only the question of holidays, the conveniences, and the practicability, but also the question of the political implications of any decision that would be made.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)
May I reply?

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**නියෝජ්‍ය කථානායකතුමා**
(உப சபாநாயகர் அவர்கள்)
(Mr. Deputy Speaker)

You might explain any of the points that have been made, because there is an amendment proposed by the Parliamentary Secretary.

අ. භා. 4.44

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ප්‍රවාහණ ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමා විසින් ඉදිරිපත් කරන්නට යෙදුණු අතුරු යෝජනාව මා පිළිගන්නවා. මෙම යෝජනාව මේ විධියටම ක්‍රියාවට යෙදිය යුතුය කියා මේ ගරු සභාව තීන්දු කරනු ඇතැයි මා බලාපොරොත්තු වුණේ නැහැ. මෙම යෝජනාව පිළිගනිමින් හෝ ප්‍රතික්ෂේප කරමින් මේ සාකච්ඡාවෙහිදී ඉදිරිපත් කෙරෙන සියළුම අදහස්වලට ඇහුම්කන් දී ඉතාමත් හොඳ වැඩ පිළිවෙළ පිළිගැනීමට යි මා බලාපොරොත්තු වුණේ. මම මගේ අදහස් ප්‍රකාශ කළා. එහෙත් මෙම සභාවේ ප්‍රකාශ වුණු නොයෙකුත් අදහස් අතර ඉතා හොඳ ඒවාත් තිබුණු බව මා පිළිගන්නවා. එම නිසා පාර්ලිමේන්තු අතුරු කාරක සභාවක් පත් කර මේ සියළුම කරුණු ගැන කල්පනා කර බලා මෙම ප්‍රශ්නය විසඳන්නට පුළුවන්කම තිබෙනවා. මෙය ඡන්ද ගුණ්ඩුවක් හැටියට හෝ කවුරුවත් අමාරුවේ දමන්නට ඉදිරිපත් කරන යෝජනාවක් හ ටියට මා කිසිවිටෙක අදහස් කළේ නැහැ. මෙවැනි බලසම්පන්න ආණ්ඩුවක් අමාරුවේ දමන්නට මට පුළුවන් ය කියා මා සිතන්නේ නැහැ.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ ආණ්ඩුව බලයට පත් වුණායින් පසුව පමනක් නොව ඊට ප්‍රථමත් මෙම කාරණය පිළිබඳව මා දැරූ අදහස් මේ ආකාරමයි. මා එය මුලින්ම පැහැදිලි කර දී තිබෙනවා. අවුරුදු දෙකක් අත්හදා බැලුවායින් පසු මේ නිවාඩු ක්‍රමය සංශෝධනය කිරීමටයි, මගේ අ ්හස තිබුණේ. ඒ අවස්ථාවේදී මගේ අදහස් එම ආණ්ඩුව පිළිගත්තේ නැහැ. ඒක නිසා වන්නට පුළුවනි, ඒ අයට ඒ කරුමේ සිදු වුණේ. හොඳ අදහස් ඉදිරිපත් වුණා නම් ඒවා ඒ අය පිළිගත්තේ නැහැ. අද මහජනයා අතර තිබෙන ප්‍රශ්නයක් තමයි මා දැන් තමුන්නාන්සේලාට ඉදිරිපත් කළේ. එම නිසා මෙම කාරණය පිළිබඳව සම්පූර්ණ සෝදිසියක් කර බැලීම පිණිස කාරක සභාවක් පත් කර තවා නම් හොඳයි. එහෙත් මෙහිලා විස්තර වශයෙන් වචන ස්වල්පයක් ප්‍රකාශ කළ යුතුව තිබෙනවා. මෙම පොහොය නිවාඩුවේ ඉතිහාසය කෙටියෙන් මෙසේයි: 1884 දී කර්නල් හෙන්රි ඕල්කට්තුමාගේ ඉල්ලීම අනුව වෙසක් පොහොය නිවාඩුව දුන්නා.

**රත්න දේශප්‍රිය සේනානායක මයා.**
(திரு. ரத்ன தேஷப்பிரிய சேனநாயக்க)
(Mr. Ratna Deshapriya Senanayake)

ඔය කියූ කරුණු ඉදිරිපත් කරන පොත මොකක්ද?

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
(கலாநிதி டபிள்யு. தஹநாயக்க)
(Dr. W. Dahanayake)

මෙය හැන්සාඩ් වාර්තාවක්. මගේම කතාවකිනුයි කරුණු සොයා ගත්තේ. 1884 දී වෙසක් පොහොය නිවාඩුව දුන්නායින් පසු පුර පසළොස්වක පොහොය දිනය නිවාඩු දිනයක් බවට පත් කළේ දිවංගත ගරු ඇස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරණායක අගමැතිතුමාගේ ආණ්ඩුවයි. එය සිදු වූයේ ඒ 1956 මාර්තු 13 වනදායි. 1964 ගරු සිරිමාවෝ බණ්ඩාරණායක මැතිනියගේ ආණ්ඩුව මගින් පොහොය දින නිවාඩුව ගැන කරුණු සොයා බැලීම සඳහා විශේෂ කාරක සභාවක් පත් කළා. එම කාරක සභාවේ සභාපති හැටියට සිටියේ වැන්ලැන්ගන්බර්ග් මහතායි. එම කාරක සභාව කටයුතු කර ගෙන යන අතරතුරේ තමයි ආණ්ඩුවේ වෙනස් වීමක් සිදු වුණේ. ඒ වෙනස් වීමෙන් පසු පත්වුණු අළුත් ආණ්ඩුව වැන්ලැන්ගන්බර්ග් මහතාගේ කාරක සභා වාර්තාව ගැන සාකච්ඡා කර බලා සතර පොහොය නිවාඩුව පිළිබඳ පනත ඉදිරිපත් කළා. පොහොය නිවාඩුව පිළිබඳ ඉතිහාසය එයයි.

සතර පොහොය නිවාඩුව පිළිබඳ සම්පූර්ණ ප්‍රශංසාව ඩඩ්ලි සේනානායක මහතාගේ ආණ්ඩුවට පමණක් ගන්නට බැරි

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ආචාර්ය ඩබ්ලිව්. දහනායක]

බවයි මගේ අදහස. ඒ ආණ්ඩු දෙකම පොහොය නිවාඩුව ගැන වැඩ කටයුතු කර ගෙන ගියා. ඒ ආණ්ඩු දෙකේම අදහස් එක විධියයි. ඒ බව තමුන්නාන්සේලාට පෙනෙන්නට ඇති. 1964 ජූනි මාසයේදී ගරු මුදල් ඇමතිතුමා විසින් කරන්නට යෙදුණු ප්‍රකාශයේදීත් පොහොය නිවාඩුව ගැන සඳහන් කරමින් එය ලබා දෙන්නට යෝජනාවක් තිබෙන බව පෙන්නුම් කළා.

මෙම පොහොය නිවාඩුව තෝරන්නේ කවුද යන්නයි ඊළඟට මතු වුණු ප්‍රශ්නය. ඒ කාලයේ පොහොය නිවාඩුව ගැන මත භේද තිබුණා. නිවාඩු දිනය හැටියට සල කන පෝය දිනය තෝරන්නේ කවුදැයි ප්‍රශ්නයකුත් ඇති වුණා. පෝය දිනය නම් කිරීමට කාරක සභාවක් පත් කළා. ඒ කාරක සභාවේ උපදෙස් අනුව පෝය නිවාඩුව තීරණය කිරීමටත් එය ප්‍රසිද්ධ කිරීමටත් ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාට බලය දී තිබෙනවා. මුලින්ම පත් කළ ඒ කාරක සභාවේ මත භේද ඇති වුණා. ගරු සංඝ රත්නයත් නක්ෂත්‍රකරුවනුත් ලිත් සම්පාදකයිනුත් යන සියළු දෙනාම එකතු වී කුමන දින පෝය නිවාඩු දිනය හැටියට ගන්නවාදැයි සාකච්ඡා කළා. පෝය දිනවල් දෙකක් තිබෙනවා. එකක් නැකැත් පෝය දින; අනෙක ශාසනික පෝය දින. නිවාඩු දින හැටියට නැකැත් පෝය දින නොව ශාසනික පෝය දින ගන්නවාය කියා කාරක සභාව තීරණය කළා. පෝය දින නියම කරන්නේ ස්වදේශ කටයුතු භාර ඇමතිතුමාගේ අත් සනින් වන්නේ වී නමුත් ඇත්ත වශයෙන්ම ඒ ගැන සාකච්ඡා කර උපදෙස් දෙන්නේ අර කාරක සභාවයි. සංඝ රත්නයෙනුත් නක්ෂත්‍රකරුවන්ගෙනුත් ලිත් සම්පාදකකයින්ගෙනුත් යුක්ත වන ඒ කාරක සභාවට තවත් ඕනෑම කෙනෙකු එකතු කරන්නට ඇමතිතුමාට බලය තිබෙනවා. ඒ කෙසේ වෙතත් මේ විධියට පුළුවන් තරම් උත්සාහ අරගෙන සතර පෝය නිවාඩු දින කර අවුරුදු දෙක තුනක් ගත වූවාට පසු අද තමුන්නාන්සේලාට ඉදිරිපත් කර තිබෙන මේ අඩුපාඩු හය මට පෙනී ගියා. ඒ අඩුපාඩු හය ගැන මා පසු ගිය රජයට කරුණු කියා සිටියා. නමුත් ඒ රජය ඒවාට ඇහුම්කන් දුන්නේ නැහැ. දැන් මේ රජයට මා ඒ අඩුපාඩු ඉදිරිපත් කරනවා. තමුන්නාන්සේලාත් ඇහුම්කන් දෙන්නේ නැත්නම් මට කරන්නට දෙයක් නැහැ. කාරක සභාවක් පත් කර මේ කාරණය ගැන සාකච්ඡා කර බැලුවොත් තමුන්නාන්සේලාට සාධාරණ තීරණයකට එළඹෙන්නට හැකිවේ යයි මා සිතනවා. තමුන්නාන්සේලාට බොහොම ස්තුතියි.

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

There is an amendment by the hon. Parliamentary Secretary to the Minister of Communications that the Motion be referred to a Select Committee of the House for report. I shall now put the amended Motion to the House.

සංශෝධිත මුල් යෝජනාව පිළිබඳ ප්‍රශ්නය විමසන ලදින්, සභාසම්මත විය.

*மூலவினா, திருத்தப்பட்டவாறு விடுக்கப்பட்டு ஏற்றுக்கொள்ளப்பட்டது.*

*Original Question, as amended, put and agreed to.*

## දිවයිනේ අගනුවර

*தீவின் தலைநகரம்*

CAPITAL OF THE ISLAND

අ. භා. 4.56

**පී. එම්. කේ. තෙන්නකෝන් මයා.** (මිහින්තලේ)
*(திரு. பீ. எம். கே. தென்னகோன்—மிஹிந்தலை)*
(Mr. P. M. K. Tennekoon—Mihintale)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, පසු ගිය ආණ්ඩු කාලයේදී මගේ නමින් න්‍යාය පත්‍රයේ තිබුණු යෝජනාවක් මේ ආණ්ඩුව බිහි වූවාට පසු අද සාකච්ඡාවට ගන්නට අවස්ථාව ලැබීම ගැන මා ඉතාම සතුටු වෙනවා. මේ යෝජනාව ගැන කල්පනා කරන විට මට නිතැතින්ම සිහි වන්නේ දිවංගත ගරු එස්. ඩබ්ලිව්. ආර්. ඩී. බණ්ඩාරනායක අගමැතිතුමායි. එතුමා සමස්ත ලංකා ගම් සභා සම්මේලනයේ සභාපතිවරයා වශයෙන් සිටියදී ඒ ගම් සභා සම්මේලනයේ උප සභාපතිවරයා වශයෙන් කටයුතු කිරීමේ භාග්‍යය මට ලැබුණා. දිවංගත ගරු බණ්ඩාරනායක අගමැතිතුමා පළාත් පාලන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දිවයිනේ අගනුවර

ඇමති වශයෙනුත් කටයුතු කළ ඒ කාලයේදී එතුමා තුළ පැවැති බලවත් හැඟීමක් තමයි කෙදිනක හෝ ලංකාවේ අගනුවර නැවත වරක් අනුරාධපුරය විය යුතුය යන්න. තවත් විධියකින් කියනවා නම් අනුරාධපුරය පිළිබඳව එතුමාගේ මනස තුළ සිහිනයක් තිබුණා. අනුරාධපුර නගරය ගැන එතුමා තුළ මොන තරම් ආදරයක් කැක්කුමක් තිබුණාද කියනවා නම්. පළාත් පාලන ඇමති හැටියට කටයුතු කළ කාලයේදී එතුමා අනුරාධපුර ශුද්ධ නගරය වෙන් කිරීමටත් නව නගරය නමින් අලුත් නගරයක් ආරම්භ කිරීමටත් පියවර ගනිමින් කෙදිනක හෝ එතුමාගේ සිත තුළ තිබුණු අර සිහිනය සැබෑවක් කර ගැනීමේ මූලික අත්තිවාරම දැමූ බව මේ අවස්ථාවේදී පෙන්නුම් කළ හැකියි. ගම් සභා සම්මේලනයේ කටයුතු කරන විට එතුමා නොයෙක් අවස්ථාවල අපට කිව්වේ "මේ රට දියුණු කරන්නට නම් කවදා හෝ ලංකාවේ අගනුවර අනුරාධපුරය කළ යුතු අතර කොළඹ නගරය වෙළඳ නගරය විය යුතුය" යන්නයි. එතුමාගේ හදවත තුළ තිබුණු හැඟීම ඒකයි. දුර දක්නා නුවණක් තිබුණු එතුමා සමහර විට අනාගතයේ මතු වන තත්ත්වය ගැන පැහැදිලි අවබෝධයක් ඇතිව එහෙම කියන්නට ඇති. කොළඹ නගරයේ වැඩි වන ජනගහණය ගැනත් උග්‍රවන තදබදය ගැනත් තවත් නොයෙකුත් ප්‍රශ්න ගැනත් කල්පනාව යොමු කළ එතුමා වරින් වර ප්‍රකාශ කළ දේවල් ගැන අපට මතකයි. ඒ වාගේම, එතුමාගේ සිත තුළ තිබුණු අදහස් ක්‍රියාත්මක කිරීමට පියවර ගත් අතර ක්‍රම ක්‍රමයෙන් අනුරාධපුර නගරය යථා තත්ත්වයට නංවන්නට එතුමා කල්පනා කළා. අන්න ඒ නිසා මා ඉතාමත්ම සන්තෝෂ වෙනවා, එතුමා බලා පොරොත්තු වූ ඒ සිහිනය සැබෑ කරන්නට, එතුමාගේ ප්‍රතිපත්ති කෙස් ගහටම අනුගමනය කරන්නට දිවුරුම් දී ඇප කැප වී සිටින ශ්‍රී ලංකා නිදහස් පක්ෂය ඇතුලු මේ සමගි පෙරමුණු ආණ්ඩුව වෙත මේ යෝජනාව ඉදිරිපත් කරන්නට මට අවස්ථාව ලැබීම ගැන. එතුමාගේ ඒ යෝජනාව මේ ආණ්ඩුවට ඉදිරිපත් කරන්නට ලැබීම මගේ ජීවිතයේ මා ලැබූ භාග්‍යයක් හැටියට මා සලකනවා. මා කියන්නේ අද හෙට හෝ තව අවුරුද්දකින් මෙය කරන්නය කියා නොවෙයි. එහෙත් දිවංගත ගරු බණ්ඩාරනායක අගමැතිතුමාගේ ප්‍රතිපත්ති කෙස් ගහටම ක්‍රියාවේ යොදන්නට ඇප කැප වී සිටින අපි අද හෙටම මේ කාරණය සම්බන්ධයෙන් යම්කිසි වැඩ පිළිවෙළක් සකස් කරනවා නම් එය එතුමාගේ ශ්‍රී නාමයට කරන ගෞරවයක්.

වරින්වර සතුරු ආක්‍රමණවලට මුහුණ දුන් නිසා අපේ ප්‍රධාන අගනුවරවල් විනාශ වූ බව තමුන්නාන්සේලා දන්නවා. අනුරාධපුරය, පොළොන්නරුව, මහනුවර, දඹදෙනිය හා අනික් පැත්තෙන් කෝට්ටේ ආදී නොයෙකුත් අගනුවරවල් සතුරු ආක්‍රමණවලට ලක් වී අවසාන වශයෙන් කොළඹ නගරය අපේ අගනුවර වශයෙන් පිළිගැනුණා. එදා අධිරාජ්‍යවාදී ගැත්තන් ඇවිත් මේ රටට කළ විනා නිසා අදත් අපි ඒ අමාරුවෙන් ජීවත් වන බව මා තමුන්නාන්සේලාට කියන්නට ඕනෑ නැහැ. මේ රට එක් දහස් නවසිය හතලිස් ගණන්වල නිදහස ලැබුවා. එහෙත් අද මේ මොහොත දක්වාමත් අපි කියනවා අපට පරිපූර්ණ ස්වාධීනතාවයක් ලැබුණේ නැත කියා. ඒ නිසා ආණ්ඩු ක්‍රම පනත පවා වෙනස් කරන්නට අපි ලැහැස්ති වී සිටින මේ අවස්ථාවේ—ආණ්ඩු ක්‍රම පනත වෙනස් කර පරිපූර්ණ ස්වාධීනතාවයක් ආරක්ෂා කරන ආණ්ඩු ක්‍රමයක් හදන්නට උත්සාහ කරන මෙවැනි අවස්ථාවක—අපේ ස්වාධීනතාවය ආරක්ෂා කර ගෙන මේ රට සමෘද්ධිමත් කරන්නට උපයෝගී කර ගත් ප්‍රධාන අගනුවර වන අනුරාධපුරය මේ අවස්ථාවේ දී අමතක කළොත් එය වරදක්. ඒ නිසා මේ කරුණ ගැන කිසිම ගරු මන්ත්‍රීවරයෙකු තුළ මතභේදයක් ඇති වන්නේ නැත කියා මා කල්පනා කරනවා.

අනුරාධපුර නගරයට ජාතික අතින් හා ඓතිහාසික අතින් වැදගත්කමක් තිබෙනවා. ඒ තත්ත්වය ආරක්ෂා කරන්නට සෑම බෞද්ධයකුගේමත් සෑම සිංහලයෙකුගේමත් පමණක් නොවෙයි අන්‍ය ජාතික හිතවතුන්ගේත් සහයෝගය ඇතිව ජාතික කැක්කුමකින් යුතුව නැවත වරක් අනුරාධපුරය දියුණු කළොත් නැවත වරක් මේ රට දියුණු වුණා කියා අපට සන්තෝෂ වන්නට පුළුවන් වෙනවා.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, තමුන්නාන්සේගේ කාලය වැඩි වශයෙන් ගැනීමට මා අදහස් කරන්නේ නැහැ. ඒ නිසා

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[පී. එම්. කේ. තෙන්නකෝන් මයා.]

තමුන්නාන්සේ ඉදිරියේ මේ යෝජනාව මෙම ගරු සභාවට ඉදිරිපත් කරන්නට කැමතියි.

**ගරු මන්ත්‍රීවරු**
*(கௌரவ அங்கத்தவர்கள்)*
(Hon. Members)

කවියක් කියන්න.

**පී. එම්. කේ. තෙන්නකෝන් මයා.**
*(திரு. பீ. எம். கே. தென்னகோன்)*
(Mr. P. M. K. Tennakoon)

මට කවියක් කියන්න කියා ගරු මන්ත්‍රීවරුන් කියනවා. හොඳයි මම කවියක් කියන්නම්. ඊට පෙර මගේ මේ යෝජනාව පිළිගන්නය කියා මා තමුන්නාන්සේලාගෙන් ඉල්ලා සිටිනවා.

රජ රට මගේ කිරි උතුරන හිනහ කටයි
ගෙලවට බැඳුණු දාගැබ් මුතු පබලු පොටයි
එහි යටගියාවට මුළු තුන් ලොවම යටයි
සිහියට නැගෙන විට හද මස් කැවුතු නටයි

මගේ මේ යෝජනාව ගරු සභාවට ඉදිරිපත් කරමින් මා වාඩි වෙනවා. තමුන්නාන්සේගෙන් අවසරයි.

අ. භා. 4.57

**ඒ. එම්. ජිනදාස මයා.** (කැකිරාව)
*(திரு. ஏ. எம். ஜினதாச—கெக்கிராவ)*
(Mr. A. M. Jinadasa—Kekirawa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ගරු මිහින්තලේ මන්ත්‍රීතුමා ඉදිරිපත් කළ යෝජනාව මා ස්ථිර කරනවා. එසේ ස්ථිර කරන අතරම ඒ ගැන වචන ස්වල්පයක් ප්‍රකාශ කරන්නටත් බලාපොරොත්තු වෙනවා. අපි මේ ප්‍රශ්නය ගැන සලකා බැලිය යුත්තේ සාමාන්‍ය දේශපාලන ප්‍රශ්නයක් වශයෙන් පමණක් නොවෙයි, දියුණුව කරා ළඟා වන රටක අගනුවරක් කෙසේ සකස් විය යුතුද යන කරුණ ගැනත් විමසා බැලීමෙනුයි. අපේ ඉතිහාසය දෙස බලන විට අපට අවංකව කියන්නට පුළුවන් ලංකා ඉතිහාසයේ ස්වර්ණමය යුගය අනුරාධපුර යුගයයි කියා. එයට සාක්ෂි කාටත් පෙනෙනවා. එයට හේතුවක් තිබෙනවා. ලංකාවේ අගනුවර වරින් වර කීප පොළකටම ගෙන ගියා. දඹදෙණිය, කෝට්ටේ, මහනුවර ආදී කීප පොළකටම ලංකාවේ අගනුවර ගෙන ගියා. නමුත් ඒ කිසිම තැනක අනුරාධපුරයේ වගේ දියුණුවක් ඇති වුණේ නැහැ. ඒ වගේම දීර්ඝ කාලයක් අගනුවර වශයෙන් පැවතියෙත් අනුරාධපුරයයි. මා හිතනවා එයට හේතු වූයේ අනුරාධපුර නගරයේ පිහිටීමයි.

සාමාන්‍ය වශයෙන් රටක අගනුවර වශයෙන් තෝරා ගනු ලබන්නේ කරුණු කිහිපයක් සම්පූර්ණ කරන්න පුළුවන්කම තිබෙන ස්ථානයකුයි. ප්‍රධාන වශයෙන්ම, අගනුවර පිහිටුවිය යුත්තේ රටේ සමෘද්ධිමත් ප්‍රදේශයකයි. ඒ වගේම රටේ මධ්‍ය ස්ථානයකයි. විශේෂයෙන්ම පර සතුරු ආක්‍රමණයක් ඇති වෙන අවස්ථාවකදී අපේ අගනුවර පර සතුරු ආක්‍රමණයන්ගෙන් ආරක්ෂා විය යුතුයි. පර සතුරන්ගෙන් ආරක්ෂා වන ස්ථානයක එය පිහිටිය යුතුයි. එහෙම නම් පර සතුරන්ට ඉතා ඉක්මණින් ළඟා විය හැකි ස්ථානයක අපේ අගනුවර පිහිටීම මා හිතන්නේ අපේ රට ලෙහෙසියෙන්ම විනාශ වීමට හේතුවක් විය හැකියි. ඒ වගේම අනුරාධපුර ඉතිහාසය දෙස බලන විට අපට කියන්න පුළුවන් ඒ ප්‍රදේශය ඉතාම සාරවත් පෙදෙසක්ය කියා. පිහිටීම අනුව බලන විට තැනිතලා භූමියක් බව අපට පෙනෙනවා. ඒ වගේම ඒ රජ රට භූමියේ තිබෙන සාරවත් භාවය නිසා අපේ රටේ සිටි සිංහලයන්ගේ ප්‍රධාන ආහාරය වන බත් ලබා ගැනීමට අවශ්‍ය වී ගොවිතැන් කිරීමට පුළුවන් වුණා. වී වගා කරන ප්‍රධාන ප්‍රදේශය රජ රට වීම රටේ දියුණුවට හේතුවක් වුණා වාගේම අනුරාධපුර යුගය සමෘද්ධිමත් යුගයක් වීමට විශේෂ හේතුවක් වුණා.

ඒ වගේම අපේ සමගි රජයේ, එහෙම නැත්නම් ඉදිරියේදී ඇති වෙන මීටත් වඩා වේගවත්ව ගමන් කරන සමාජවාදී රජයක විශාල බලාපොරොත්තු ඇති වෙන්න පුළුවන්. එම බලාපොරොත්තුවලට සරිලන විධියේ අගනුවරක් අපේ රටට තිබිය යුතුයි. ඒ සම්බන්ධයෙන් කාරණා කිහිපයක්ම මතක් කළ යුතුව තිබෙනවා. අපි දන්නවා දැන් කොළඹ නගරයේ විශාල තදබදයක් තිබෙන බව. කවදා හෝ කවුරු විසින් හෝ ඒ තදබදය

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

නැති කරන්න ඕනෑ. ඒ සමගම ක්‍රමානුකූලව, සැලැස්මක් අනුව සකස් වුණු අගනුවරක් අපේ රටට තිබෙන්න ඕනෑ. අපි දන්නවා අපට ආසන්න රට වන ඉන්දියාවේ එවැනි දෙයක් සිදු වුණා. එහි අගනුවර නව දිල්ලියට ගෙන ගියා. සැලැස්මක් අනුව ක්‍රමානුකූලව රටේ ජනතාවට පහසු වන විධියට, පාලන තන්ත්‍රය ලෙහෙසියෙන් ක්‍රියාත්මක කරන්න පුළුවන් වන විධියට, නව සැලැස්මක් අනුව අගනුවර පාවිච්චි කිරීමේ පරමාර්ථය ඇතිවයි ඉන්දියාවේ අගනුවර නව දිල්ලියට ගෙන ගියේ. ඒ නිසා මා හිතනවා ගරු මිහින්තලේ මන්ත්‍රීතුමාගේ (පී. එම්. කේ. තෙන්නකෝන් මයා.) යෝජනාව ඉතාම කාලෝචිතයි කියා.

සමගි පෙරමුණු රජය—නව ව්‍යවස්ථාදායක මණ්ඩලය යටතේ පිහිටුවන්න බලාපොරොත්තු වන අපේ ජන රජයේ—ඊළඟ කර්තව්‍යය විය යුත්තේ අපේ අගනුවර ගැන කල්පනා කිරීමයි. අපේ අගනුවර ගැන කල්පනා කරන විට මා කලින් කිව්වා වාගේ කරුණු කිහිපයක් ගැන කල්පනා කරන්න ඕනෑ. අපි දන්නවා අද කොළඹ නගරයේ තත්ත්වය අනුව යම්කිසි සැලැස්මක් අනුව රජයේ දෙපාර්තමේන්තු ඇති කිරීමට පුළුවන්කමක් නැති බව. පාර්ලිමේන්තු ගොඩනැගිලි ඒවගේම මැති ඇමතිවරුන්ගේ නිල නිවාස යනාදී ගොඩනැගිලි, සැලැස්මක් අනුව, ජනතාවට ප්‍රයෝජනවත් වන විධියට, රජයට පහසු වන විධියට සකස් කරන්න පුළුවන් කමක් නැහැ. ඒ නිසා අනුරාධපුර නගරයට අපේ අගනුවර ගෙන ගියොත් ඒ ප්‍රශ්න ලෙහෙසියෙන් විසඳා ගන්න අපට පුළුවන් වෙනවා. අනුරාධපුර නගරයේ ඉඩම් ඕනෑ තරම් තිබෙනවා. ඒ නිසා සැලැස්මක් අනුව රජයේ කාර්යාල ඉදි කිරීමට පුළුවන් වෙනවා ඇති.

උදාහරණයක් වශයෙන් අපි දැන් කොළඹ නගරයේ ඇමතිතුමන්ලාගේ කාර්යාලවලට යනවා නම් මුළු කොළඹ නගරය පුරාම ඇවිදින්න ඕනෑ. නොයෙක් නොයෙක් කාර්යාලවලට යනවා නම් ඒත් කොළඹ නගරය පුරාම ඇවිදින්න ඕනෑ. එම නිසා ක්‍රමානුකූලව ඇමති කාර්යාල ටික එක ළඟ තිබෙනවා නම් අපේ ඇමතිතුමන්ලාටත් ලෙහෙසි වෙනවා, ඒ වාගේම රටේ ජනතාවටත් පහසුවක් වෙනවා. ඒ එක්කම රජයේ කාර්යාල ටිකත් එක ළඟ තිබෙනවා නම් සියලුම කටයුතුවලදී විශාල පහසුවක් සැලසෙනවා. මැති ඇමතිවරුන්ට සහ වෙනත් රජයේ නිලධාරීන්ට ඒ කාර්යාලවලට කිට්ටුව නිවාස පහසුකම් ද සලසා පදිංචි වීමට සැලැස්වුවොත් රාජකාරි කටයුතුවලදී එය විශාල වශයෙන් ප්‍රයෝජනවත් වෙනවා. රාජකාරි කරන අයටත් රටේ ජනතාවටත් එක වගේම පහසුවක් සැලසෙනවා.

මේ රටේ නියම සමාජවාදී ජන රජයක් බිහි වේවිය කියා කවුරුත් බලාපොරොත්තු වෙන් සිටිනවා. මා හිතනවා ඒ සඳහා විය යුතු පළමුවෙනි කර්තව්‍යය නම් දේශීය හා විදේශීය වෙළඳාම නිසි සැකැස්මකින් ක්‍රියාත්මක වීමය කියා. නියම සමාජවාදය සඳහා දේශීය හා විදේශීය වෙළඳාම රටේ ජනතාව අතර තිබිය යුතුයි. තවත් පැහැදිලි කරනවා නම් එය රජයේ පාලනයට යටත් විය යුතුයි. එසේ දේශීය හා විදේශීය වෙළඳාම රජයේ පාලනය යටතට ගෙන — මා හිතන්නේ නැහැ දැනට තිබෙන තදබදය අනුව කොළඹ නගරයේ දැනට එය ක්‍රියාත්මක කිරීමට පුළුවන් කියා—අපේ පාලන කටයුතු අනුරාධපුර නගරයට වෙන් කළාට පසුව, කොළඹ නගරය සම්පූර්ණයෙන්ම වෙළඳ කටයුතු සඳහා වෙන් කර එය අපේ දේශීය හා විදේශීය වෙළඳාම සිදු වන වෙළඳ නගරය කළ යුතුයි. එසේ කළහොත් ඒ කර්තව්‍යය සංවිධානාත්මකව කරන්න පුළුවන් වෙනවා.

දැනට කොළඹ නගරය අවට විශාල කර්මාන්තශාලා ඇති කර තිබෙනවා. ඒ එක්කම කොළඹ නගරය අවට තවත් කර්මාන්ත ශාලා ඉදි කරන්නටත් අපි බලාපොරොත්තු වෙනවා. එසේ වූ විට එම කර්මාන්තශාලාවල සේවය කරන සේවකයන් සඳහා අවශ්‍ය පහසුකම්ද, ඒ කර්මාන්තශාලාවල කෙරෙන නිෂ්පාදන ගබඩා කර තැබීම ආදිය සඳහා පහසුකම්ද ඇති කළ යුතුව තිබෙනවා. එහෙත් දැනට තිබෙන තදබදය උඩ ඒවා කරන්නට ඉඩක් ලැබෙන්නේ නැහැ. නමුත් මෙම යෝජනාවෙන් පැහැදිලි කර ඇති පරිදි අපේ පාලන කටයුතු අනුරාධපුර නගරයට ගෙන ගියාට පසුව කර්මාන්තශාලා පිළිබඳව පැන

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ඒ. එම්. ජිනදාස මයා.]

නඟින ඉහත කී ප්‍රශ්නද පහසුවෙන් විසඳා ගන්නට පුළුවන් වෙනවා.

අප විසින් පිළිගත යුතු තවත් කාරණයක් නම් ලංකාවේ දියුණු කළ යුතු ප්‍රදේශ අතරින් පළමුවෙනි වශයෙන් අප විසින් සැලකිය යුතුව තිබෙන්නේ රජ රට ප්‍රදේශ බවයි. අපේ රටේ විශාලම සංවර්ධන ව්‍යාපාරය වූ මහවැලි යෝජනා ව්‍යාපාරය විශාල වශයෙන් බල පාන්නේ රජ රට ප්‍රදේශයටයි. ඒ එක්කම මේ රටේ ජනතාවගේ ආහාර ප්‍රශ්නය විසඳීම සඳහා යෝජනා කර ඇති මහවැලි ගඟ සංවර්ධන යෝජනා ක්‍රමය නිසාද රජ රට සම්පූර්ණයෙන් දියුණු වෙනවාට කිසිම අනුමානයක් නැහැ. මහවැලි ගඟ සංවර්ධන යෝජනා ක්‍රමය සඳහා වියදම් කරනු ලබන රුපියල් කෝටි ගණනක මුදලින් කොටසක් නව අගනුවර ඉදි කිරීමේ කාර්ය සඳහා යොදවන්නට අපට පුළුවන්කම ලැබෙනවා ඇති. රජ රට සශ්‍රික වන අවස්ථාවේදී අප අපේ අගනුවර වශයෙන් අනුරාධපුරය තෝරා ගතහොත් එය මේ රටේ මේ විප්ලවයේ අසහාය නායක දිවංගත බණ්ඩාරනායක මැතිතුමාට අප දක්වන නියම සැලකිල්ලයි. අනුරාධපුර පූජා නගරය, එහෙම නැත්නම් පරණ නගරය ඒ නමින්ම තබා නව නගරය "බණ්ඩාරනායක පුරය" නමින් හඳුන්වන්නට අපට එදාට පුළුවන් වෙනවා. දිවංගත අසහාය නායකයාට ගරු කරන්නට පුළුවන් උසස්ම විධිය ඒකයි. ලෝකයේ නොයෙක් රටවල විශිෂ්ට නායකයන්ගේ නම්වලින් ඒ ඒ රටේ නව නගර හඳුන්වා තිබෙන බව අප දන්නවා. ඒ නිසා අනුරාධපුර නව නගරය "බණ්ඩාරනායක පුරය" යනුවෙන් නම් කළහොත්, එය බණ්ඩාරනායක මැතිතුමාට කරන උසස්ම සැලකීම වෙනවා පමණක් නොව, මේ රටේ දුක් විඳින ගොවි කම්කරු ජනතාවට දක්වන ලොකුම උපහාරයක් වෙනවා.

අද මේ රටේ ධනපති පංක්තියේ කේන්ද්‍රස්ථානය බවට පත් වී තිබෙන්නේ කොළඹ නගරයයි. අප මේ විධියේ යෝජනාවක් ක්‍රියාත්මක කළහොත් ගොවි කම්කරු ජනතාව මේ රටේ වැදගත් කොටසක් බව කොළඹ නගරයේ සුර සැප විඳින ජීවිතවලට වැටහේවි. ගොවි කම්කරු ජනතාවගේ පහසුව සඳහා මේ රජය ඒ විධියට ක්‍රියා කළා යයි ඒ අයට වැටහේවි. සූරාකෑමෙන් තොර, ධනේශ්වර වාදයෙන් තොර, නියම සමාජවාදී සමාජයක් මේ රටේ බිහි කිරීමේ කාර්යය ඉෂ්ට කර ගැනීමට එදාට අපට හැකි වෙනවා. අනුරාධපුර නව නගරය මේ රටේ අග නගරය බවට පත් කළහොත් මේ රටේ ගොවි කම්කරු ජනතාවට ලොකු ගෞරවයක් දැක්වීමක් වෙනවා වාගේම එයින් ඒ ජනතාවට සතුටුදායක ජීවන තත්ත්වයක් ලබා දෙන්නටද හැකි වෙනවා. අප අනුරාධපුර නව නගරයට අපේ අගනුවර ගෙන ගියහොත් දැනට අපේ අගනුවර වශයෙන් සලකන කොළඹ නගරය අවට ප්‍රදේශයේ ඉඩම්වල තිබෙන වටිනාකම අඩු වෙනවා. කොළඹ නගරයේ සහ ඒ අවට ජීවත් වන දුප්පත් පංක්තියේ උදවියට ලොකු සහනයක් සැලසෙනවා. ඒ කියන්නේ ඒ අයගේ නිවාස ප්‍රශ්නය පහසුවෙන් විසඳා ගන්නට පුළුවන් වෙනවා. එම නිසා, ඉදිරිපත් කර ඇති මෙම යෝජනාව වැදගත් යෝජනාවක් හැටියට සලකා එය අනුමත කරන ලෙස ඉල්ලමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා.

**ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.**
*வினா எடுத்தியம்பப் பெற்றது.*
*Question proposed.*

අ. භා. 5.14

**පී. බී. බාලසූරිය මයා.** (ගලිගමුව)
*(திரு. பீ. பி. பாலசூரிய—கலிகொமுவ)*
(Mr. P. B. Balasuriya—Galigamuwa)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මිහින්තලේ ගරු මන්ත්‍රීතුමා (පී. එම්. කේ. තෙන්නකෝන් මයා.) විසින් ඉදිරිපත් කර ඇති මෙම යෝජනාව වැදගත් යෝජනාවක් බව මා පිළිගන්නවා. නමුත් අනුරාධපුර නගරය දිවයිනේ අගනුවර කිරීමට තිබෙන සුදුසුකම හැටියට මට පෙනී යන්නේ ඉඩකඩම් තිබෙනවාය කියන කාරණය පමණක් බව මෙහිදී සඳහන් කරන්න කැමතියි. ඇත්ත වශයෙන්ම වෙනත් සුදුසුකමක් ගැන මට නම් පෙනී යන්නේ නැහැ. බණ්ඩාරනායක අගමැතිතුමා මෙය දිවයිනේ අගනුවර කරන්නට අදහස් කළාය යන කියමන ගැන මට නම් සැකයක් තිබෙනවා. මන්ද? අනුරාධපුර නගරය ශුද්ධ නගරයක් කිරීමට එතුමා තුළ අදහසක් තිබුණු නිසයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**ඒ. එම්. ජිනදාස මයා.**
*(திரு. ஏ. எம். ஜினதாச)*
(Mr. A. M. Jinadasa)

ශුද්ධ නගරය ගැන නොවෙයි මා කියන්නෙ, නව නගරය ගැනයි.

**බාලසූරිය මයා.**
*(திரு. பாலசூரிய)*
(Mr. Balasuriya)

යෝජනාවේ එබන්දක් ගැන සඳහන් වෙන්නෙ නැහැ. එය යෝජනාව ස්ථිර කළ මන්ත්‍රීතුමාගේ අදහස වන්නට පුළුවනි. ශුද්ධ නගරය හෝ වේවා නව නගරය හෝ වේවා මොන නගරය වුණත් අනුරාධපුර නගරය දිවයිනේ අගනුවර වශයෙන් සැලකීමට, නැතිනම් එහි අගනුවර පිහිටුවීමට සුදුසු තත්ත්වයක් නැති බවයි මගේ පිළිගැනීම. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, අනුරාධපුර නගරය, විජයන්ගේ නැතිනම් කල්ලතෝනින්ගේ පැමිණීමෙන් අවුරුදු සිය ගණනකට පසුව නැතිනම් මෙයට අවුරුදු දෙදහසකට පමණ පෙර පිහිටුවූ රාජධානියක් බව අප දන්නවා. අවුරුදු දෙදහසකට පෙර තිබුණු ඒ ශ්‍රී විභූතිය වර්තමානයට ගැළපෙනවාද කියන ප්‍රශ්නයත් මේ සමගම මතු වෙනවා. අප ජීවත් වන්නේ ඒ යුගයෙන් අවුරුදු දෙදහසකට පමණ පසුව බව මෙහි දී මතක් කර දෙන්න කැමතියි. [බාධා කිරීමක්] අනුරාධපුර රාජධානිය, පොළොන්නරු රාජධානිය ආදි වශයෙන් අවුත් අවසානයේදී නියම රාජධානිය පිහිටුවා ගන්නට ලැබුණා; ඒ කියන්නෙ මේ රටට ගැළපෙන, නියම රාජධානිය වන මහනුවර රාජධානිය පිහිටුවා ගත්තා. ගරු නියෝජ්‍ය කථානායකතුමනි, උඩ රට ප්‍රදේශ කවදාවත් විදේශිකයන්ට යටත් කර ගන්නට පුළුවන් වුණේ නැහැ. උඩරට විදේශිකයන්ට පාවාදුන් බවක් ඉතිහාසයේ කොතැනකවත් සඳහන් වන්නේත් නැහැ.

**ඒ. එම්. ජිනදාස මයා.**
*(திரு. ஏ. எம். ஜினதாச)*
(Mr. A. M. Jinadasa)

අවසානය ?

**බාලසූරිය මයා.**
*(திரு. பாலசூரிய)*
(Mr. Balasuriya)

අවසානය ඇති වුණේ එහෙම නොවෙයි. කොන්දේසි ගණනාවක් උඩ විජාතිකයන්ට රටේ පාලනය භාර දුන්නා පමණයි. එම නිසා, මෙබඳු වැදගත් රාජධානියක් අත්හරින්නට කිසිම යුතුකමක් නැහැ. අප ඉන්දියාව ගැන සලකා බලමු. කල්කටාව, බොම්බාය වැනි නගර ප්‍රධාන නගර ලෙස සැලකුවත් රාජ්‍ය පාලන කටයුතු පිළිබඳ කේන්ද්‍රස්ථානය වශයෙන් සලකන්නේ දිල්ලියයි. ඒ වාගේම කොළඹ නගරය වෙළඳ නගරය බවට පත් වුණා නම් අපේ අගනුවර බවට පත් විය යුතුව තිබෙන්නේ මහනුවර නගරයයි.

ඊළඟට අප බලන්නට ඕනෑ, මුළු ලංකාවේ ඉන්නා හැම කෙනකුටම, හැම මන්ත්‍රීවරයකුටම ඒ මධ්‍යස්ථානයට පහසුවෙන් යන්නට පුළුවන්ද කියා. අනුරාධපුරය ලංකාවේ අගනුවර කළොත් එහි වැඩි වැඩියෙන් පදිංචි වන ජනතාවට අවශ්‍ය වතුර ටික පවා කිසිම සැකයක් නැතිව මහනුවර පැත්තෙන් ගෙන යන්නට සිදු වෙයි. ඒ ප්‍රදේශයේ පවතින අධික උෂ්ණය නැති කොට මිනිසුන්ට සිසිලස ලබා දීම සඳහා හැම ගෙයක්ම වායුසමනය කරන්නටත් සිදු වෙනවා. එහෙම නැත්නම් ජීවත් වන්න අමාරුයි. මහනුවර ප්‍රදේශය නම් ස්වභාවයෙන්ම වායුසමනය වී තිබෙනවා.

**ඒ. එම්. ජිනදාස මයා.**
*(திரு. ஏ. எம். ஜினதாச)*
(Mr. A. M. Jinadasa)

ඔය වායුසමනයට පුරුදු වීම තමා වරද. [බාධා කිරීම්]

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)

Order, please! The House will sit till 8.30 P.M. and there is no need to interrupt the hon. Member.

**බාලසූරිය මයා.**
*(திரு. பாலசூரிய)*
(Mr. Balasuriya)

මගේ අදහස අනුව නම් ලංකාවේ අගනුවර කිරීමට අනුරාධපුරයට වඩා හැම සුදුසු

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[බාලසූරිය මයා.]
කමක්ම මහනුවරට තිබෙනවා. එම නිසා ලංකාවේ අගනුවර විය යුත්තේ අනුරාධපුරයද එහෙම නැත්නම් මහනුවරද යන්න තීරණය කිරීම සඳහා, කලින් යෝජනාව ගැන පරීක්ෂා කර බැලීම සඳහා පත් කරන්නට අදහස් කළ පරිදි මන්ත්‍රීවරුන්ගෙන් සමන්විත කමිටුවක් පත් කළ යුතුය යන අදහස ඉදිරිපත් කරන්නට මා කැමතියි.

**රත්න දේශප්‍රිය සේනානායක මයා.**
*(திரு. ரத்ன தேஷபிரிய சேனநாயக்க)*
(Mr. Ratna Deshapriya Senanayake)
මා එය ස්ථිර කරනවා.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)
සභාව ඉදිරිපිට දැන් අතුරු යෝජනාවක් තිබෙනවාද ?

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
අදහසක් ඉදිරිපත් කළා පමණයි.

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க)*
(Dr. W. Dahanayake)
එය ස්ථිර කළා නේද ?

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
අතුරු යෝජනාවක්ද ?

**රත්න දේශප්‍රිය සේනානායක මයා.**
*(திரு. ரத்ன தேஷபிரிய சேனநாயக்க)*
(Mr. Ratna Deshapriya Senanayake)
අතුරු යෝජනාවක් හැටියට තමා ඉදිරිපත් කරන්නට අදහස් කරන්නේ. " මේ යෝජනාව ක්‍රියාත්මක කිරීම සඳහා විමසා බැලීමට පාර්ලිමේන්තු කාරක සභාවක් පත් කළ යුතුය " යන්න මුල් යෝජනාවේ අගට එකතු කළ යුතුයයි මා යෝජනා කරනවා.

මිහින්තලේ ගරු මන්ත්‍රීතුමාගේ (පී. එම්. කේ. තෙන්නකෝන් මයා.) අදහස ඊකක් වැදගත්. ගලිගමුවේ ගරු මන්ත්‍රීතුමා (බාලසූරිය මයා.) කීවා අනුරාධපුරය නොව මහනුවර ලංකාවේ අගනුවර විය යුතුය කියා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)
ඒ සියල්ලටම වැඩිය හොඳයි, මින්නේරිය.

**රත්න දේශප්‍රිය සේනානායක මයා.**
*(திரு. ரத்ன தேஷபிரிய சேனநாயக்க)*
(Mr. Ratna Deshapriya Senanayake)
තවත් නොයෙක් අදහස් තිබෙන්නට පුළුවනි. ආණ්ඩුවේ මධ්‍යස්ථානය හෙවත් දේශපාලන අගනුවර විය යුත්තේ අනුරාධපුරයද, මහනුවරද,——

**නියෝජ්‍ය කථානායකතුමා**
*(உப சபாநாயகர் அவர்கள்)*
(Mr. Deputy Speaker)
කොළඹට ළඟයි, බේරුවල.

**රත්න දේශප්‍රිය සේනානායක මයා.**
*(திரு. ரத்ன தேஷபிரிய சேனநாயக்க)*
(Mr. Ratna Deshapriya Senanayake)
——බේරුවලද, රුහුණද යන්න ගැන එක් එක් අය ඒ ඒ පහසුකම් හා වැදගත්කම් අනුව අදහස් ඉදිරිපත් කරන්නට පුළුවනි. එහෙත් අප ඉදිරියේ දැනට ඇති යෝජනාව අනුරාධපුරය ලංකාවේ අගනුවර විය යුතුය කියායි.

අපේ රටේ දේශපාලන අගනුවර ගැන නැවත සලකා බැලිය යුතුවා වාගේම අධිරාජ්‍යවාදීන් විසින් බෙදන ලද පළාත් මායිම් එසේම පවත්වාගෙන යා යුතුද යන ප්‍රශ්නය ගැනත් සලකා බැලිය යුතුයි. ඉංග්‍රීසින් ලංකාව සිය යටත් විජිතයක් බවට පත් කර ගෙන ලංකාව පරිපාලනමය වශයෙන් පළාත් 9 කට බෙදා ඇතත්, එය වර්තමාන තත්ත්වයට කිසි සේත් ගැළපෙන්නේ නැතිවා පමණක් නොව අනන්ත අපහසුකම් පවා ඇති කරනවා. මහනුවර සිංහල රාජධානියව පැවති කාල

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

යේදී මුද්‍රකරයේ සිය ආණ්ඩුව පිහිටුවා ගත් අධිරාජ්‍යවාදීන් පරිපාලනමය වශයෙන් පළාත බෙදුවේ ආණ්ඩුකාරයාගේ සහ ආණ්ඩුවේ ඒජන්තවරුන්ගේ ගමන්—අශ්ව කරත්තයෙන් හෝ අශ්වයා පිට හෝ යෑමේ—පහසුකම් සලකාගෙනයි.

ඉස්සරවෙලා ඉංග්‍රීසි ආණ්ඩුව මගින් ලංකාව පළාත් 5 කට බෙදා තිබුණා. ඊට පසුව ඉංග්‍රීසින් විසින්ම ලංකාව පළාත් 9 කට බෙදුවා. මේ බෙදීම් ජනතාවගේ අවශ්‍යතාවන් අනුව හෝ ලංකාවේ සංවර්ධන අවශ්‍යතාවන් අනුව හෝ කරන ලද බෙදීම් නොව ඉංග්‍රීසි අධිරාජ්‍යවාදීන්ගේ අවශ්‍යතාවන් අනුව බයිනෙත්තු බලයෙන් ජනතාව යටත් කර ගැනීම සඳහා එදා තිබුණු ගමනාගමන පහසුකම් අනුව ඉක්මණින් ඒ ඒ ස්ථානවලට යාහැකි මාර්ග අනුව කරන ලද බෙදීම්. ඒ නිසා ඉංග්‍රීසි ආණ්ඩුව මගින් මේ රට පළාත් 9කට බෙදා ගසා තිබෙන ඉරි මකා දැමිය යුතුයි. එසේ මකා දමන අතර මේ රටේ දේශපාලන අගනුවර අනුරාධපුරය විය යුතු නම් ඒ ගැනත් කල්පනා කරමින්—

**රෝයි රාජපක්ෂ මයා.** (හක්මන)
*(திரு. ரோய் ராஜபக்ஷ—ஹக்மன)*
(Mr. Roy Rajapakse—Hakmana)
රුහුණ ?

**රත්න දේශප්‍රිය සේනානායක මයා.**
*(திரு. ரத்ன தேஷப்பிரிய சேனநாயக்க)*
(Mr. Ratna Deshapriya Senanayake)

කොහේ හෝ වේවා ඒ ගැන කල්පනා කළ යුතුයි. ගරු මන්ත්‍රීතුමා ඒ කාරක සභාවට ඒ යෝජනාව ඉදිරිපත් කරන්න. අද පළාත් බෙදා තිබෙන ආකාරය ගැන කල්පනා කර බලමු. තමන්කඩුවේ සිට පොළොන්නරුවේ ප්‍රධාන අධ්‍යාපන කාර්යාලයට හැතැප්ම 72 ක් තිබෙනවා. ඒ වගේම හිඟුරක්ගොඩ ආරෝග්‍යශාලාව පාලනය වන්නේ ඊට හැතැප්ම හැට-හත්තෑවක් ඈත මාතලේ සිටයි. මේ දිස්ත්‍රික්ක හා පළාත් බෙදීම් අනුව ජනයාට හිරිහැරවන අන්දමේ පාලනයක් ඇතිවී තිබෙනවා. සබරගමුව පළාත බෙදී තිබෙන්නේ බඩවැල වගෙයි. එහි අගනුවර රත්නපුරයයි. මේ පැත්තෙන් කෑගල්ල. මේක රට හරහා දුවන පළාතක්. රඹුක්කන වගේ ප්‍රදේශයක අයට එහා කෙළවරේ ප්‍රධාන නගරයේ පිහිටි කාර්යාලයකින් යම් රාජකාරියක් කර ගන්නට වුවමනා නම් ඒ සඳහා හැතැප්ම හැට-හත්තෑවක් මග ගෙවා යන්නට සිදු වෙනවා. ඒ නිසා මේ පළාත් බෙදීම් වෙනස් කළ යුතුයි.

අපේ පැරණි සිංහල රාජධානිය කොටස් 3 කට බෙදා තිබුණා. අපේ පැරණි සිතියම් වල ඒ කොටස් තුන දැක් වෙනවා. එක් කාලයක කොටස් 4 කටත් බෙදී ක්‍රියා කළා. රුහුණු, මායා, පිහිටි කියා එක් යුගයක් තිබුණා. තවත් කාලයකදී කඳුරට හෙවත් මලය රට වශයෙන් තවත් කොටසක් වෙන් කර කටයුතු කරගෙන ගියා. මෙය ඉතා වැදගත් කරුණක් හැටියට සලකා කටයුතු කළ යුතුයි. බ්‍රිතාන්‍ය අධිරාජ්‍ය කරන ලද බෙදීම් අනුව අප පාලනය කරන්ට යාම නිසා ජනතාවට නොයෙක් හිරිහැර සිදු වී තිබෙනවා. සමහරවිට ළඟ තිබෙන කච්චේරිය පසු කරගෙන හැතැප්ම ගණන් ඈත කච්චේරිවලට යන්නට සිදු වෙනවා. මේ කාරණා මේ සභාව මගින් සලකා බැලිය යුතුයි. පුරාණ සිංහලයේ තිබුණු බෙදීම් අනුව නැවත පළාත් බෙදා සකස් කර ගත්තොත් ඒ පළාත්වල පාලන කටයුතු—අධ්‍යාපන හෝ වේවා. සෞඛ්‍ය හෝ වේවා, වාරිමාර්ග හෝ වේවා, කර්මාන්ත හෝ වේවා—ක්‍රියාත්මක කිරීම පහසු වෙනවා. එහෙම කළොත් ඒ පළාත්වල මන්ත්‍රීවරුන්ට පුළුවන් වෙනවා, පොඩි මන්ත්‍රී

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[රත්න දේශප්‍රිය සේනානායක මයා.]

මණ්ඩල වගේ එකතුවී සකස් කර තිබෙන සැලසුම් ආදිය ගැන සාකච්ඡා කර බොහොම ලෙහෙසියෙන් ප්‍රශ්න නිරාකරණය කර ගන්න.

**ඒ. එම්. ජිනදාස මයා.**

*(திரு. ஏ. எம். ஜினதாச)*

(Mr. A. M. Jinadasa)

ෆේඩරල් පක්ෂය කැමති වෙයි.

**රත්න දේශප්‍රිය සේනානායක මයා.**

*(திரு. ரத்ன தேஷபிரிய சேனநாயக்க)*

(Mr. Ratna Deshapriya Senanayake)

ෆේඩරල් පක්ෂය අකමැති වන්ට පුළුවන්.

අගනුවර වෙනස් කිරීම මෙන්ම මේ කරුණුත් විශේෂයෙන් අපගේ සැලකිල්ලට භාජන විය යුතුයි. පෙඩරල් පක්ෂය ගැන මෙහිදී කතාවක් මතුවුණා. එදා පෙඩරල් පක්ෂයක් තිබුණේ යාපන අර්ධද්වීපයේ පමණයි. එදාත් එහි ජනතාව ඔවුන්ගේ භාෂාවෙන් කටයුතු කරන්නට ඇති. ඒ කොයි හැටි වෙතත්, මා මේ අතුරු යෝජනාව ඉදිරිපත් කරන්නේ මේවා විකක් බැරෑරුම් ප්‍රශ්න නිසායි. මේවා ක්‍රියාවට පරිවර්තනය කිරීමේදී අප බොහෝ දුරට කරුණු සොයා බලන්නට ඕනෑ. සාමාන්‍ය ජාත්‍යානුරාගයෙන්ම පමණක් හෝ අපේ ප්‍රදේශවල වැදගත්කම අනුව පමණක් හෝ මේ ප්‍රශ්න දෙස බැලිය යුතු නෑ. මෙවැනි අදහස් ක්‍රියාවට පරිවර්තනය කිරීමෙන් අපේ රට සංවර්ධනය කර ගන්නට පුළුවන් වෙයිද, අපේ ආර්ථික ප්‍රශ්න හා ජනතාවගේ වෙනත් ප්‍රශ්න මෙයින් විසඳා ගන්නට පුළුවන් වෙයිද යන කරුණු ඉතා ඕනෑකමින් සලකා බැලිය යුතු බව ප්‍රකාශ කරමින් මා මගේ අතුරු යෝජනාව ඉදිරිපත් කරනවා.

**මෛත්‍රීපාල හේරත් මයා.** (පොල්ගහවෙල)

*(திரு. மைத்திரிபால ஹேரத்—பொல்காவலை)*

(Mr. Maithripala Herath—Polgahawela)

මා ඒ අතුරු යෝජනාව ස්ථිර කරනවා.

"තවද, මෙම යෝජනාව ගැන පරීක්‍ෂා කර වාර්තා කිරීම සඳහා මන්ත්‍රී මණ්ඩලයේ විශේෂ කාරක සභාවක් පත් කළ යුතුය."—

යන වචන එහි අගට එකතු කළ යුතුය, යන ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.

*"அத்துடன் இப்பிரேரணை பற்றி விசாரணை செய்வதற்கும் அறிக்கை சமர்ப்பிப்பதற்குமெனச் சபையில் தெரிகுழு ஒன்று நியமிக்கப்பட வேண்டும்."—எனும் சொற்களைச் சேர்க்க வேண்டுமெனும் வினு எடுத்தியம்பப்பட்டது.*

*Question, that the words—*

"and that a Select Committee of the House be appointed to inquire into and report upon this Motion."—

*be there added, proposed.*

අ. භා. 5.30

**මුත්තෙට්ටුවේගම මයා.**

*(திரு. முத்தெட்டுவேகம)*

(Mr. Muttetuwegama)

මිහින්තලේ මන්ත්‍රීතුමාගේ මෙම යෝජනාව මේ ගරු සභාවේ න්‍යාය පත්‍රයෙහි කීප විටක්ම තිබෙනු මා දැක තිබෙනවා. මා හිතන හැටියට, දැන් අප ජීවත් වන්නේ මේ විධියේ යෝජනාවක් ඉදිරිපත් කරන්නට හෝ සාකච්ඡා කරන්නට හෝ සුදුසු කාලයක නොවෙයි. මේ රටේ මහජනතාවට විශාල පොරොන්දු දුන් නව රජය බලයට පත් වී තවම ගත වී තිබෙන්නේ මාස 5 යි, නැත්නම් 6යි. දැනට තිබෙන තත්ත්වය අනුව මේ රටේ ජනතාව අද බර පතල ප්‍රශ්න රාශියකට මුහුණ පා සිටිනවා. අප අද ජීවත් වන්නේ ආර්ථික අර්බුද

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දිවයිනේ අගනුවර

යක් මැද. තරුණ පරම්පරාවත් ගැමි ජනතාවත් කොළඹ හෝ වේවා, අනුරාධපුරයේ හෝ වේවා, ගලිගමුවේ මන්ත්‍රීතුමා කීවාක් මෙන් නුවර හෝ වේවා සෑම නගරයකම ජනතාවත් අද විශාල ප්‍රශ්නවලට මුහුණ පා සිටිනවා. එම නිසා, ඒ ප්‍රශ්න සියල්ලම විසඳුණාට පසු, මේ රටේ නියම සංවර්ධන සැලැස්මක් ඇති වුණාට පසු, මේ ගරු සභාවට පැවරී ඇති හදිසි වැඩ කටයුතු තරමක්වත් අඩු වුණාට පසු, අපට මේ විධියේ යෝජනා සාකච්ඡා කරන්නට කාල වේලා ලැබෙයි. මිහින්තලේ මන්ත්‍රීතුමා මේ යෝජනාව ඉදිරිපත් කළත් මෙය වහාම ක්‍රියාත්මක කිරීමේ ඉල්ලීමක් එතුමාගෙන් කෙරී නෑ. මහජනතාවගේ අදහස් එතුමාගේ අදහස් හා එකඟ කර වීමත් ඒ අදහස් වටා මහජනතාව අවදි කරවීමත් සඳහා එතුමා මේ යෝජනාව ඉදිරිපත් කරන්නට ඇතැයි මා විශ්වාස කරනවා.

අපේ ප්‍රධාන නගරය පිළිබඳවමත් අපට නොයෙක් විධියේ ප්‍රශ්නවලට මුහුණ පාන්නට සිදු වී තිබෙන බව තමුන්නාන්සේ දන්නවා. මැතිවරණ කොට්ඨාශ 145 කින් මේ ගරු සභාවට මන්ත්‍රීවරුන් පැමිණ සිටිනවා. මැද කොළඹ මැතිවරණ කොට්ඨාශයෙන් ගරු මන්ත්‍රීවරුන් තුන් දෙනෙකුත් කොළඹ නගරයේ ඉතිරි මැතිවරණ කොට්ඨාශවලින් මන්ත්‍රීවරුන් කීප දෙනෙකුත් හැරුණාම ඉතිරි ගරු මන්ත්‍රීවරුන් අතරින් අප කාට කාටත් තම තමන් නියෝජනය කරන මැතිවරණ කොට්ඨාශයේ තැනක් හෝ එම කොට්ඨාශයට ආසන්නව පිහිටි නගරය හෝ ලංකාවේ ප්‍රධාන නගරය හැටියට පිළිගත යුතු යයි යෝජනා කරන්නට පුළුවනි. ඒ සඳහා හේතු සාධකත් ඕනෑ තරම් ඉදිරිපත් කරන්නට පුළුවන්කම තිබෙනවා. රත්නපුර දිස්ත්‍රික්කය තුළ පිහිටි නොයෙකුත් මැතිවරණ කොට්ඨාශවලින් පැමිණ සිටින ගරු මන්ත්‍රීවරුන්ට රත්නපුරය ලංකාවේ ප්‍රධාන නගරය වශයෙන් තෝරාගත යුතු යයි යෝජනා කරන්නටත් ඊට අවශ්‍ය තරම් සාධක සොයා ගන්නටත්, ඉදිරිපත් කරන්නටත් පුළුවන්කම තිබෙනවා. මීට කලින් ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය දහනායක) නැගිටිනවා මා දුටුවා. එතුමාත් මේ විවාදයට සහභාගි වන්නට ඕනෑකමින් සිටිනවා විය හැකියි. එතුමා නියෝජනය කරන ගාල්ල ලංකාවේ ප්‍රධාන නගරය විය යුතුයයි යෝජනා කරන්නටත් ඊට අවශ්‍ය සාධක පෙන්වන්නටත් එතුමාට පුළුවන්කම තිබෙනවා. ඒ වාගේම නොයෙකුත් ගරු මන්ත්‍රීවරුන්ට තම තමන් නියෝජනය කරන ප්‍රදේශවල ඇති නගර ගැන කරුණු දක්වන්නට පුළුවන්කම තිබෙනවා. ඒ නිසා මෙවැනි ප්‍රශ්නයක් ගැන සිත යොමු කරන විට අප විසින් කල්පනාවට ගත යුතු, මේ ප්‍රශ්නයට අදාළ තවත් ප්‍රශ්න රාශියක් තිබෙන බවත් සලකන්නට ඕනෑ.

අද අපට මුහුණ පාන්නට සිද්ධ වෙලා තිබෙන වැදගත් ප්‍රශ්න අතර මුල් තැනක් ගන්නා ප්‍රශ්නයක් නම් අපේ පරිපාලනය විමධ්‍යගත කිරීමේ ප්‍රශ්නයයි. අපේ මින්නේරියේ ගරු මන්ත්‍රීතුමා (රත්න දේශප්‍රිය සේනානායක මයා.) ඒ අදහස පෙරදැරි කරගෙන තමයි, එතුමාගේ කථාවේදී යම් යම් දේ කිව්වෙ. අද අපේ ගම්බද උදවියට තමන්ගේ ප්‍රශ්නයකට මුහුණ දීමට සිදු වන විට ඒ සම්බන්ධයෙන් විසඳුමක්, පිළිතුරක් ලබා ගැනීමට කොළඹටම එන්නට සිද්ධ වෙලා තිබෙන බව අපි දන්නවා. මා නියෝජනය කරන ඡන්ද කොට්ඨාශය හැතැප්ම 72ක් පමණ දිගයි.

**රත්න දේශප්‍රිය සේනානායක මයා.**
*(திரு. ரத்ன தேஷபிரிய சேனநாயக்க)*
(Mr. Ratna Deshapriya Senanayake)

මින්නේරිය ඡන්ද කොට්ඨාශය හැතැප්ම 84ක් දිගයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දිවයිනේ අගනුවර

**මුත්තෙට්ටුවේගම මයා.**
*(திரு. முத்தெட்டுவெகம)*
(Mr. Muttetuwegama)

මින්නේරිය ඡන්ද කොට්ඨාශය හැතැප්ම 84ක් දිගලු. ඒ නිසා ඔය ආසනයක නියම මධ්‍යස්ථානය කොතැනදැයි කාටවත් කිසිම තේරුමක් නැහැ. ඉතින් ඒ උදවියට තමන්ගේ ප්‍රශ්න සම්බන්ධයෙන් කොළඹටම එනනට සිදු වන නිසා ප්‍රධාන නගරය ඒ ප්‍රදේශයට ආසන්නව පිහිටුවීමේ අදහසට ඒ උදවියගේත් සහාය ලැබෙන්නට පුළුවනි. මා නියෝජනය කරන ප්‍රදේශයේ උදවියට තමන්ගේ ප්‍රශ්න සම්බන්ධයෙන් කොළඹට එන්නට සිදු වෙනවා. නැත්නම් රත්නපුරයට එන්නට සිදු වෙනවා. ඒ උදවියට රත්නපුරයට එන්නට වුණත් දවස් දෙක තුනක් ලගින්නට තැන් සොයා ගන්නට සිදු වෙනවා. ඉතින්, අද පවතින මේ පරිපාලන තත්ත්වය යටතේ අනුරාධපුරයට ප්‍රධාන නගරයක තිබිය යුතු ආයතන ගෙන ගියත් අපේ ප්‍රදේශවල උදවියට තව තවත් විශාල කරදරවලට මුහුණ පාන්නට සිදු වන බව මා අමුතුවෙන් කියන්නට වුවමනාවක් නැහැ.

**රෝයි රාජපක්ෂ මයා.**
*(திரு. ரோய் ராஜபக்ஷ)*
(Mr. Roy Rajapakse)

මාතර සිට අනුරාධපුරයට යන්න වුණාම ?

**මුත්තෙට්ටුවේගම මයා.**
*(திரு. முத்தெட்டுவெகம)*
(Mr. Muttetuwegama)

මාතර සිට අනුරාධපුරයට වුණත්, කොළඹ සිට අනුරාධපුරයට වුණත් ගමන් කිරීම නොවෙයි මෙතන තිබෙන ප්‍රශ්නය. ඇත්ත වශයෙන්ම මෙහි ප්‍රශ්න කිහිපයක් තිබෙනවා. දැනටත් අපේ රටේ පරිපාලන යන්ත්‍රය සම්පූර්ණයෙන්ම වෙනස් කිරීමේ වැඩ පිළිවෙළක් තිබෙනවා. අපේ ගරු මින්නේරියේ මන්ත්‍රීතුමා කිව්වා, මේ රටේ විදේශීය පාලනයක් ඇති වුණාට පස්සේ—ඉංගිරිසිකාරයින්ගේ පාලනයක් ඇති වුණාට පස්සේ—ලංකාවේ නොයෙකුත් අන්දමට ප්‍රදේශ බෙදීම් ඇති කළ බව. ඒ අනුව කෝරළේ, පත්තුව සහ ආරච්චි කොට්ඨාශ ආදිය මේ රටේ ඇති වුණා. මුලින් තිබුණු තත්ත්වය ඒ අය නොයෙක් අන්දමට වෙනස් කළා. ඒ කිසිවක් කෙළේ අපේ රටේ පිහිටීම අනුව නොවන බව අපි දන්නවා. ඒ ඒ කාලවල සිටි පාලකයන් උචිතයයි කල්පනා කළ අන්දමට ඒ ඒ කාලවල වෙනස් අන්දමට ප්‍රදේශ බෙදා වෙන් කර තිබෙනවා. අපේ රටේ පාලන යන්ත්‍රය වෙනස් කිරීම දැන් අත්‍යවශ්‍ය දෙයක් වෙලා තිබෙනවා. සෑහෙන සංවර්ධනයක් රටේ ඇති කර ඒ සංවර්ධනය මගින් අපට අවශ්‍ය දේවල් මොනවාදැයි අපට තෝරා බේරා ගන්නට පුළුවනි. අපේ ප්‍රධාන නගරය වෙන තැනකට ගෙන යනවාද, එසේ ගෙන යනවා නම් ඒ කොතැනකටද, කොතැනකට අපේ ප්‍රධාන නගරය ගෙන ගියොත් අපට වඩා ප්‍රයෝජනවත් වන්නේද යනාදි වශයෙන් අපට එනකොට කල්පනා කරන්නට පුළුවනි. ඒ නිසා මම මේ යෝජනාවට මගේ විරුද්ධත්වය ප්‍රකාශ කරමින් මගේ වචන ස්වල්පය මෙයින් සමාප්ත කරනවා.

අ. භා. 5.38

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ යෝජනාවේ වැදගත්කමක් තිබෙන බව මම පළමුවෙන්ම සඳහන් කරන්නට කැමතියි. ඒ කියන්නේ, අපේ රටේ පාලන මධ්‍යස්ථානය අප විසින් තෝරා ගනු ලැබීම ගැන සලකා බැලීම ඉතාමත් වැදගත් බවයි. මම නම් කවදාවත් කියන්නේ නැහැ අපේ ප්‍රධාන නගරය නිකවැරටියට ගෙන යා යුතුය කියා. මොකක්වත් විශේෂයෙන් වුවමනායයි මම කියන්නේ නැහැ. මගේ පිඟානට බත් බෙදා ගන්නට ඉස්සර වෙලා අනෙකුත් අයගේ පිඟන්වලට බත් බෙදාගෙන තිබෙනවාදැයි බැලීමටයි මා බලා පොරොත්තු වන්නේ.

**ටෙනිසන් එදිරිසූරිය මයා.** (තිස්සමහරාම)
*(திரு. டெனிசன் எதிரிசூரிய—திசமாருமை)*
(Mr. Tennyson Edirisuriya—Tissamaharama)

අනේ, මට පෑන දෙන්න. මගේ පෑන නැතිලු. මට පෑනක් නැහැ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)

මේ ගැන කරුණු කීපයක් සැලකිල්ලට භාජන කළ යුතුව තිබෙනවා. අද අපේ රටේ ආර්ථිකය සම්පූර්ණයෙන්ම අර්බුද තත්ත්වයකට පත් වී තිබෙන බව කලවාන ගරු මන්ත්‍රීතුමා (සරත් මුත්තෙට්ටුවේගම මයා.) ප්‍රකාශ කළා. ඇත්තවශයෙන්ම ඔය අර්බුද තත්ත්වයට අපේ රට පත් වන්නට හේතුවත් කොළඹ ප්‍රධාන නගරය වූ නිසාය යන්න ඔප්පු කරන්නට අපට කරුණු තිබෙනවා. හැම දෙයක්ම කොළඹින් කරන්නට ගිය නිසා තමයි අද මේ රටේ නොයෙකුත් ප්‍රශ්න ඇතිවී තිබෙන්නේ. එම නිසා එම ප්‍රශ්නවලින් මිදීමටත් මෙම ප්‍රශ්නය විසඳීමමත් ප්‍රයෝජන වනවාට සැකයක් නැති බවයි සඳහන් කළ යුත්තේ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
*(கௌரவ அங்கத்தவர் ஒருவர்)*
(An hon. Member)

හිස රදයට කොට්ටය මාරු කිරීමක්.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)

තම තමන්ගේ අදහස් තම තමන්ගේ සිත්වල තිබුණාට කමක් නැහැ. මගේ අදහස් තමයි මම ප්‍රකාශ කරන්නේ. මෙම යෝජනාවේ මෙසේ සඳහන් වෙනවා :

"………මෙම දිවයින පෙරදිග ධාන්‍යාගාරය යයි විරුදාවලී ලැබූ නමුත්………"

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ඔය ප්‍රශ්නය තමයි අද අපට බලපාන මූලික ප්‍රශ්නය වී තිබෙන්නේ. අද අපේ රටේ ආහාර ප්‍රශ්නය සාධාරණ විධියටත් සාර්ථක විධියටත් විසඳී නැති නිසායි අද අපි විශාල ආර්ථික අර්බුදයකට මුහුණ දී සිටින්නේ. එම නිසා අප සතු යුතුකම විය යුත්තේ මේ රට පෙරදිග ධාන්‍යාගාරය බවට පත් කර ගැනීමයි. අපට වුවමනා තරම් ආහාර ප්‍රමාණයක් අපේ රටේ වගා කර ගැනීමේ තත්ත්වයට අප යම් දිනෙක පත් වුණොත් මේ ප්‍රශ්න බොහෙ මයක් නිරාකරණය වේ විය කියා මා විශ්වාස කරනවා. ඒ අනුව කල් පනා කර බලන විට අපට වුවමනා කරන සහල් ප්‍රමාණය සාර්ථක අන්දමට ලබා ගැනීම සඳහා උපයෝගි කර ගත යුතු ඉඩම් රාශියක් පිහිටා තිබෙන්නේ උතුරු මැද පළාතේ බව පෙනෙනවා. උතුරු මැද පළාත දියුණුවෙන් හීන වන්නට ප්‍රධාන හේතුවක් වී තිබෙන්නේ එම පළාත එතරම් සැළකිය යුතු පළාතක් නොවේය යන හැඟීමෙන් කටයුතු කිරීමයි.

**රත්න දේශප්‍රිය සේනානායක මයා.**
*(திரு. ரத்ன தேஷபிரிய சேனநாயக்க))*
(Mr. Ratna Deshapriya Senanayake)

අධිරාජ්‍යවාදීන් තමයි එසේ සිතුවේ.

**එම්. තෙන්නකෝන් මයා.**
*(திரு. எம். தென்னகோன்)*
(Mr. M. Tennakoon)

ඒ අදහසමයි, අදත් අභ්‍යන්තරයෙහි දරාගෙන යන්නේ. වේදිකාවෙහිදී මොනවා කිව්වත් තමතමන්ගේ සිත්වලත් පුද්ගලික ජීවිතවලත් රජ කරන්නේ අධිරාජ්‍යවාදීන්ගේ හැඟීම් තමයි. එම නිසා අපට මෙවැනි අර්බුදකාරී තත්ත්වයකින් බේරෙන්නට බැරි බව මෙම අවස්ථාවෙහිදී මා සඳහන් කළයුතුයි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, ලංකාවේ භූමිය පිළිබඳව පරීක්ෂණයක් කළොත් ඉතාම සාරවත් භූමි ප්‍රමාණය පිහිටා තිබෙන්නේ උතුරු මැද පළාතේ බව තමුන්නාන්සේට පෙනී යනවා ඇති. ගොවිතැනට සුදුසු සාරවත් භූමි ප්‍රමාණයක් පිහිටා තිබෙන්නේ වියලි කලාපයේයි. විශේෂයෙන් වී ගොවිතැනට ඉතා යෝග්‍ය වැඩි භූමි ප්‍රමාණයක් පිහිටා තිබෙන්නේ උතුරු මැද පළාතේ බව අප කවුරුත් දන්නවා. එහෙත් ඒ ප්‍රදේශ දියුණුවෙන් තොරයි. ඒ හැම බිම් කොටසක්ම වී වගාව පිණිස යොදවනවා නම් අපේ පාලන මධ්‍යස්ථානය එම ප්‍රදේශය ළඟට ගෙන යන්නට ඕනෑමයි. අපේ රටේ වී ගොවිතැන සාර්ථක කර ගැනීමට නම් අපේ රටේ වාරිමාර්ග කටයුතු සාර්ථක ත්ත්වයකට පත් විය යුතුයි. වාරිමාර්ග කටයුතු සාර්ථක තත්ත්වයකට පත් වීමට නම් අපේ රටේ පාලන කටයුතු ගැන අනුරාධපුරය වැනි මධ්‍යස්ථානයක සිටගෙන සිතන්නට තරම් කරුණු සම්පාදනය වන්නට ඕනෑ.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[එම්. තෙන්නකෝන් මයා.]

අද කොළඹ නගරයේ කොපමණ තදබදයක් තිබෙනවාද යන්න ඔබතුමා පිළිගන්නවා ඇති. වගුරු බිම් සියල්ලක්ම ගොඩ කරගෙන යනවා. වගුරු බිම් අක්කරයක් ගොඩ කරන විට ඒ බිමේ වටිනාකම කොපමණදැයි තක්සේරු කිරීමත් ඒ තරම් ලෙහෙසි නැහැ. ඒ වගුරු බිම් ගොඩ කර ගොඩනැගිලි සාදන්නට මහන්සි ගන්නවා. නමුත් ගොඩනැගිලි සෑදීමෙනුත් සතුටුදායක තත්ත්වයක් ඇති වන්නේ නැහැ. පසුගිය නගර සභා මැතිවරණයේදී කුප්පියාවත්ත නැගෙනහිර කොටසේ එක් නිවාස ක්‍රමයකට යන්නට මට අවස්ථාවක් ලැබුණා. ඒ නිවාස ක්‍රමයට අයත් නිවසකට තිබෙන්නේ එක නිදන කාමරයයි. ඉඳගන්නට තවත් පුංචි කාමරයක් තිබුණා. යන්තමින් ඉස්තෝප්පුවකුත් තිබුණා. වැසිකිළියකුත් කුස්සියකුත් දෙකම තිබුණේ එකටයි. මේ නිවසක පදිංචිකරුවකු වැසිකිළිය පාවිච්චි කරන විට කුස්සියේ ඉඳගෙන බත් ටිකක් කන්න බැරියයි මට එක් පදිංචිකරුවකු කිව්වා. ඔන්න තිබෙන සැලැස්ම. ගෙයක කුලිය මසකට රුපියල් 35 යි. ඒ ගෙදරක ලෙඩකු සිටිනවා නම් ඒ ලෙඩාටත් අනෙකුත් සියළු දෙනාටත් ඉන්නට සිද්ධ වන්නේ එකම කාමරයකයි.

කොළඹ නගරයේ නිවාස ප්‍රශ්නය අද කොයි තරම් උග්‍ර වී තිබෙනවාද? නමුත් කොයි තරම් උග්‍ර වුවත් කවුරුවත් ලෑස්ති නැහැ ටිකක් නගරයෙන් එපිටට යන්න. සියලු දෙනාටම වුවමනා කරන්නේ කොළඹ නගරය තුළම හිර වී සිටීමටයි. තත්ත්වය ඒකයි. එමනිසා මෙවැනි ප්‍රශ්න ආත්මාර්ථකාමීව සලකා විසඳිය හැකි ප්‍රශ්න නොවෙයි. මා මුලින් සඳහන් කළාක් මෙන් අධිරාජ්‍යවාදී හැඟීම් තමන්ගේ සිත්වල අභ්‍යන්තරයේ තබාගෙන මේ ප්‍රශ්න ගැන සාකච්ඡා කරන්නට බැහැ. ජාතියේ බහු ජනතාවගේ සැප පිණිස සුව පිණිස ජාතියේ ස්වාධීනභාවය ආරක්ෂා කිරීම පිණිස ජාතියේ සංවර්ධනය ඇති කිරීම පිණිස යෙදවිය හැකි සෑම මාර්ගයක්ම යෙදවීමට උපකාරී වන්නේ කුමක්දැයි කල්පනා කර ඒ අනුව මෙවැනි ප්‍රශ්න පිළිබඳව නිගමනයකට බැසිය යුතු බව තමුන්නාන්සේ පිළිගන්නවා ඇති.

දිවයිනේ අගනුවර

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, න්‍යාය පත්‍රයේ මුල් යෝජනාව පිළිබඳ සාකච්ඡාවේදී වැදගත් කාරණයක් ඉදිරිපත් වුණා. අපේ ගාල්ලේ ගරු මන්ත්‍රීතුමා (ආචාර්ය ඩබ්ලිව්. දහනායක) ඉදිරිපත් කළ පෝය නිවාඩුව පිළිබඳ ප්‍රශ්නය ජාතික ප්‍රශ්නයක්යයි සියලු දෙනාම පිළිගත්තා. ඒක ජාතික ප්‍රශ්නයක්ය, එමනිසා පක්ෂ භේදයෙන් තොරව ඒ ගැන සාකච්ඡා කිරීමට අවස්ථාවක් සලසා ගත යුතුයයි තීරණය කළා. ඒ යෝජනාවට ප්‍රවාහණ ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමා විසින් වැදගත් අතුරු යෝජනාවක් ඉදිරිපත් කළා. ක්‍රම සම්පාදන හා රැකීරක්ෂා ඇමතිතුමාගේ පාර්ලිමේන්තු ලේකම්තුමා ඒ අතුරු යෝජනාව ස්ථිර කළා. මොකක්ද ඒ අතුරු යෝජනාවෙන් කිව්වෙ? මේක ජාතික ප්‍රශ්නයක්ය, මේක මුළු ජාතියටම බලපාන ප්‍රශ්නයක්ය, එම නිසා මතභේදවලින් තොරව මේ ප්‍රශ්නය සාකච්ඡා කර විසඳුමකට පැමිණිය යුතුය යන්නයි කිව්වෙ. ඒ අදහස්ම තමයි වෙන්නප්පුවේ ගරු මන්ත්‍රීතුමාත් (පොන්සේකා මයා.) ප්‍රකාශ කළේ. මේක ආගමික ප්‍රශ්නයක් හැටියට සලකන්නට බැරිය, එක් එක් ආගම් අනුව විසඳිය හැකි ප්‍රශ්නයක් නොවෙයි මේ ප්‍රශ්නය, මේක වැදගත් ප්‍රශ්නයක්, එමනිසා පක්ෂ භේදවලින් තොරව ආගම් භේදවලින් තොරව මුළු ජාතියටම බලපාන මේ ප්‍රශ්නය ගැන තීරණයකට එළඹිය යුතුය යන අදහසයි එතුමා ප්‍රකාශ කළේ.

එවැනිම ප්‍රශ්නයක් තමයි මේ ප්‍රශ්නයත්. මේ ප්‍රශ්නයත් සුළුවෙන් සාකච්ඡාවක් කර විසඳිය හැකි ප්‍රශ්නයක් නොවෙයි; සුළු වේලාවක් ඇතුළත සාකච්ඡාවක් කර තීරණයකට එළඹිය හැකි ප්‍රශ්නයක් නොවෙයි. තවත් නොයෙකුත් අදහස් මතු වන්නට පුළුවනි. මිහින්තලේ ගරු මන්ත්‍රීතුමාගේ මේ යෝජනාවට මගේ නම් එකඟත්වය තිබෙනවා. මම කැමතියි මේ යෝජනාවට. තවත් ගරු මන්ත්‍රීතුමකු මහනුවර අගනුවර විය යුතුයයි යෝජනා කළා. තවත් අය වෙනත් ස්ථාන අගනුවර විය යුතුයයි යෝජනා කරන්නට පුළුවනි. කොළඹ ප්‍රධාන තැන වූයේ පෘතුගීසීන්ගේ පැමිණීමෙන් පසුව පමණයි. එම නිසා කොළඹ වෙළඳ නගරයක් හැටියට තබාගෙන අපේ පාලන කටයුතු වෙන තැනකට

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

ගෙන ගියාට වරදක් නැහැ. අනික පාලන කටයුතු එක තැනකට ගෙන ගොස් මේ රට පාලනය කරන්නට ලැහැස්ති වුණොත් අපේ ක්‍රම සම්පාදක උප ඇමතිතුමා කී විධි යට එයත් සාර්ථක වන්නේ නැහැ. අද හැම දෙයක්ම පාලනය වන්නේ කොළඹ සිටින අධ්‍යක්ෂවරයකුගේ තීන්දුව පිටයි. නිකවැරටිය ගමට බෝක්කුවක් ඕනෑද කියා තීන්දු කරන්නේ කොළඹ කන්තෝරුවේ සිටින අධ්‍යක්ෂතුමා. හැබැයි ඒ තීන්දුව දෙන්නට කලින් ලියුම් ගනුදෙනු වලට වැය කරන කාලය වැය වන ශ්‍රමය ආදී සියල්ලක්ම එකතු කළොත් බෝක්කුව වටින්නේ රුපියල් 1,000 නම් රුපියල් 3,000 ක කාලයයි ශ්‍රමයයි අනිකුත් දේවලුයි වැය වෙනවා ඒ තීන්දුව ගන්නට. අරගන්නෙත් වැරදි තීන්දුවක්. මොකද, අපේ පාලනය මධ්‍යගත වී තිබෙනවා වැඩියි. අධ්‍යක්ෂවරයෙක් මුළු රටම පාලනය කරන අධ්‍යක්ෂ ජනරාල් කියා නම වෙනස් කරනවාට කැමතියි. මා හිතනවා මුළු ලෝකයම පාලනය කරන්නට පුළුවන් බව හැඟවෙන නාමපුවරු සමහර නිලධාරීන්ට දී තිබෙනවා කියා. අද අපේ රටේ සමහර නිලධාරීන්ට දී තිබෙන නාම පුවරු දෙස බැලුවොත් ඔවුන්ට මුළු ලෝක යම පාලනය කරන්නට පුළුවන් බව පෙනෙනවා. එහෙත් කෙරෙන වැඩක් නම් නැහැ. අපේ පාරවල් ටික හදා ගන්නට, ඇළ වේලි ටික හදා ගන්නට, ඉස්කෝල ටික හදා ගන්නට පුළුවන්කමක් නැහැ.

අද සමහර ඉස්කෝල ගුරුවරුන් නැතිව වසා තිබෙනවා. මගේ කොට්ඨාශයේ ඉස්කෝල වහලා ගුරුවරුන් නැතුව. එහෙත් නොයෙක් නොයෙක් විශාල නම් හදා තිබෙනවා. ඒ නිසා අපි මේ රටේ දුක් විඳින මිනිසුන් දුකින් මුදවා ගැනීමේ ප්‍රශ්නය ගැන අවංකව කල්පනා කරනවා නම් මේ සියල්ලක්ම එන්නට ඕනෑ මුලින්ම බව කියන්නට ඕනෑ. ඒ කියන් නේ ආණ්ඩු ක්‍රම ව්‍යවස්ථාව වෙනස් කරන අවස්ථාවේ මේ සෑම ප්‍රශ්නයක්ම නිරාකරණය කිරීම පිණිස අවශ්‍ය විධිවිධාන යොදන්නට ඕනෑ. එහෙත් මා හිතන විධියට නම් එය නිරාකරණය වන්නේ පැනනැඟුණු අර අදහස් අනුවමයි කියලයි. ජාතියේ



දියුණුව පිණිස ජාතියේ යහපත පිණිස දුක් විඳින මිනිසුන් දුකින් මුදවා ගැනීමේ හිත අවංකව තිබෙනවා නම් ඒ ක්‍රමය පක්ෂ භේදයෙන් තොර ක්‍රමයක් විය යුතුයි කියන එකයි මට මේ අවස්ථාවේදී ප්‍රකාශ කරන්නට තිබෙන්නේ. එය පක්ෂ භේද යෙන් යුතුව කරන ක්‍රමයක් වුවොත් කවදා වත් අපි බලාපොරොත්තු වන පරමාර්ථ යන් ඉටු නොවන බවයි මගේ අවංක හැඟීම. එම නිසා අපේ පාලනය විමධ්‍යගත වන්නට ඕනෑ. ගමේ කෙරෙන කටයුතු ගමේ අයගේ තීන්දු අනුවම කෙරෙන අවස්ථාවක් කවදා හෝ එන්නට ඕනෑ. ඒ අවස්ථාව එන තුරු කවදාවත් බැහැ දියුණු පිරිසක් හැටියට මේ රටේ ජීවත් වන්නට. එම නිසා මෙවැනි වැදගත් ප්‍රශ්න සාකච්ඡා වන විට ඉතා වැදගත් කරුණු යටින් මතු වෙනවා.

නිවාඩු ප්‍රශ්නය සාකච්ඡා කරන අවස්ථාවේ මට පෙනුණු ඉතා වැදගත් කරුණ තමයි පක්ෂ භේදයෙන් තොරව අපි කාරක සභාවක් පත් කරමු කී කාරණය. මා කීවා අනුකාරක සභාවක් කියා. නැහැ ඒකාබද්ධ කාරක සභාවක් පත් කරමුයි කිව්වා. මේ ගැන සම්පූර්ණ පරීක්ෂණයක් කර හැම පැත්තෙන්ම කරුණු එකතු කර අපේ දියුණුව පිණිස ආර්ථික දියුණුව පිණිස සාමාජික දියුණුවක් ඇති කර ගැනීම පිණිස පක්ෂභේදයෙන් තොරව කාරක සභාවක් පත් කරමුයි කිව්වා. මා කියන්නේ කාරක සභාවක් පත් කිරීමේ ප්‍රශ්නය ගැන නොවෙයි. මේ හැම එකක්ම විශේෂ පරීක්ෂණවලට භාජන කර පොදු මහජන අදහස් විමසා ඒ මහජන අදහස්වලට යම් යම් විරුද්ධ තාවයන් තිබෙනවා නම් ඒවාට ප්‍රති විරුද්ධ පිළිතුරු සපයා මහජනයාට ඒ ගැන සම්පූර්ණ අවබෝධයක් දී මේවා තීන්දු කළ යුතු බව තමුන්නාන්සේ පිළි ගන්නවා ඇති. මෙහිදී සඳහන් කිරීමට තිබෙන්නේ මෙන්න මේකයි. මේ ප්‍රශ්න සියල්ලක්ම නිරාකරණය කර ගැනීමට නම් අපි භේදවලින් තොරව යම් කිසි ක්‍රමයක් ඇති කර ගත යුතුයි. එසේ නැත්නම් අපි කවදා හෝ නතර වන්නේ හිටපු තැනමයි; නැත්නම් ඊටත් වඩා නරක තැනකයි.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

දිවයිනේ අගනුවර

[එම්. තෙන්නකෝන් මයා.]

ඇත්ත වශයෙන්ම ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සාමාජීක වශයෙන් අපි කල්පනා කර බැලුවොත් ස්වාධීන ආණ්ඩු ක්‍රමය අපට ලැබුණේ 1948 දීයි. පාර්ලිමේන්තු ක්‍රමය අපට ලැබුණේ 1947 දීයි. එදා සිට පක්ෂ ක්‍රමය ක්‍රම ක්‍රමයෙන් වැඩි වෙමින් ඇවිත් අද තත්ත්වය ඉතාමත් උග්‍ර වී තිබෙනවා. ඒ උග්‍ර වීම කොතරම්ද කිවහොත් අද මන්ත්‍රීවරුන්ට බේරෙන්න බැරි තත්ත්වයක් ඇති වී තිබෙනවා. විශේෂයෙන්ම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරුන්ට බේරෙන්න බැහැ. හැම ප්‍රශ්නයකදීම ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයෙකුගේ ලියුමක් අවශ්‍ය වනා බවයි රටේ ජනතාවගේ අවබෝධය. මන්ත්‍රීවරයෙකුගේ අත්සන නැතිව කිසිම දෙයක් කර ගත නොහැකි බවයි ජනතාවගේ හැඟීම. ඒ නිසා රටේ පොඩි පොඩි ප්‍රශ්න ගැන හිතා මතා වැඩක් කිරීමට අවස්ථාවක් අද මන්ත්‍රීවරුන්ට නැහැ. එක් එක් කෙනාගේ පෞද්ගලික ප්‍රශ්නවලට ඇඟිලි ගැසීමට මන්ත්‍රීවරයාට සිදු වී තිබෙනවා. මා හිතන හැටියට අද හැම කෙනෙක්ම සිතන්නේ ආණ්ඩු පක්ෂයේ මන්ත්‍රීවරයකුගේ අත්සන නොගත්තොත් කිසිම දෙයක් කරන්න බැරි බවයි. එයයි සාමාන්‍ය හැඟීම. මෙවැනි තත්ත්වයක් තිබෙන තෙක් මේ රටට අවංක සේවයක් ජනතාවගෙන් බලාපොරොත්තු වන්නේ කොහොමද?

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, සමහර ආණ්ඩුවේ සේවකයින් සිටිනවා, ඔවුන්ට තමන්ගේ අවංක අදහස් ප්‍රකාශ කිරීමට කිසිම අවස්ථාවක් නැහැ. එක්සත් ජාතික පක්ෂ ආණ්ඩුවක් තිබෙන සමයකදී යම්කිසි රජයේ සේවකයෙක් තමන්ගෙ අවංක හොඳ අදහසක් ප්‍රකාශ කළහොත් ඔහු ශ්‍රී ලංකා නිදහස් පක්ෂයට අයත් කෙනෙක්ය කියා හංවඩු ගැසෙනවා. ඒ වගේම ශ්‍රී ලංකා නිදහස් පක්ෂයේ ආණ්ඩුවක් තිබෙන සමයක දී ආණ්ඩුවේ සේවකයෙක් යම්කිසි අවංක අදහසක් ප්‍රකාශ කළහොත් ඔහු යූ. එන්. පී. කාරයෙක්ය කියා හංවඩු ගැසෙනවා. ඒ නිසා අවංක අදහස් ප්‍රකාශ කරන්න යන අහිංසක මිනිසුන්ට යන එන මං නැති වෙනවා. මේ නිසාම අද සමහර අය ආණ්ඩුවේ සේවයෙන් අයින් වී සිටිනවා. ඔවුන්ගේ අවංකකම නිසා ආණ්ඩුවේ සේවයෙන් අයින් වී සිටිනවා.

**එදිරිසූරිය මයා.**
(திரு. எதிரிசூரிய)
(Mr. Edirisuriya

තමුන්නාන්සේ ඔය අගනුවර ගැනද කතා කරන්නෙ?

**එම්. තෙන්නකෝන් මයා.**
(திரு. எம். தென்னகோன்)
(Mr. M. Tennakoon)

අගනුවර ගැන කියවෙන විට පාලන තන්ත්‍රය ගැන කියවෙනවා. ගරු තිස්සමහාරාම මන්ත්‍රීතුමා මේ යෝජනාව හොඳට කියෙව්වොත් එය අවබෝධ වේවි.

ගරු නියෝජ්‍ය කථානායකතුමනි, මේ යෝජනාවේ ඉතා වැදගත්කමක් තිබෙනවා. ඒ නිසා මේ අවස්ථාවේදී කළ හැක්කේ මේ යෝජනාව සම්බන්ධයෙන් අපගේ අවංක අදහස් ප්‍රකාශ කිරීම පමණයි. අපට මෙවැනි අවස්ථාවකදී අපේ අවංක අදහස් ඉදිරිපත් කරන්න පුළුවනි. ගරු මන්ත්‍රීවරුන්ට තමන්ගේ අදහස් අවංකව ඉදිරිපත් කරන්න පුළුවන් එක් අවස්ථාවක් තමයි මේ පෞද්ගලික මන්ත්‍රීවරුන්ගේ යෝජනා ඉදිරිපත් කරන අවස්ථාව. නමුත් සමහර විට ආණ්ඩු පක්ෂයට අයත් මන්ත්‍රීවරුන් නම් සමහර අදහස් ඉදිරිපත් කිරීමෙන් ආණ්ඩුවට අවාසියක් ඇති වේදෝයි සිතා තමන්ගේ අවංක අදහස් ඉදිරිපත් නොකර සිටින්නත් පුළුවනි. මන්ත්‍රීවරුන්ට තමන්ගේ සිතට එකඟව අදහස් ඉදිරිපත් කිරීමට අද මේ රටේ අවස්ථාවක් නැහැ. ඒ නිසා ඔය තත්ත්වය වෙනස් කරන්න ඕනෑ.

මේ පාලන මධ්‍යස්ථානයත් අපේ අර මූලික වෙනස් වීම අනුව සිදු විය යුතු බව මා විශ්වාස කරනවා. ආණ්ඩු ක්‍රමය වෙනස් වීම, පාලන මධ්‍යස්ථානය වෙනස් කිරීම, පරිපාලනයේ සංශෝධනයක් ඇති කිරීම, පරිපාලනය විධිමත් කිරීම, ඔය සියල්ලක්ම මේ ප්‍රශ්නයට අදාළ ඒවා හැටියට අපට සලකන්න පුළුවනි. ඒ නිසා මේ යෝජනාවට මගේ සම්පූර්ණ පක්ෂපාතී භාවය ප්‍රකාශ කරමින් මගේ කථාව අවසන් කරනවා.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

**රෝයි රාජපක්ෂ මයා.**
*(திரு. ரோய் ராஜபக்ஷ)*
(Mr. Roy Rajapakse)
There is no Quorum, Sir.

මන්ත්‍රී මණ්ඩලය ගණන් කොට ගණපූරණයක් නොමැති බව පෙනී ගියෙන්, බෙදුම් සීනු ශබ්ද කිරීමට නියෝග කරන ලදි.

*சபை கணிக்கப்பட்டு நிறைவெண் இன்மையால், பிரிவு மணி அடிக்கப் பணிக்கப்பட்டது.*

*House counted, and a Quorum not being present, the Division Bells were ordered to be rung.*

## කල්තැබීම
## *ஒத்திவைப்பு*
## ADJOURNMENT

පසුව ගණපූරණයක් නොමැති වූයෙන් නියෝජ්‍ය කථානායකතුමා විසින් 11 වන ස්ථාවර නියෝගය යටතේ, ප්‍රශ්නය නොවිමසා මන්ත්‍රී මණ්ඩලය කල් තබන ලදි.

කල් තැබීම

මන්ත්‍රී මණ්ඩලය ඊට අනුකූලව, අ. භා. 6 ට, 1970 ඔක්තෝබර් 11 වන ඉරිදා අ. භා. 2 වන තෙක් කල් ගියේ ය.

*பின்னர் நிறைவெண் சேராததனால் உப சபா நாயகர் அவர்கள், நிலையற் கட்டளை இல. 11 இன் படி வினுவின்றிச் சபையை ஒத்திவைத்தார்கள்.*

*இதன்படி, பி. ப. 6 மணிக்கு, 1970 ஒக்ரோபர் 11, ஞாயிற்றுக் கிழமை பி. ப. 2 வரை சபை ஒத்தி வைக்கப்பட்டது.*

*Later, a Quorum not being present,* MR. DEPUTY SPEAKER *adjourned the House, without Question put, under Standing Order No. 11.*

*Adjourned accordingly at 6 P.M. until 2 P.M. on Sunday, 11th October 1970.*

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

# ප්‍රශ්නවලට ලිඛිත පිළිතුරු
## வினக்களுக்கு எழுத்துமூல விடைகள்
## WRITTEN ANSWERS TO QUESTIONS

### අක්කරෙයිපත්තු ගම් සභාවේ සභාපති
### அக்கரைப்பற்று கி. ச. தலைவர்
### CHAIRMAN, V. C., AKKARAIPATTU

**73/70.**

**එම්. ඒ. අබ්දුල් මජීඩ් මයා.** (පොතුවිල්)
*(ஜனுப் எம். ஏ. அப்துல் மஜீது—பொத்துவில்)*
(Mr. M. A. Abdul Majeed—Pottuvil)

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) අක්කරෙයි පත්තු ගම්කාර්ය සභාවේ සේවකයන්ගේ 1970 අප්‍රියෙල් හා මැයි මාස සඳහා වූ වැටුප්, සභාපති විසින් කච්චේරියෙන් ගෙන ගිය නමුත් සේවකයන්ට නොගෙවූ බව එතුමා දන්නවාද? (ආ) මෙම සභාපති විසින් බොහෝ අක්‍රමිකතා කර ඇති හෙයින් ඔහු පහ කිරීමට එතුමා පියවර ගන්නවාද?

*பொது நிர்வாகம், உள்ளூராட்சி, உள்நாட்டு அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினு: (அ) அக்கரைப்பற்று கிராமச்சங்க ஊழியர் களின் 1970 ஏப்றல், மே மாதங்களுக்கான சம்பளம் தலைவரினுல் கச்சேரியிலிருந்து எடுத்துச் செல்லப்பட்ட தென்பதையும் அப் பணம் ஊழியர்களுக்கு வழங்கப்படவில்லை யென்பதையும் அவர் அறிவாரா? (ஆ) இத் தலைவர் அநேக ஒழுங்கீனங்களை செய்துள்ள மையால் அன்னுரை அகற்ற அவர் நடவடிக்கை எடுப்பாரா?*

asked the Minister of Public Administration, Local Government and Home Affairs: (*a*) Is he aware that the salary of the V. C. employees of the Akkaraipattu V. C. for April and May 1970 was removed from the kachcheri by the chairman and not paid to the employees? (*b*) Will he take action to remove this chairman in view of the many irregularities committed by him?

**ගරු ෆිලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක (රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමති)**
*(கௌரவ பீலிக்ஸ் ஆர். டி. பண்டாரநாயக்க—பொது நிர்வாகம், உள்ளூராட்சி, உள்நாட்டு அலுவல்கள் அமைச்சர்)*
(The Hon. Felix R. D. Bandaranaike—Minister of Public Administration, Local Government and Home Affaris)

ප්‍රශ්නය අදාල වන්නේ අක්කරෙයිපත්තුවේ ගම්සභා තුනෙන් කවරකටද යන්න නොදැනේ. කෙසේ වෙතත් එය අදාල වන්නේ අක්කරෙයිපත්තු දකුණ ගම්සභාවට යන අදහස පිට පිළිතුර පහත සඳහන් පරිදි දක්වයි:

(අ) නැත. 1970 අප්‍රේල් සහ මැයි සඳහා වැටුප් පිළිවෙලින් අංක 41 හා 42 දරන 70.7.9 දිනැති වවුචරයෙන් හා 70.7.16 දිනැති වවුචරයෙන් 1970 ජූලි මාසයේ දී ගෙවා ඇත. මෙය කච්චේරියෙන් ලබාගෙන ඇත්තේ 70.7.9 සහ 70.7.16 දිනවල වේ. (ආ) එසේය. දැනට මත් නානා අක්‍රමිකතාවයන් පිළිබඳව සභාපතිවරයාගේ නිදහසට අදාල කරුණු අසා යවා ඇත.

*இவ்வினவானது அக்கரைப்பற்றிலுள்ள மூன்று கிராமச் சபைகளில் எது சம்பந்தப் பட்டது என்பது தெரியவில்லை. ஆயினும் இவ்வினு, அக்கரைப்பற்றுத் தெற்குக் கிராமச் சபை சம்பந்தமானதாகத்தான் இருக்க வேண்டுமென ஊகிக்கப்பட்டு பின்வரும் விடைகள் தரப்படுகின்றன: (அ) இல்லை. 1970 ஏப்ரல், மே ஆகிய மாதங்களுக்கான சம்பளங்கள் 9.7.70 இன் 41 ஆம் இலக்க 16.7.70 இன் 42 ஆம் இலக்க உறுதிச் சீட்டுக் களின் வாயிலாக 1970 யூலை மாதத்தில் செலுத்தப்பட்டுள்ளன. இவை முறையே 9.7.70, 16.7.70 ஆகிய தேதிகளில் கச்சேரியி லிருந்து எடுக்கப்பட்டுள்ளன. (ஆ) ஆம். பல் வேறு ஒழுங்கீனங்களுக்கான தலைவரின் விளக்கம் ஏற்கனவே கோரப்பட்டுள்ளது.*

Which of the three village councils in Akkaraipattu the Question relates to is not known. However, presuming that the Question relates to Akkaraipattu South, the Answer is as follows: (*a*) No. Salaries for April and May 1970 have been paid in July 1970, per Vouchers No. 41 of 9.7.70 and No. 42 of 16.7.70 drawn from the

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

kachcheri on 9.7.70 and 16.7.70 respectively. (*b*) Yes. Already the chairman's explanation for various irregularities has been called for.

## ගාල්ල මහ නගර සභාව: මුදල් ගනුදෙනු

*காலி மாநகர சபை : பணக்கொடுக்கல் வாங்கல்*

### GALLE MUNICIPAL COUNCIL : FINANCIAL TRANSACTIONS

**84/70.**

**ආචාර්ය ඩබ්ලිව්. දහනායක (ගාල්ල)**
*(கலாநிதி டபிள்யு. தஹநாயக்க—காலி)*
(Dr. W. Dahanayake—Galle)

රාජ්‍ය පරිපාලන, පළාත් පාලන හා ස්වදේශ කටයුතු ඇමතිගෙන් ඇසූ ප්‍රශ්නය: (අ) 1970 ජූලි 31 දිනට, ගාල්ලේ මහ නගර සභාව විසින්, දේශීය ණය හා සංවර්ධන අරමුදලෙන් හා වෙනත් මාර්ග වලින් ලබාගෙන තිබුණු ණයවල හිඟ මුදල්, වාර මුදල් සඳහා අය කෙරෙන පොලීද ඇතුළුව කොපමණද? (ආ) 1970 ජූලි 31 දිනට, ගාල්ලේ මහ නගර සභාව විසින් රජයේ විදුලි දෙපාර්තමේන්තුවට හෝ විදුලි බල මණ්ඩලයට හෝ හිඟ හිටවා තිබුණ බිල්පත්වල මුළු මුදල කොපමණද? මෙම බිල්පත් කවර මාස සඳහාද? (ඉ) ගාල්ලේ මහ නගර සභාවට අය විය යුතු, එහෙත් අය කරගෙන නැති ආදායම කොපමණද? (ඊ) ගාල්ල මහ නගර සභාව විසින් සිය විදුලිබල ගිණුමෙන් හෝ වෙනත් කිසියම් විශෙෂ අරමුදලකින්, සිය පොදු ගිණුමට මාරුකර තිබෙන මුදල් ප්‍රමාණයන් කවරේද?

*பொது நிர்வாகம், உள்ளூராட்சி, உள்நாட்டு அலுவல்கள் அமைச்சரைக் கேட்ட வினா: (அ) காலி மாநகரசபை, உள்ளூர்க் கடன்களிலிருந்தும், அபிவிருத்தி நிதியிலிருந்தும் இதர வகைகளிலும் பெற்ற கடன்களில் 1970 ஜூலை மாதம் 31 ஆந் தேதியில் திருப்பிக் கொடுக்க வேண்டியிருந்த கட்டுப்பணம் மீதான வட்டித் தொகை உள்ளிட்ட பாக்கித் தொகை என்ன? (ஆ) காலி மாநகரசபை அரசாங்க மின்சாரப் பகுதிக்கு அல்லது மின் சாரக் கூட்டுத் தாபனத்திற்கு 1970 ஜூலை மாதம் 31 ஆந் தேதியில் கொடுக்க வேண்டியிருந்த பாக்கித் தொகை எவ்வளவு, எந்தெந்த மாதங்களுக்குரியது? (இ) காலி மாநகரசபைக்குச் சேரவேண்டியிருந்தும் சபை அறவிடத்தவறிய தொகை என்ன? (ஈ) காலி மாநகரசபை அதன் மின்சாரக் கணக்கிலிருந்து அல்லது வேறெந்த விசேஷ நிதியிலிருந்தும் அதன் பொதுக் கணக்கிற்கு மாறிய தொகை என்ன?*

asked the Minister of Public Administration, Local Government and Home Affairs: (*a*) How much are the arrears, inclusive of interest on instalments, of loans obtained by the Galle Municipal Council from the Local Loans and Development Fund and from any other sources as at 31st July 1970? (*b*) What is the total amount of outstanding bills due from the Galle Municipal Council to the Government Electrical Department or Electricity Corporation as at 31st July 1970, and in respect of what months are there bills outstanding? (*c*) What is the amount of revenue due to the Galle Municipal Council which the council has failed to recover? (*d*) What moneys has the Galle Municipal Council transferred from its electricity account or from any special fund to its general account?

**ගරු ෆිලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක**
*(கௌரவ பீலிக்ஸ் ஆர். டி. பண்டாரநாயக்க)*
(The Hon. Felix R. D. Bandaranaike)

(අ) දේශීය ණය සහ සංවර්ධන අරමුදලට ණය සහ පොලී වශයෙන් 1970 ජූලි 31 දිනට රුපියල් 2,461,094.65 ගෙවීමට ඇත. ගාලු නගර සභාව වෙනත් කවර මාර්ගයකින් හෝ ණය ලබාගෙන නැත. (ආ) ලංකා විදුලි මණ්ඩලයට 1970 ජූලි 31 දිනට රුපියල් 3,05,346 ක් ගෙවිය යුතුව ඇත. මෙම ගණන සෑදී ඇත්තේ 1970 අප්‍රේල්, මැයි, ජූනි සහ ජූලි යන මාස සම්බන්ධයෙන් වූ බිල්පත් නොගෙවීම නිසාය. (ඉ) 1969 දෙසැම්බර් මස 31 දිනට ගාලු මහ නගර සභාවට ආදායම් වශයෙන් අයවිය යුතු මුදල රුපියල් 17,94,412.75 කි. (ඊ) ගාලු මහ නගර සභාව විසින් විදුලි ගිණුමෙන් හෝ වෙනත් කවර විශේෂ ගිණුමකින් හෝ පොදු ගිණුමට මුදල් පවරා නොමැත.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org

[ගරු ෆීලික්ස් ආර්. ඩී. බණ්ඩාරනායක]

*(அ) 1970 யூலை 31 ஆந் தேதியன்று கடன், வட்டி ஆகியவற்றின் பெயரால் உள்ளூர்க் கடன், அபிவிருத்தி நிதிக்கு ரூபா 24,61,094.65 ஐக் கொண்ட தொகையொன்று செலுத்தப்படவேண்டியிருந்தது. வேறெந்த வழியிலிருந்தும் காலி மாநகர சபையினால் கடன்கள் எதுவும் பெறப்படவில்லை. (ஆ) 1970 யூலை 31 ஆந் தேதியன்று இலங்கை மின்சாரச் சபைக்கு 3,05,346 ரூபாவைக் கொண்ட மொத்தத் தொகையொன்று செலுத்தப்படவேண்டியிருந்தது. 1970 ஏப்பிறல், மே, யூன், யூலை ஆகிய மாதங்களுக்கான உண்டியல்களே இத்தொகைக்குரியனவாகும். (இ) 1969 திசெம்பர் 31 ஆந் தேதியன்று காலி மாநகர சபைக்கு வருமானங்களாக ரூபா 17,94,412.75 சதங்களைக் கொண்ட மொத்தத் தொகையொன்று வரவேண்டியிருந்தது. (ஈ) காலி மாநகர சபையானது மின்சாரக் கணக்கிலிருந்து அல்லது விசேட நிதி எதிலுமிருந்து பணங்கள் எதையும் அதன் பொதுக்கணக்குக்கு மாற்றவில்லை.*

(*a*) A sum of Rs. 2,461,094.65 was outstanding as loan and interest to the Local Loans and Development Fund as at 31st July 1970. No other loans had been obtained by the Galle Municipal Council from any other source. (*b*) A total amount of Rs. 305,346 was outstanding to the Ceylon Electricity Board as at 31st July 1970. Bills were outstanding for the months of April, May, June and July 1970 to make up this figure. (*c*) A total amount of Rs. 1,794,412.75 was due to the Galle Municipal Council as revenue as at 31st December 1969. (*d*) The Galle Municipal Council has not transferred any moneys from the electricity account or from any special fund to its general account.

Digitized by Noolaham Foundation.
noolaham.org | aavanaham.org